# ව්‍යාපාර අධ්‍යයනය

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

# 12 වන ශ්‍රේණිය

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

# ව්‍යාපාර අධ්‍යයනය

12 වන ශ්‍රේණිය - ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

© ජාතික අධ්‍යාපන ආයතනය

ප්‍රථම මුද්‍රණය 2009

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව

විද්‍යා හා තාක්ෂණ පීඨය

ජාතික අධ්‍යාපන ආයතනය

මුද්‍රණය:

මුද්‍රණාලය

ජාතික අධ්‍යාපන ආයතනය

# පෙරවදන

වර්ෂ 2007 දී 6 සහ 10 යන ශ්‍රේණිවලට හඳුන්වා දෙන ලද නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්නුම් ප්‍රවේශය ක්‍රමයෙන් වසරින් වසර 7, 8 හා 11 යන ශ්‍රේණිවල විෂය මාලාව සම්බන්ධයෙන් ද යොදා ගන්නා ලද අතර 2009 වසරේදී එය අ.පො.ස (උ/පෙළ) පන්තිවලට අදාළ විෂයමාලාව සම්බන්ධයෙන් ද ව්‍යාප්ත කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සම්පාදකවරුන් සමත් වී තිබේ. එමනිසා 12 හා 13 වන ශ්‍රේණිවල විවිධ විෂය හා අදාළ විෂය නිර්දේශ ද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ ද සිසුන් තුළ ප්‍රගුණ කළයුතු නිපුණතා ද නිපුණතා මට්ටම් ද පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ඉදිරිපත් කොට තිබේ. මෙම තොරතුරු තම විෂය හා අදාළ ඉගෙනුම් - ඉගැන්නුම් අවස්ථා සම්පාදනයේදී ගුරුවරුන්ට මහත්සේ ප්‍රයෝජනවත්වනු ඇත.

අ.පො.ස (උ.පෙළ) විෂය සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සකස් කිරීමේ දී විෂයමාලා සම්පාදකවරුන් විසින් කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව හා ජ්‍යෙෂ්ඨ ද්විතීයික (10, 11 ශ්‍රේණි) විෂයමාලාව සකසන විට අනුගමනය කොට ඇති ප්‍රවේශයට වඩා වෙනස් වූ ප්‍රවේශයක් අනුගමනය කොට ඇති බව සඳහන් කරනු කැමැත්තෙමි. 6, 7, 8, 9, 10 හා 11 යන ශ්‍රේණිවල දී විෂය කරුණු ඉගැන්වීමේ දී අනුගමනය කළයුතු ඉගෙනුම් හා ඉගැන්නුම් ප්‍රවේශ සම්බන්ධයෙන් ගුරුවරුන් අභිමත ආකෘතියකට යොමු කරන ලද මුත් අ.පො.ස (උ.පෙළ) විෂය නිර්දේශ හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සම්පාදනයේ දී ගුරුවරුන්ට තම අභිමතය පරිදි ක්‍රියාකිරීමටත් ප්‍රශස්ත නිදහසක් භුක්ති විඳීමටත් ඉඩ ප්‍රස්ථාව සලසා තිබේ. මෙම තලයේ දී ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරනුයේ ඒ ඒ විෂය ඒකකයට හෝ පාඩමට නියමිත නිපුණතා සහ නිපුණතා මට්ටම් වර්ධනය කිරීම පිණිස යෝජිත ඉගැන්නුම් ක්‍රමවලින් තමන් අභිමත ඉගැන්නුම් ක්‍රමයක් යොදා ගැනීම ය. තමන් යොදා ගන්නා ඉගැන්නුම් ප්‍රවේශය සතුටුදායක හා කාර්යක්ෂම ලෙස යොදා ගනිමින් අපේක්ෂිත නිපුණතා හා නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම ගුරුවරුන් විසින් නොපිරිහෙළා ඉටු කරනු ලැබිය යුතු ය. මෙම නිදහස ගුරුවරුන්ට ලබා දීමට තීරණය කරන ලද්දේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ඇති වැදගත්කම සහ එම විභාගය කෙරෙහි අධ්‍යාපන පද්ධතියේ සියලු ම අය දක්වන සංවේදී බව සැලකිල්ලට ගෙන බව සටහන් කරනු කැමැත්තෙමි.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන් හට මාහැඟි අත්පොතක් වේවායි ප්‍රාර්ථනය කරමි. අපේ දරුවන්ගේ නැණැස පාදන්නට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු ක්‍රමවේද සහ උපදෙස් අපගේ ගුරුවරුන් හට නිසි මගපෙන්වීමක් කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මහාචාර්ය ලාල් පෙරේරා

අධ්‍යක්ෂ ජනරාල්

**ජාතික අධ්‍යාපන ආයතනය**

# සංදේශනය

දන්නා දේ පවත්වා ගෙන යාමට හා පූර්වයෙන් තීරණය කරන ලද දේ ඉගෙනීමට කාලයක් තිස්සේ කටයුතු කිරීම නිසා, පවතින දේ නැවත ගොඩ නැඟීමට පවා අද අපට හැකියාව ඇත්තේ සුළු වශයෙනි. පාසල් මට්ටමේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ මහා පරිමාණ වෙනසක් ඇති කරමින් දොරට වඩින මෙම ද්විතියික අධ්‍යාපනය පිළිබඳ නව සහශ්‍රකයේ පළමු වන විෂයමාලා ප්‍රතිසංස්කරණය, එකී නොහැකියාව ජය ගැනීම සඳහා කටයුතු කරන අතර දන්නා දේ සංස්කරණයටත්, පූර්වයෙන් තීරණය නොකළ දේ ගවේෂණයටත්, හෙට පැවතිය හැකි දේ ගොඩනැඟීමටත් හැකියාව ඇති රටට වැඩදායී පුරවැසි පිරිසක් බිහි කිරීම අරමුණු කොට හඳුන්වා දී තිබේ.

ඔබ 6-11 ශ්‍රේණිවල මෙම විෂයය ම හෝ වෙනත් විෂයයක් හෝ උගන්වන ගුරු භවතකු නම් අ.පො.ස. (උ. පෙ.) සඳහාත් සැලකිය යුතු මට්ටමකින් අපේක්ෂා කරන නව ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම පිළිවෙත්වලට අනුගත වීම වඩාත් පහසු වනු ඇත.  ඒ ඒ නිපුණතා ඔස්සේ නිපුණතා මට්ටම් හඳුනා ගනිමින් ඒවා සාක්ෂාත්කරණයට සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම මේ ප්‍රතිසංස්කරණය යටතේ වැදගත් වෙයි.  ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ගුරුවරයා මේ තාක් ඉස්මතු කළ ක්‍රමපිළිවෙත් වර්තමානයට නොගැළපෙන බවත්, සිසුන් තනි තනි ව ඉගෙන ගන්නවාට වඩා අත්දැකීම් බෙදාහදා ගනිමින් සහයෝගයෙන් ඉගෙනීම අර්ථවත් බවත් නව භූමිකාවකට පිවිසෙන ගුරු භවතුන් තේරුම් ගත යුතු වෙයි.  ඒ අනුව ගුරුවරයා පසුපසින් සිටිමින්, ශිෂ්‍යයා ඉදිරියට ගෙන එන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම හැකි තාක් තෝරා ගනිමින් ඉගැන්වීම නව මඟකට ගෙන ඒමට කටයුතු කිරීම මෙහි දී අපේක්ෂා කෙරේ.

ද්විතියික අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ ජාතික අධ්‍යාපන ආයතනය විසින් 6-11 ශ්‍රේණිවල ගණිතය, විද්‍යාව, සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය, තාක්ෂණය හා වාණිජවිද්‍යාව යන විෂයයන්ට අදාළ ව සම්පාදනය කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පරිශීලනය කළ හොත් ශිෂ්‍ය කේන්ද්‍රීය, නිපුණතා පාදක හා ක්‍රියාකාරකම් පෙරටු කර ගත් ඉගෙනුම හා ඉගැන්වීම පිළිබඳ පැහැදිලි අදහසක්  ඔබට ලැබෙනු ඇත.  මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ මඟින් ඉදිරිපත් කරනු ලබන ක්‍රියාකාරකම් උත්සාහ ගන්නේ ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම එක ම වේදිකාවක් මතට ගෙන ඒමටයි.  එසේ ම 5E ආකෘතිය පදනම් කර ගනිමින් ද සහයෝගී ඉගෙනුම් (Co-operative Learning)  ක්‍රමපිළිවෙත් යොදා ගනිමින් ද මෙතෙක් සොයා ගෙන ඇති දේ නැවත ගොඩනඟමින් ඉන් ඔබ්බට ගොස් නව නිපැයුම් බිහි කරමින් උදාවන හෙට දිනයට කල් ඇති ව සූදානම් වීමටත් මේ ක්‍රියාකාරකම් ශිෂ්‍යයාට ඉඩ සලසා දෙනු ඇත.

නිර්මාණශීලී ගුරු පරපුරක් බිහි කිරීමේ අරමුණින් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ ක්‍රියාකාරකම් සන්තතියෙන් තෝරා ගත් ක්‍රියාකාරකම් කිහිපයක් පමණක් අ.පො.ස. (උ.පෙ.) ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයන්ට ඇතුළත් කර තිබේ. එහෙත් සපයා ඇති ආදර්ශ ක්‍රියාකාරකම් පරිශීලනයෙන් ද අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිසංස්කරණය පදනම් කර ගත් මූලධර්ම පිළිබඳ අවබෝධය වැඩිදියුණු කරගනිමින් ද විෂයයට හා පන්තියට ගැළපෙන පරිදි ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමේ විශාල නිදහසක් ඔබට ඇත.  මේ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයට ඇතුළත් ආදර්ශ ක්‍රියාකාරකම් සිව් ආකාර වූ තොරතුරු සමූහයක් ඔබට සපයයි.  සෑම ක්‍රියාකාරකමක් ආරම්භයේ ම ඔබ දකින්නේ එම ක්‍රියාකාරකම ඔස්සේ ශිෂ්‍යයා ගෙන යාමට බලාපොරොත්තු වන අවසාන ඉලක්කයයි.  නිපුණතාව යනුවෙන් නම් කර ඇති මෙය පුළුල් ය.  දීර්ඝ කාලීන ය.  ඊළඟට සඳහන් නිපුණතා මට්ටම මෙම නිපුණතාව වෙත ළඟා වීම සඳහා සිසුන් විසින් සාක්ෂාත් කර ගත යුතු විවිධ හැකියාවලින් එක් හැකියාවක් පමණක් ඉස්මතු කරයි.   මේ අනුව බලන කල ඒ ඒ නිපුණතා මට්ටම අදාළ නිපුණතාවට වඩා සුවිශේෂී ය.  කෙටි කාලීන ය.   ඊළඟට ඇත්තේ අදාළ ක්‍රියාකාරකම අවසානයේ ගුරු භවතා නිරීක්ෂණය කිරීමට බලාපොරොත්තු වන චර්යා කිහිපයකි.   ගුරු සිසු දෙපාර්ශ්වයට ම

බරක් නොවන සේ මේ චර්යා ගණන පහකට සීමා කිරීමට උත්සාහ දරා තිබේ. ඉගෙනුම් ඵල වශයෙන් හඳුන්වා ඇති මේ චර්යා නිපුණතා මට්ටමට වඩා සුවිශේෂ වන අතර විෂය කරුණු පදනම් කර ගත් හැකියා තුනකින් ද ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙන් මතු කර ගන්නා පොදු හැකියා දෙකකින් ද සමන්විත වෙයි. විෂය හැකියා තුන දුෂ්කරතා අනුපිළිවෙළින් පෙළ ගස්වා ඇති අතර අඩු තරමින් පළමු දෙකවත් සාක්ෂාත් කර ගැනීම සඳහා පන්තියේ සැම සිසුවකු ම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකමේ හදවත ලෙස සැලකෙන ගවේෂණය වෙත යොමුකර ගැනීමට ගුරු භවතා කටයුතු කළ යුතු ආකාරය ක්‍රියාකාරකමේ මීළඟ කොටසින් ඉදිරිපත් කර තිබේ. නියුක්තකරණය (Engagement) නම් වන එකී පියවරෙන් සැම ක්‍රියාකාරකමක් ම ආරම්භ වුව ද ක්‍රියාකාරකම් සැලසුම් කිරීම ආරම්භ වන්නේ 5E ආකෘතියේ දෙවන "E " අකුරට අදාළ ගවේෂණයෙන් බව ඔබ අමතක නොකළ යුතු ය.

ගවේෂණයට (Exploration) මග පෙන්වන උපදෙස් ආදර්ශ ක්‍රියාකාරකම්වල ඊළඟ කොටසයි. ගැටලුවේ විවිධ පැතිවලින් තම කණ්ඩායමට ලැබෙන පැත්ත පමණක් ගවේෂණයෙන් ඉගෙනුමට යොමු වන සිසුන්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම රාශියක් ඔස්සේ අදාළ අන්ත වෙත ගෙන යාම සඳහා ගුරුවරයා මේ උපදෙස් පෙළ ගස්වයි. ප්‍රශ්න ඔස්සේ සිදු කරනු ලබන විමර්ශනාත්මක අධ්‍යයන (Inquiry-based Learning) හෝ ක්‍රියාවෙන් ඉගෙනුමට මග පාදන අත්දැකීම් පාදක ඉගෙනුම (Experiential Learning) හෝ තෝරා ගැනීමට මෙහි දී ගුරු භවතාට නිදහස තිබේ. ඉහත කිනම් ආකාරයෙන් හෝ සිසුන් ලබන දැනුම පාදක කර ගනිමින් විෂයයට සුවිශේෂී වූ හෝ විෂයමාලාවේ විෂය කිහිපයක් හරහා දිවෙන හෝ ගැටලු විසඳීම සඳහා ඔවුන් යොමු කර ගැනීම අ.පො.ස. (උ.පෙ.) විෂය ගුරු භවතුන්ගේ වගකීම වෙයි.

මෙවන් ගැටලු පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ජීවිත යථාර්ථ පදනම් කර ගෙන සැලසුම් කිරීම අර්ථවත් ය. මනෝභේදයට තුඩු දී ඇති තත්ත්ව, උපකල්පිත තත්ත්ව, සමාන්තර අදහස් මෙන් ම ප්‍රාථමික මූලාශ්‍ර මේ සඳහා යොදා ගැනීමට ඔබට නිදහස තිබේ. කියැවීම, තොරතුරු එක්රැස් කිරීම හා කළමනාකරණය, ප්‍රත්‍යවේක්ෂණය, නිරීක්ෂණය, සාකච්ඡා කිරීම, කල්පිත ගොඩනැගීම හා පරීක්ෂා කිරීම, පුරෝකථන පරීක්ෂා කිරීම, ප්‍රශ්න හා පිළිතුරු සකස් කිරීම, සමරූපණය, ගැටලු විසඳීම හා සෞන්දර්යාත්මක කාර්ය ආදිය ගවේෂණය සඳහා යොදා ගත හැකි ක්‍රමශිල්ප කිහිපයකි. යාන්ත්‍රික ඉගෙනුමක් සේ සැලකෙන කටපාඩම් කිරීම වුව ද නොවැදගත් යැයි අමතක කර දැමීමට මෙහි දී ඉඩ තබා නැත.

සිසුහු කුඩා කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙති. ගුරු භවතා සතු දැනුම බැහැරින් ලබනු වෙනුවට ගුරු සහාය ලබා ගනිමින් දැනුම හා අවබෝධය ගොඩනගති. කණ්ඩායමේ සෙසු අය සමඟ අදහස් හුවමාරු කර ගනිමින් සොයා ගත් දැනුම වැඩිදියුණු කරති. මේ සියල්ල ප්‍රශස්ත මට්ටමින් සිදුවන්නේ සිසුන්ට අවශ්‍ය කියවීම් ද්‍රව්‍ය හා යෙදවුම් සපයා දීමට ගුරු භවතා ඉදිරිපත් වුවහොත් ය. එසේ ම ළමුන් ඉගෙනීමෙහි යෙදෙන මුළු කාලය පුරා ම කණ්ඩායම් අතර ගැවසෙමින් ඉගෙනුම සඳහා ළමුන්ට සහාය වුවහොත් ය. මෙබඳු ඉගෙනුම් ප්‍රවේශයක දී අනාවරණය මූලික වුව ද, එය නිදහස් අනාවරණයක් නොවන බවත් මගපෙන්වන අනාවරණයක් (guided discovery) බවත් ඔබ තේරුම් ගත යුතු වෙයි. ගුරු භවතාගෙන් මෙන් ම සම වයස් කණ්ඩායමෙන් ද පෝෂණය වෙමින් මෙසේ ඉගෙන ගන්නා සිසුන්ට ජීවිතය සඳහා වැදගත් අත්දැකීම් රැසක් ම ලැබෙන බව අමුතුවෙන් කිව යුතු නැත.

ගවේෂණයෙන් පසු ව එළඹෙන්නේ විවරණ (Explanation) අවස්ථාවයි . මෙහි දී කුඩා කණ්ඩායම් සූදානම් වන්නේ ස්වකීය අනාවරණ සාමූහිකවත්, නිර්මාණශීලීවත් සමස්ත කණ්ඩායමට ඉදිරිපත් කිරීමටයි. ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කණ්ඩායමේ සියලුදෙනා අතර සම සේ බෙදී තිබීමත් ඉදිරිපත් කිරීම සඳහා නව්‍ය ක්‍රම තෝරා ගැනීමට සිසුන්ට ඇති නිදහසත් මෙහි විශේෂත්වයයි. ඉන් අනතුරුව එළඹෙන විස්තාරණ (Elaboration) පියවරේ දී අපැහැදිලි

දේ පැහැදිලි කිරීමට, සාවද්‍ය දේ නිවැරදි කිරීමට, ගිලිහුණු දේ  සම්පූර්ණ කිරීමට සිසුන්ට ඉඩ ලැබේ.  එසේ ම දැනටමත් දන්නා දෙයින් බැහැරට යමින් අලුත් ම අදහස් ඉදිරිපත් කිරීමට වුව ද සිසුන්ට අවකාශ ඇත.  සෑම ක්‍රියාකාරකමක් ම අවසන් වන්නේ ගුරුවරයා ඉදිරිපත් කරන කෙටි දේශනයකිනි.  සම්ප්‍රේෂණ භූමිකාව වෙත යාමට මෙය ගුරු භවතාට ඉඩ සලසා දෙන අතර අවධානයට ලක් ව තිබෙන නිපුණතා මට්ටම යටතේ විෂය නිර්දේශය මඟින් හඳුන්වා දී තිබෙන සියලු ම වැදගත් කරුණු ආවරණය වන පරිදි මේ දේශනය පැවැත්වීමට ගුරු භවතා වග බලා ගත යුතු වෙයි.  සෑම ගුරු භවතකු ම අනිවාර්යයෙන් කළ යුතු මේ විස්තාරණයට මඟ පෙන්වීම සඳහා ඒ ඒ ක්‍රියාකාරකම් සැලැස්මේ අවසාන කොටස සැලසුම් කර තිබේ.

සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ අද දෘශ්‍යමාන වන ගැටලු ජය ගැනීම සඳහා ගනුදෙනුවකින් ආරම්භ වී දීර්ඝ ගවේෂණයක්, සිසු විවරණ හා විස්තාරණ පෙළක් හා සමාප්තික ගුරු සම්ප්‍රේෂණයකින් සැදුම් ලත් පරිණාමන ගුරු භූමිකාවකින් සමන්විත නව අධ්‍යාපන ක්‍රමයක් මෙසේ පද්ධතියට හඳුන්වා දීමට ජාතික අධ්‍යාපන ආයතනය කටයුතු කර ඇත.  ගුරු භවතා ප්‍රමුඛ ව කරන ඉගැන්වීමක් වෙනුවට ගුරු මඟ පෙන්වීම් යටතේ සිසුන් නිරත වන ඉගෙනුමක් ලෙස මෙය හැඳින්විය හැකි ය.  සිසුහු කියැවීම් ද්‍රව්‍ය පරිශීලනය කරමින් ද ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් ද ගවේෂණයේ යෙදෙති.  දිනපතා පාසල් පැමිණෙමින් ප්‍රීතියෙන් උගනිති.  ජීවිතයට හා වැඩ ලෝකයට අවශ්‍ය නිපුණතා රැසක් ම පාසල් අධ්‍යාපනය හරහා සාක්ෂාත් කර ගනිති.  චින්තන හැකියා, සමාජ හැකියා හා පුද්ගල හැකියා වඩවා ගනිමින් ජාතිය ගොඩ නැඟීම සඳහා සූදානම් වෙති.  මේ සියල්ලේ සාර්ථකත්වය සඳහා ආදර්ශ ප්‍රශ්නවලට පිළිතුරු ලියමින් මතකයේ රඳවා ගත් දැනුම විමසා බලන විභාග ක්‍රමයක් වෙනුවට ජීවිත යථාර්ථයන්ට මුහුණ දීමට ශිෂ්‍යයා සතු සූදානම සොයා බලන විභාග ක්‍රමයක අවශ්‍යතාව කැපී පෙනේ.

මෙම ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ ක්‍රියාකාරකම පුරා ම දිවෙන දෙයාකාර වූ ද අර්ථාන්විත වූ ද ඇගයීම් (Evaluation) ක්‍රියාවලියයි.  නියුක්තකරණය ද ගුරු අභිමතය පරිදි පෙර දැනුම සම්බන්ධ ඇගයීමක් සඳහා යොදා ගත හැකි ය.  එසේ ම ගවේෂණයත්, විවරණයත්, විස්තාරණයත් තුළින් ඇගයීම ශක්තිමත් කර ගැනීම ප්‍රවීණ ගුරු භවතකුගේ වගකීම වෙයි.  ලිඛිත පරීක්ෂණ අවම කරමින් පාසල් පාදක ඇගයීම් වැඩපිළිවෙළේ යථාර්ථවාදී ස්වභාවය රැකගැනීම සඳහාත්, වාර පරීක්ෂණ සඳහා අනිවාර්ය ප්‍රශ්න ඇතුළත් කරමින් පාසල් පාදක ඇගයීම් වැඩපිළිවෙළ වෙත පාසල් පිරිස් නැඹුරු කර ගැනීම සඳහාත්, ඉගෙනුමේ නියම ඵල සාක්ෂාත් කර ගත් බව කියැවෙන සුනත්‍ය ඇගයීම් (Authentic Evaluations) වැඩපිළිවෙළක් රටට හඳුන්වා දීම සඳහාත් කටයුතු රාශියක් දැනටමත් ජාතික මට්ටමෙන් ආරම්භ වී  තිබේ.  කළමනාකරණ පාර්ශ්වයේ මනා උපදේශන නායකත්වය හා තත්ත්ව සහතික කිරීමේ වගකීම යටතේ මේ නව වැඩපිළිවෙළ සාර්ථක කර ගනිමින් අලුත් ශ්‍රී ලංකාවක් සඳහා දොරටු විවෘත කිරීම රටේ යහපත පතන සියලුදෙනාගේ ම සමෝධානික වගකීම වෙයි.

දේශමාන්‍ය ආචාර්ය අයි එල් ගිනිගේ
සහකාර අධ්‍යක්ෂ ජනරාල් (විෂයමාලා සංවර්ධන)
විද්‍යා හා තාක්ෂණ පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය

**මෙහෙයවීම** : මහාචාර්ය ලාල් පෙරේරා, අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

**උපදේශකත්වය** : ආචාර්ය අයි.එල්. ගිනිගේ මිය, සහකාර අධ්‍යක්ෂ ජනරාල්,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සැලසුම් හා විෂය සම්බන්ධීකරණය** : එම්.ඒ. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා මිය,
ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂයමාලා කමිටුව :**

1. ජගත් බණ්ඩාරනායක මයා - ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක
2. මහාචාර්ය සුනිල් ගුණතුංග මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
3. ආචාර්ය අනිල් චන්ද්‍රකුමාර මයා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර පරිපාලන අධ්‍යයනාංශය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
4. එස්.එස්. නාඹටුන්න මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
5. ඩී. වසන්ත කුමාර මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, කැලණිය විශ්ව විද්‍යාලය.
6. කේ.එල්.ඩබ්. පෙරේරා මයා - අධ්‍යයනාංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මූල්‍ය අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
7. පී.ඩී.එච්.ඩී. ගුණතිලක මිය - අධ්‍යයනාංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ව්‍යාපාර පරිපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
8. ඩබ්.ජී. ප්‍රේමරත්න මයා - අධ්‍යයනාංශ ප්‍රධාන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය, කොළඹ විශ්ව විද්‍යාලය.
9. ටී.කේ. කරඳකැටිය මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා වයඹ විශ්ව විද්‍යාලය.
10. ඒ.බී. විජේසූරිය මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
11. ඒ. සිවනේසරාජා මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
12. එම්.ඒ. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා මිය - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
13. එස්. කේ. ප්‍රබාහරන් මයා - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
14. පී.එච්. කුසුමාවතී මිය - ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
15. එස්. ආර්. රත්නජීව මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.
16. ඩී.එල්.සී. ආර්. අජිත් කුමාර මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී,

ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය.

සංස්කාරක මණ්ඩලය:

1. ජගත් බණ්ඩාරනායක මයා- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ උපදේශක
2. ජී.ජී.මෙත්තානන්ද මයා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය.
3. ඒ.බී. විජේසූරිය මයා - ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.
4. එම්.ඒ. ඉන්ද්‍රා පත්මිණී පෙරේරා මිය- ව්‍යාපෘති නිලධාරී, ජාතික අධ්‍යාපන ආයතනය.
5. එස්. ආර්. රත්නජීව මයා - සහකාර ව්‍යාපෘති නිලධාරී, ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය.

ලේඛක මණ්ඩලය:

01. වයි.එච්.එම්.විමලසේන මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ) කලාප අධ්‍යාපන කාර්යාලය, මොණරාගල.
02. ජී. සුභාෂිණී පෙරේරා මිය - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (වාණිජ), කලාප අධ්‍යාපන කාර්යාලය, හලාවත.
03. පී.ජී. තමරා නන්දනී මිය - ගුරු උපදේශක, කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, මාතර.
04. ඩබ්.ඒ. දයාරත්න මයා - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, තංගල්ල.
05. ආර්. කොඩිප්පිලිආරච්චි මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය , තඹුත්තේගම.
06. කේ.ඩී. පුෂ්පා රංජනී මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, මතුගම.
07. එම්.ඩී. ශ්‍රියාලතා මෙවිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, හෝමාගම.

08. එම්.එච්.එම්. බුහාරි මයා - ගුරු උපදේශක, නාංගල්ල මුස්ලිම් මහා විද්‍යාලය, තුල්හිරිය.
09. සී.එල්. එම්.නවාස් මයා - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, ඉබ්බාගමුව.
10 එම්. පියසීලි මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, තෙල්දෙණිය.
11. එම්.එච්. කරුණා දමයන්ති මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, බිබිල..
12. ඩබ්.එම්.විජේරත්න මයා - ගුරු උපදේශක, ඇහැලියගොඩ මධ්‍ය මහා විද්‍යාලය, ඇහැලියගොඩ.
13. ඊ .එම්.ජේ.මැණිකේ මිය - ගුරු උපදේශක, කලාප අධ්‍යාපන කාර්යාලය, අනුරාධපුරය.
14. ජේ. විජයවික්‍රම මිය - නියෝජ්‍ය විදුහල්පති, ශුද්ධ වූ පවුලේ බාලිකා ම. ම වි. මාරවිල.
15. ජේ.පී.එන්.ටී.කේ. විජේසේන මිය - නියෝජ්‍ය විදුහල්පති, පිටබැද්දර නවෝදයා පාසල පිටබැද්දර.
16. ඒ.වී.බන්දුසිරි මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, මහරගම මධ්‍ය මහා විද්‍යාලය, මහරගම.
17. ඩී.එස්. රාජපක්ෂ මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, විද්‍යාකර මහා විද්‍යාලය, ඕපනායක.
18. එස්.ඒ.ඩී. සුභසිංහ මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, ධර්මරාජ මහා විද්‍යාලය, මහනුවර.
19. ඩබ්.එම්.එම්.පී. පද්මකාන්ති මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, වෙල්ලස්ස ජාතික පාසල, බිබිල.
20. එම්.එම්.මාලනී මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, ශාන්ත අන්තෝනි බාලිකා විද්‍යාලය, මහනුවර.
21. ඒ.පී.පියදේව මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, ඩී.එස්. සේනානායක මධ්‍ය මහා විද්‍යාලය, අම්පාර.
22. ටී.ඒ.එස්. කහව මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, විද්‍යාලෝක මහා විද්‍යාලය, ගාල්ල.
23. පී.ඒ. ආනන්ද මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, ශ්‍රී පරාක්‍රම මහා විද්‍යාලය, හෝමාගම.
24. ජේ.ඩබ්.නාලිකා දමයන්ති මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, හබරණ මහා විද්‍යාලය, හබරණ.
25. ජේ.එල්. සෝමරත්න මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, මහානාම මහා විද්‍යාලය,තිරප්පනේ.
26. ඩී.එම්.ඩබ්.කිරිවන්දෙනිය මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, ශාන්ත තෝමස් විද්‍යාලය, කෝට්ටේ.
27. පී.කේ. දීපාල් චන්දන පෙරේරා මයා - ශ්‍රී ලංකා ගුරු සේවය, දරණාගම ම.වි. සියඹලාපේ.
28. කේ.එම්.සී. ජයමාන්න මිය - ශ්‍රී ලංකා ගුරු සේවය, පර්ගසන් උසස් විද්‍යාලය, රත්නපුරය.

**පරිගණක වදන් සැකසුම :**

1. මංගලිකා විජේරත්න මිය - ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව.
2. චතුරි හිරෝෂිණී පාදුක්ක මිය - ජාතික අධ්‍යාපන ආයතනය.

**පටුන**

| | |
|---|---|
| | **පිටුව** |
| ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කිරීමට උපදෙස් | 01 |
| ඉගෙනුම් ඵල හා ආදර්ශ ක්‍රියාකාරකම් | 02 - 138 |
| පාසල පදනම් කරගත් තක්සේරුකරණය | 139 |
| හැඳින්වීම | 140- 142 |
| ඉගෙනුම් - ඉගැන්වීම් ඇගයීම් සැලසුම් | 143- 156 |
| මූලාශ්‍ර | 157 |

# ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

වර්ෂ 2009 සිට අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සඳහා ක්‍රියාත්මකවීමට නියමිත ව්‍යාපාර අධ්‍යයනය විෂය නිර්දේශය නිපුණතා පාදක ව සම්පාදනය කර ඇත. එම විෂය නිර්දේශයේ නිපුණතාව 01 සිට 11 දක්වා වන නිපුණතා ආවරණය වන ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය පිළියෙල වී ඇත. මෙම විෂය නිර්දේශය මගින් ව්‍යාපාර අධ්‍යයනයට අදාළ විෂය කරුණු පිළිබඳ දැනුම පමණක් නොව ඒ පිළිබඳ යහපත් ආකල්ප, කුසලතා හා පුරුදු ලබාදීම ද අපේක්ෂා කෙරේ.

එම අරමුණ පෙරදැරි කරගෙන සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයට ඔබගේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සඳහා ඔබට මගපෙන්වීමක් වශයෙන් මෙහි ආදර්ශ ක්‍රියාකාරකම් කිහිපයක් ඇතුළත් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ඇත්තේ පන්ති කාමරය තුළ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කළ යුතු අනුපිළිවෙලට ම ය. විෂය නිර්දේශයේ ඇති සෑම නිපුණතා මට්ටමක් සඳහා ම ඉගෙනුම් ඵල ඉදිරිපත් කර ඇත. එම ඉගෙනුම් ඵලවලට හා අදාළ නිපුණතා මට්ටමට සියලු ම සිසුන් ළඟා වන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් ඔබ විසින් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂිත ය. ඒ සඳහා ඔබට කරන මගපෙන්වීමක් ලෙස තෝරාගත් නිපුණතා මට්ටම් කිහිපයක් සඳහා **පිවිසීම** හා **ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්** ඉදිරිපත් කර ඇත. එම උපදෙස් එලෙස ම අනුගමනය කිරීම අනිවාර්ය හෝ අපේක්ෂා නොකෙරෙන අතර සිසුන්ගේ නිපුණතා සංවර්ධනය කෙරෙන ආකාරයේ වෙනත් සුදුසුයැයි හැඟෙන ශිෂ්‍ය කේන්ද්‍රීය වූ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට නිර්මාණශීලී ඔබට පූර්ණ නිදහස ඇත.

එසේ ම ක්‍රියාකාරකම අවසානයේ දී "විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් " මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙන් ඉදිරිපත් කර ඇත. එය ඔබ පන්ති කාමරයේ දී ක්‍රියාකාරකම් තුළින් අනාවරණය කර ගත යුතු හා සිසුන්ට සටහනක් ලෙස ලබාදිය යුතු විෂය කරුණුවලට මගපෙන්වීමක් වන්නේ ය.

ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා **පිවිසීම** හෝ **ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්** ඉදිරිපත් කර නොමැති නිපුණතා මට්ටම් මෙහි ඇතුළත් වේ. එම නිපුණතා මට්ටම් සඳහා ද සුදුසු ප්‍රවේශයක් හා යෝග්‍ය ඉගෙනුම සඳහා වූ උපදෙස් පත්‍රිකාවක් සකස් කර සිසුන් ක්‍රියාකාරීව ඉගෙනුමෙහි යොදවන ආකාරයේ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියක් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට ඔබට යෝජනා කෙරේ.

ව්‍යාපාර ඉතා ප්‍රායෝගික බැවින් ව්‍යාපාරවලට අදාළ ව්‍යවහාර ඉතා ඉක්මණින් වෙනස්කම්වලට භාජනය වන හෙයින් ඒ පිළිබඳ අවදානයෙන් සිට ගුරු භවතුන් වශයෙන් ඔබගේ දැනුම යාවත්කාලීන කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# ඉගෙනුම් ඵල හා ආදර්ශ ක්‍රියාකාරකම්

**නිපුණතාව 1.0** : ව්‍යාපාරවලට සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා ව්‍යාපාර පදනම විමසයි.

**නිපුණතා මට්ටම 1.1** : ව්‍යාපාර සංකල්පය විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- පිළිගත් අර්ථකථන අධ්‍යයනය තුළින් ව්‍යාපාර සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලට පදනම් වූ මූලික සංකල්ප විග්‍රහ කරයි.
- මිනිසා තම අවශ්‍යතා හා වුවමනා සපුරා ගනුයේ නිෂ්පාදිතවලින් බව පෙන්වා දෙයි.
- අවශ්‍යතා හා වුවමනා නිදසුන් ඉදිරිපත් කරමින් සසඳයි.
- ආර්ථිකයක පැවැත්මට ව්‍යාපාරවල දායකත්වය අගයයි.
- ව්‍යාපාර අරමුණු පැහැදිලි කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය, බෙදාහැරීම, අලෙවිය හා අනුබද්ධ සියලු කටයුතු සාමාන්‍යයෙන් ව්‍යාපාර ලෙස අර්ථ දැක්විය හැකි බව.
- ලාභ අරමුණින් තොරව ද මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම සඳහා පවත්වාගෙන යන ව්‍යාපාර ද පවතින බව.
- ඒ අනුව ව්‍යාපාර යනු මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කරලීම සඳහා ඇති ඕනෑම ආර්ථික කටයුත්තක් ලෙස හැඳින්විය හැකි බව.
- මිනිසා විසින් අනිවාර්යයෙන් ම සපුරාගත යුතු කායික හා මානසික තත්ත්ව මිනිස් අවශ්‍යතා බව.
- ආහාර, ඇඳුම්, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය, සන්නිවේදනය, ප්‍රවාහනය, ආරක්ෂාව ආදිය අවශ්‍යතා බව.
- අවශ්‍යතා සපුරා ගැනීමට කැමැත්තක් දක්වන විවිධ ආකාර වුවමනා බව.
- ආහාර අවශ්‍යතාව සපුරා ගන්නා විවිධ ආකාර වන බත්, පාන්, ඉඳිආප්ප, තේ වුවමනාවලට නිදසුන් බව.
- ජීවත්වීම සඳහා අත්‍යවශ්‍යයෙන් සපුරා ගත යුතුවීම, පොදුවීම, සීමිතවීම ආදිය අවශ්‍යතාවල ලක්ෂණ කිහිපයක් බව.
- අසීමිතවීම, විවිධවීම, ව්‍යාපාරිකයන්ට නිර්මාණය කළ හැකිවීම, පුද්ගල බද්ධවීම වුවමනාවල ලක්ෂණ කිහිපයක් බව.
- මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කරන වෙළෙඳපොළට ඉදිරිපත් කරන ඕනෑම දෙයක් නිෂ්පාදිත බව.
- නිෂ්පාදිත ප්‍රධාන වශයෙන් භාණ්ඩ හා සේවා ලෙස බෙදිය හැකි බව.
- මීට අමතරව අදහස්, ඉසව්, පුද්ගලයන්, සංවිධාන, ක්‍රියාකාරකම්, තොරතුරු, අත්දැකීම් හා ස්ථාන යනාදිය පුළුල්ව නිෂ්පාදිත ලෙස සැලකිය හැකි බව.

- යම් නිෂ්පාදිතයක් සඳහා පුද්ගලයකු තුළ ඇති කැමැත්ත, එය මිලදී ගැනීම සඳහා ඇති හැකියාව හෙවත් ක්‍රය ශක්තිය සහ මිලදී ගැනීමේ සූදානම නිසා ඉල්ලුම ඇති වන බව.
- මිනිස් වුවමනා තෘප්තිමත් කිරීමට සමත් භාණ්ඩ හා සේවා බිහිකිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය බව.
- ගැණුම්කරු හා විකුණුම්කරු හමුවන හෝ සම්බන්ධ වන ඕනෑම ආකාරයක් වෙළෙඳපොළක් බව.
- වෙළෙඳපොළ භෞතික වශයෙන් මෙන් ම විද්‍යුත් ක්‍රම හරහා ද නිර්මාණය වන බව.
- පාරිභෝගික වෙළෙඳපොළ, කාර්මික වෙළෙඳපොළ, සේවා වෙළෙඳපොළ ආදී ලෙස ද වෙළඳපොළ වර්ග කළ හැකි බව.
- වර්තමාන සමාජයේ මිනිසාගේ පැවැත්මට මෙන් ම සංවර්ධනයට ද ව්‍යාපාර අත්‍යාවශ්‍ය බව.

  ***නිදර්ශන :***
  - වෙනස් වන සහ සංකීර්ණ අවශ්‍යතා සපුරාලීම.
  - නවෝත්පාදනය
  - රැකියා උත්පාදනය
  - ජාතික ආර්ථික සංවර්ධනයට දායකත්වය
- ව්‍යාපාරවලට විවිධ අරමුණු තිබිය හැකි අතර ඒවායින් කිහිපයක් පහත දැක්වෙන බව.
  - වෙළෙඳපොළේ රැඳී සිටීම.
  - ලාභය උපරිම කිරීම.
  - විකුණුම් උපරිම කිරීම.
  - වෙළෙඳපොළ කොටස වැඩිකර ගැනීම.

**නිපුණතා මට්ටම 1.2** : ව්‍යාපාර විකාශනය විමසමින් ව්‍යාපාරවල ප්‍රවණතා පුරෝකථනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- ව්‍යාපාර විකාශනයේ වැදගත් අවස්ථා මතුකර දක්වයි
- මුදලේ විකාශනය නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- වෙළෙඳාමේ අතීත හා වර්තමාන තත්ත්ව සන්සන්දනය කරයි.
- ව්‍යාපාර, මූලික වශයෙන් කර්මාන්ත හා වාණිජ්‍යය ලෙස වර්ග කොට දක්වයි.
- ව්‍යාපාර ප්‍රවණතා පුරෝකථනය කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ඈත අතීතයේ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවති බව.
- ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය තුළ ඍජු නිෂ්පාදන ක්‍රමය ක්‍රියාත්මක වූ බව.
- ඍජු නිෂ්පාදනය තුළින් පුද්ගල විශේෂීකරණය ඇති වූ බව.
- පුද්ගල විශේෂීකරණයේ ප්‍රතිඵලයක් ලෙස අතිරික්ත නිෂ්පාදනය ඇති වූ බව.
- අතිරික්ත නිෂ්පාදනය නිසා භාණ්ඩ හුවමාරුව ඇති වූ බව.
- භාණ්ඩ හුවමාරුව සමඟ වෙළෙඳාම පැන නැඟුන බව.
- වෙළෙඳපොළ සඳහා නිෂ්පාදනය, වක්‍ර නිෂ්පාදනය බව.
- භාණ්ඩ හුවමාරුවේ දුර්වලතා මඟහරවා ගැනීමට හුවමාරු මාධ්‍ය ලෙස විවිධ ද්‍රව්‍ය භාවිත වූ බව.
- වඩා හොඳ හුවමාරු මාධ්‍යයක් ලෙස කාසි හා නෝට්ටු නිර්මාණය වූ බව.
- වර්තමානයේ කාසි හා නෝට්ටුවලට අමතර ව බැංකු මුදල්, විද්‍යුත් මුදල් භාවිත වන බව.
- කාර්මික විප්ලවය නිසා මහා පරිමාණ නිෂ්පාදනය ඇති වූ බව.
- මහා පරිමාණ නිෂ්පාදනය වෙළෙඳාමේ ප්‍රසාරණයට හේතු වූ බව.
- වෙළෙඳාමේ වර්ධනයට විවිධ ව්‍යාපාර සේවා උපකාරී වන බව.
  - බැංකු
  - ප්‍රවාහනය
  - රක්ෂණය
  - ගබඩාකරණය
  - සන්නිවේදනය
- වෙළෙඳාම හා ව්‍යාපාර සේවාවල එකතුව වාණිජ්‍යය බව.
- වාණිජ්‍ය හා කර්මාන්තවල එකතුව ව්‍යාපාර බව.
- ව්‍යාපාර මූලික වශයෙන් කර්මාන්ත හා වාණිජ්‍යය ලෙස බෙදී යන ආකාරය පහත පරිදි ගැලීම් සටහනකින් ඉදිරිපත් කළ හැකි බව.

- පහත දැක්වෙන්නේ ව්‍යාපාරවල නව ප්‍රවණතා කිහිපයක් බව.
    - ගෝලීයකරණය
    - විද්‍යුත් ව්‍යාපාර
    - විද්‍යුත් මුදල්
    - පරිසරය පිළිබඳ සැලකිලිමත්වීම
    - ව්‍යාපාර සමාජ වගකීම් පිළිබඳ සැලකිලිමත්වීම.
- නූතන තොරතුරු ආර්ථිකය සමඟ ව්‍යාපාර විද්‍යුත් ලෙස විකාශනය වී ඇති බව.



**නිපුණතා මට්ටම 1.3** : විවිධ නිර්ණායක මත ව්‍යාපාර වර්ග කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල**

- ව්‍යාපාර වර්ග කළ හැකි විවිධ නිර්ණායක ලැයිස්තුගත කරයි.
- පාසල පිහිටි ප්‍රදේශයේ ඇති ව්‍යාපාර විවිධ නිර්ණායක මත වර්ග කරයි.
- එකම ව්‍යාපාරය විවිධ නිර්ණායක ඔස්සේ වර්ග කිහිපයකට අයත් කළ හැකි බව පෙන්වා දෙයි.

**ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසුම**

- පහත දැක්වෙන ආකාරයේ භූමිකා රංගනයක් නිර්මාණය කර ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන් දෙදෙනෙකු ලවා පන්තියට ඉදිරිපත් කරවන්න.

**භූමිකා රංගනය**

**පෙරේරා** : හලෝ මිස්ටර් සිල්වා හුඟ කාලෙකින්, ඇයි මේ කෙට්ටු වෙලා.
**සිල්වා** : අනේ මට සීනි ලෙඩේ හැදිලා.
**පෙරේරා** : මටත් සීනි ලෙඩේනෙ, ඒ වුනාට කෙට්ටු නැහැනේ.
**සිල්වා** : කොහෙන්ද බෙහෙත් ගන්නේ.
**පෙරේරා** : මම ගන්නේ ආණ්ඩුවේ රෝහලෙන්
**සිල්වා** : අනේ මට නම් රෝහල් ගානේ යන්න වේලාවක් නැහැ. ඒ නිසා මම පෞද්ගලික වෛද්‍යවරයෙකුගෙන් බෙහෙත් ගන්නවා.
**පෙරේරා** : ඔයා බෙහෙත් ගන්නෙ කොහෙන් ද?
**සිල්වා** : මම ඔක්කොම බෙහෙත් ගන්නෙ ගුණපාලගෙ ෆාමසියෙන්
**පෙරේරා** : රෝහලෙන් නොදෙන බෙහෙත් මම නම් ගන්නෙ රජයේ ඔසුසලෙන්.
**සිල්වා** : අනේ අපේ ගෙවල් කිට්ටුව ඔසුසලක් නැහැනෙ.
**පෙරේරා** : ආහ් අපේ පාරෙ බස් එක එනවා මම යනවා.
**සිල්වා** : හා හොඳයි, හොඳයි. ගිහින් එන්න.

- භූමිකා රංගනය තුළින් මතුවන ව්‍යාපාර ආයතන පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- එම ආයතන අයත් ව්‍යාපාර වර්ග මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - රජයේ රෝහල හා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (ඔසුසල්) රාජ්‍ය අංශයේ ව්‍යාපාර බව.
  - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය හා ගුණපාලගේ ෆාමසිය පෞද්ගලික අංශයේ ව්‍යාපාර බව.
  - රජයේ රෝහල හා ඔසුසල මහා පරිමාණ ව්‍යාපාර බව.
  - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය හා ගුණපාලගේ ෆාමසිය, සුළු පරිමාණ ව්‍යාපාර බව.
  - රජයේ රෝහල, සමාජ සුභසාධනය අරමුණු කරගත් ව්‍යාපාරයක් බව.
  - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානය හා ගුණපාලගේ ෆාමසිය ලාභය අරමුණු කරගත් ව්‍යාපාර බව.

- රෝහල, වෛද්‍ය මධ්‍යස්ථානය හා බස්රථ සේවය, සේවා ව්‍යාපාර බව.
- ඔසුසල හා ෆාමසිය, භාණ්ඩ අලෙවි කරන ව්‍යාපාර බව.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්**

- පහත සඳහන් වන්නේ ව්‍යාපාර වර්ග කළ හැකි නිර්ණායක හතරකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන නිර්ණායකය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - පරිමාණය අනුව
  - නිෂ්පාදන අංශ අනුව
  - අරමුණ අනුව
  - හිමිකාරත්වය අනුව
- ඔබට සපයා ඇති ව්‍යාපාර වර්ගීකරණය සහිත ගැලීම් සටහන හොඳින් අධ්‍යයනය කරන්න.
- ලැබී ඇති නිර්ණායකය හැඳින්වීමට කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඔබ ප්‍රදේශයේ ඇති ඔබට හුරු පුරුදු, ඔබ දන්නා, භාණ්ඩ හා සේවා ලබා ගැනීමට නිතර යන එන ව්‍යාපාර ආයතන හැකිතාක් ලැයිස්තු ගත කරන්න.
- එම ව්‍යාපාර, ඔබට ලැබී ඇති නිර්ණායකය ඔස්සේ වර්ග කිරීමට උත්සාහ ගන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- ව්‍යාපාර පහත සඳහන් නිර්ණායක මත වර්ග කළ හැකි බව.
  - නිෂ්පාදනයේ ස්වභාවය/ මට්ටම අනුව
    - ප්‍රාථමික
    - ද්විතීයික
    - තෘතීයික
  - නිෂ්පාදන අංශ අනුව/ කර්මාන්ත මූලය අනුව
    - කෘෂිකාර්මික
    - කාර්මික
    - සේවා
  - හිමිකාරත්වය අනුව
    - පෞද්ගලික අංශය
    - රාජ්‍ය අංශය
  - අරමුණ අනුව
    - ලාභ අරමුණු කරගත්
    - ලාභ අරමුණු කර නොගත්
  - පරිමාණය අනුව
    - සුළු හා මධ්‍ය පරිමාණ
    - මහා පරිමාණ
  - ප්‍රදේශයේ ඇති ව්‍යාපාර ඉහත එක් එක් නිර්ණායකය මත වර්ග කළ හැකි බව.

## ව්‍යාපාර වර්ගීකරණය

**ව්‍යාපාර වර්ගීකරණ පදනම**

- **නිෂ්පාදනයේ ස්වභාවය අනුව**
  - ප්‍රාථමික
  - ද්විතීයික
  - තෘතීයික
- **නිෂ්පාදන අංශ අනුව**
  - කෘෂි කාර්මික
  - කාර්මික
  - සේවා
- **හිමිකාරීත්වය අනුව**
  - පෞද්ගලික අංශය
  - රාජ්‍ය/පොදු අංශය
- **අරමුණු අනුව**
  - ලාභ අරමුණු කරගත්
  - ලාභ අරමුණු කර නොගත්
- **පරිමාණය අනුව**
  - සුළු හා මධ්‍ය පරිමාණ
  - මහා පරිමාණ

**නිපුණතා මට්ටම 1.4** : ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් නිෂ්පාදන අංශයේ දායකත්වය අගය යි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- රටේ ආර්ථික සංවර්ධනයට දළ දේශීය නිෂ්පාදිතයේ එක් එක් අංශවල දායකත්වය විමසයි.
- පසුගිය වසර කිහිපයක දළ ජාතික නිෂ්පාදිතයේ විවිධ අංශවල ප්‍රවණතා සන්සන්දනය කරයි.
- ප්‍රදේශයේ ඇති ව්‍යාපාර ආයතන, දළ දේශීය නිෂ්පාදිතයේ විවිධ අංශ යටතේ වර්ග කර දක්වයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ආර්ථිකයක වාර්ෂික කාර්ය සාධනය දළ දේශීය නිෂ්පාදිතය මගින් පිළිඹිබු වන බව.
- දළ දේශීය නිෂ්පාදිතය කෘෂිකාර්මික, කාර්මික හා සේවා යනුවෙන් අංශ තුනකට වර්ග කරන බව.
- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවේ පළ කෙරෙන බව.
- ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2008 අනුව දළ දේශීය නිෂ්පාදනයේ ආංශික සංයුතිය පහත දැක්වෙන බව.

**කෘෂිකාර්මික**

1. කෘෂිකර්මය, පශු සම්පත් සහ දැව ආදී වන ද්‍රව්‍ය
   - 1.1 තේ
   - 1.2 රබර්
   - 1.3 පොල්
   - 1.4 සුළු අපනයන භෝග
   - 1.5 වී
   - 1.6 පශු සම්පත්
   - 1.7 අනෙකුත් ආහාර භෝග
   - 1.8 වතු සංවර්ධනය
   - 1.9 දැව සහ වන සම්පත්
   - 1.10 වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන

2. ධීවර කාර්මාන්තය

**කාර්මික**

3. පතල් සහ කැනීම්
4. නිෂ්පාදන කර්මාන්ත
   - 4.1 සැකසුම් (තේ, රබර්, පොල්)
   - 4.2 කර්මාන්තශාලා නිෂ්පාදන
   - 4.3 ගෘහ කර්මාන්ත

5. විදුලිය, ගෑස් සහ ජලය

5.1 විදුලිය

5.2 ගෑස්

5.3 ජලය

6. ඉදිකිරීම්

**සේවා**

7. තොග සහ සිල්ලර වෙළෙඳාම

7.1 ආනයන වෙළෙඳාම

7.2 අපනයන වෙළෙඳාම

7.3 දේශීය වෙළෙඳාම

8. හෝටල් සහ ආපනශාලා

9. ප්‍රවාහනය සහ සන්නිවේදනය

9.1 ප්‍රවාහනය

9.2 භාණ්ඩ මෙහෙයවීම - වරාය සහ සිවිල් ගුවන් සේවා

9.3 තැපැල් සහ විදුලි සන්දේශ

10. බැංකු රක්ෂණ සහ දේපළ වෙළෙඳාම යනාදිය

11. නිවාස අයිතිය

12. රාජ්‍ය සේවා

13. පෞද්ගලික සේවා

- දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් අංශයෙන් වන දායකත්වය ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කළ හැකි බව.

(ආසන්නම වර්ෂයේ මහ බැංකු වාර්තාව පරිශීලනය කරන්න.)

**නිපුණතා මට්ටම 1.5** : ව්‍යාපාර, යෙදවුම් නිමැවුම් ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- ප්‍රදේශයේ ඇති විවිධ ව්‍යාපාරවල නිමැවුම් ලැයිස්තුගත කරයි.
- ව්‍යාපාර යෙදවුම්වලට නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ක්‍රියාවලිය යෙදවුම්- නිමැවුම් ක්‍රියාවලියක් ලෙස රූපසටහනකින් දක්වයි.
- ව්‍යාපාර ක්‍රියාවලියේ කිසියම් නිමැවුමක යෙදවුම් වෙන් කර දක්වයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- යෙදවුම් නිමැවුම් ක්‍රියාවලිය තුළින් කිසියම් නිෂ්පාදිතයක් බිහිවන බව.
- ව්‍යාපාර කටයුතු සඳහා භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය, තොරතුරු, කාලය ආදී යෙදවුම් (සම්පත්) භාවිත කරන බව.
- නිෂ්පාදනය, අලෙවිකරණය, මූල්‍ය කටයුතු, මානව සම්පත් කටයුතු, පර්යේෂණ හා සංවර්ධන, පරිපාලනය යනාදිය මූලික ව්‍යාපාර කාර්ය බව.
- සම්පත්, භාණ්ඩ හෝ සේවා බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය නිෂ්පාදනය (මෙහෙයුම්) බව.
- ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනාගෙන ඒවා තෘප්තිමත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම "අලෙවිකරණය" බව.
- අරමුදල් සම්පාදනය හා යෙදවීම හා ඊට අදාළ කටයුතු "මූල්‍ය" ලෙස හඳුන්වන බව.
- ආකර්ශනය, තෝරා ගැනීම, බඳවා ගැනීම, පුහුණු කිරීම, ඇගයීම, සුභසාධනය යනාදිය සම්බන්ධයෙන් වූ කටයුතු මානව සම්පත් කටයුතු බව.
- නිමැවුමේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම, නව නිපැයුම් ක්‍රම සොයා ගැනීම යනාදී කටයුතු පර්යේෂණය හා සංවර්ධනය වන බව.
- ව්‍යාපාර කටයුතු හා සම්බන්ධ වූ ලියකියවිලි පවත්වාගෙන යාම, සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම යනාදිය පරිපාලන කාර්යයන්ට ඇතුළත් වන බව.
- නිමැවුම භාණ්ඩ හා සේවා ලෙස වර්ග කළ හැකි බව.
- ව්‍යාපාර ක්‍රියාවලිය, යෙදවුම්- නිමැවුම් ක්‍රියාවලියක් ලෙස පහත දැක්වෙන පරිදි රූපසටහනකින් ඉදිරිපත් කළ හැකි ය.

| **යෙදවුම් (සම්පත්)** | | **ව්‍යාපාර කාර්ය** | | **නිමැවුම්** |
|---|---|---|---|---|
| භූමිය | | මෙහෙයුම් (නිෂ්පාදනය) | | භාණ්ඩ |
| ශ්‍රමය | | අලෙවිකරණය | | හෝ |
| ප්‍රාග්ධනය | | මූල්‍ය | | සේවා |
| ව්‍යවසාය | ➔ | මානව සම්පත් කටයුතු | ➔ | |
| තොරතුරු | | පරිපාලනය | | |
| කාලය | | පර්යේෂණ හා සංවර්ධන | | |
| දැනුම | | | | |

**නිපුණතා මට්ටම 1.6** : අවශ්‍යතා හා වුවමනා සපුරාලන විවිධ නිෂ්පාදිත වර්ග කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- භාණ්ඩ, සේවාවලින් වෙන් කොට දක්වන සාධක ඉදිරිපත් කරයි.
- භාණ්ඩ වර්ග කරයි.
- සේවා වර්ග කරයි.
- භාණ්ඩ හා සේවා වර්ගීකරණය ගැලීම් සටහනකින් ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- නිෂ්පාදිත (භාණ්ඩ හා සේවා) පහත දැක්වෙන ගැලීම් සටහනේ පරිදි වර්ග කළ හැකි ය.



**නිපුණතා මට්ටම 1.7** : ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරෙන් ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව ලැයිස්තුගත කරයි.
- විවිධ පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු සොයා බලයි.
- එක් එක් පාර්ශ්ව ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු විවිධ වන බව අනාවරණය කරයි.
- ව්‍යාපාරයක සාර්ථක පැවැත්ම සඳහා ඇල්මැති පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටුවන පරිදි කටයුතු කළ යුතු ආකාරය පෙන්වා දෙයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- ශිෂ්‍යයා පිළිබඳ ඇල්මැති පාර්ශ්ව හඳුනාගෙන පහත රූපසටහන සම්පූර්ණ කරන්න.

**දෙමව්පියන්**




- පාසල කෙරෙහි ඇල්මැති පාර්ශ්ව විමසමින් පහත රූපසටහන සම්පූර්ණ කරන්න.

**ශිෂ්‍යයින්**



- ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව හඳුනා ගැනීමට පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - දෙමව්පියන්, ගුරුවරුන්, යහළුවන්, සහෝදර සහෝදරියන්, නෑදෑයන්, රජයආදී පාර්ශ්ව ශිෂ්‍යයා පිළිබඳ ව ඇල්මැති පාර්ශ්ව කිහිපයක් බව.
  - දෙමව්පියන්, ගුරුවරුන්, ආදී ශිෂ්‍යයින්, රජය, ප්‍රජාව පාසල කෙරෙහි ඇල්මැති පාර්ශ්ව කිහිපයක් බව.
  - ඉහත පාර්ශ්ව අතරින් රජය හා ප්‍රජාව ව්‍යාපාර කෙරෙහි ද ඇල්මැති පාර්ශ්ව වන බව.
  - ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශ්ව ගණනාවක් ඇති බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත දැක්වෙන ව්‍යාපාර ආයතන අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - ඇඳුම් මසා අලෙවි කරන ආයතනයක්.
  - පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානයක්
  - ආපන ශාලාවක්
  - පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවිසැළක්
- ඔබේ මාතෘකාවට අදාළ ව ඔබේ ප්‍රදේශයේ ඇති ව්‍යාපාරයක් හඳුනා ගන්න.
- එම ව්‍යාපාරය කෙරෙහි ඇල්මැති පාර්ශ්ව කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- එම පාර්ශ්ව ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන්නේ මොනවා දැයි සාකච්ඡා කරන්න.
- එම පාර්ශ්වයන්ගේ අපේක්ෂා ඉටුවන ආකාරයට ව්‍යාපාරය කටයුතු කළ යුත්තේ කෙසේ දැයි පෙන්වා දෙන්න.
- ව්‍යාපාරය එම පාර්ශ්ව කෙරෙහි සැලකිලිමත් විය යුත්තේ මන්දැයි පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ සමස්ත පන්තියට නිර්මාණශීලීව ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්ව කිහිපයක් පහත දැක්වෙන බව.
  - අයිතිකරුවන්
  - කළමනාකරුවන්
  - සේවකයන්
  - සැපයුම්කරුවන්
  - ගනුදෙනුකරුවන්
  - රජය
  - ප්‍රජාව
  - තරඟකරුවන්
  - ණය සැපයුම්කරුවන්
  - විභව ආයෝජකයින්

- ඒ එක් එක් පාර්ශ්වය ව්‍යාපාර කෙරෙහි උනන්දුවීමට හේතු පහත දැක්වෙන බව.
  - අයිතිකරුවන් - ලාභය, වර්ධනය, වෙළෙඳපොළ කොටස
  - කළමනාකරුවන් - ලාභය, වර්ධනය, ගත් තීරණවල සාර්ථකභාවය, තනතුරේ වර්ධනය
  - සේවකයන් - වැටුප්, ප්‍රසාද දීමනා, රැකියා තෘප්තිය, රැකියාවේ ස්ථාවරභාවය, උසස්වීම්

- සැපයුම්කරුවන් - ඇණවුම් අඛණ්ඩව ලැබීම, ණය මුදල් ආපසු අයකර ගැනීම
- ගනුදෙනුකරුවන් - ගුණාත්මක භාණ්ඩ හෝ සේවා, ව්‍යාපාරයේ පැවැත්ම, වගකීම් නිසි පරිදි ඉටු කිරීම

- රජය - බදු, සේවා නියුක්තිය, ආර්ථික සංවර්ධනය
- ප්‍රජාව - පරිසර සුරැකීම, රැකියා අවස්ථා
- තරඟකරුවන් - අලෙවි උපායමාර්ග තීරණය කිරීමට, තොරතුරු දැන ගැනීමට

- ණය සැපයුම්කරුවන් - ණය මුදලේ සුරක්ෂිතතාව, ආපසු ලබා ගැනීමේ හැකියාව, සුරැකුම්වල සුරක්ෂිතභාවය
- විභව ආයෝජකයෝ - අනාගතයේ දී තම සම්පත් ආයෝජනය කිරීමට

- ව්‍යාපාරය එම පාර්ශ්ව කෙරෙහි සැලකිලිමත්වීමට හේතු කිහිපයක් පහත සඳහන් වන බව.
  - අයිතිකරුවන් - පැවැත්ම තහවුරු කර ගැනීමට
  - සේවකයන් - සේවක ඵලදායකත්වය වැඩිකර ගැනීමට, සේවක තෘප්තිය ඇති කිරීමට
  - ණය සැපයුම්කරුවන් - අඛණ්ඩව අවශ්‍ය අරමුදල් සම්පාදනය කර ගැනීමට.
  - රජය - විශේෂ සහන ලබා ගැනීමට, යටිතල පහසුකම් ලබා ගැනීමට
  - ගනුදෙනුකරුවන් - අදාළ භාණ්ඩය හෝ සේවාව සඳහා වෙළෙඳපොළ සුරක්ෂිත කර ගැනීමට

**නිපුණතාව 2.0** : ව්‍යාපාර පරිසරය ව්‍යාපාරවල පැවැත්ම කෙරෙහි බලපෑම් ඇති කරන බව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 2.1** : ව්‍යාපාර පරිසරය විශ්ලේෂණය කිරීමේ පහසුව සඳහා ව්‍යාපාර පරිසරය වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- ව්‍යාපාර පරිසරය අර්ථ දක්වයි.
- ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රයෝජන ලැයිස්තු ගත කරයි.
- ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරන පරිසර බලවේග ලැයිස්තු ගත කරයි.
- පරිසර බලවේගවල ස්වභාවය මත ව්‍යාපාර පරිසරය වර්ග කරයි.
- දෙන ලද ආයතනයක අභ්‍යන්තර හා බාහිර පරිසර බලවේග වෙන් වෙන්ව ලැයිස්තු ගත කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර කටයුතු කෙරෙහි යම් යම් බලපෑම් ඇති කරන සාධක ක්‍රියාත්මක වන පරිසරය, ව්‍යාපාර පරිසරය ලෙස හැඳින්විය හැකි බව.
- ව්‍යාපාර පරිසරය අධ්‍යයනයෙන් ව්‍යාපාරියෙකුට බොහෝ ප්‍රයෝජන අත්වන බව.
  - ශක්තීන් හඳුනා ගැනීමට
  - දුර්වලතා හඳුනා ගැනීමට
  - අවස්ථා හඳුනා ගැනීමට
  - තර්ජන හඳුනා ගැනීමට
- ව්‍යාපාර පරිසරය පහත පරිදි වර්ග කළ හැකි බව.



- ව්‍යාපාර පරිසරය වර්ග කිරීම පහත පරිදි රූපසටහනකින් ඉදිරිපත් කළ හැකි බව.



- ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය යනු සංවිධානය තුළ සිටින, එයට බලපෑම් කරන කණ්ඩායම් (Forces) සහ තත්ත්ව (Condition) බව.
- ව්‍යාපාරයට බලපෑම් කරන, ව්‍යාපාර ආයතනයට පිටතින් ඇති සියලු ම දේ බාහිර පරිසරය බව.
- ව්‍යාපාරයට බලපෑම් ඇති කරන සුවිශේෂ සංවිධාන හෝ කණ්ඩායම් ආසන්න පරිසරය බව.
- ව්‍යාපාරයක පුළුල් වටපිටාව සහ ඒ හා බැඳුණු බලපෑම් කරන කණ්ඩායම් සාර්ව පරිසරය හෙවත් පොදු පරිසරය බව.

**නිපුණතා මට්ටම 2.2** : අභ්‍යන්තර පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- තෝරාගත් ව්‍යාපාරයක් සඳහා බලපෑම් කරන අභ්‍යන්තර පරිසරයේ බලවේග ලැයිස්තු ගත කරයි.
- අභ්‍යන්තර පරිසර බලවේග අධ්‍යයනය තුළින් ආයතනයක ශක්තීන් හඳුනාගෙන ලැයිස්තු ගත කරයි.
- අභ්‍යන්තර පරිසර බලවේග අධ්‍යයනය තුළින් ආයතනයක දුර්වලතා හඳුනාගෙන ලැයිස්තු ගත කරයි.
- ශක්තීන් හා දුර්වලතා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය තුලනාත්මක ව විග්‍රහ කරයි.
- ශක්තීන් ප්‍රයෝජනයට ගෙන ව්‍යාපාරය සාර්ථක කර ගත හැකි බවත්, දුර්වලතා මගහරවා ගැනීමට අවශ්‍ය පියවර ගත හැකි බවත් හේතු සහිත ව පැහැදිලි කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- පාසලේ කටයුතු සඳහා බලපෑම් කරන අභ්‍යන්තර බලවේග සිසුන්ගෙන් විමසන්න.
- එම බලවේග පාසලේ කටයුතු කෙරෙහි කරන බලපෑම විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - විදුහල්පති, ගුරුවරු, දෙමව්පියන්, ආදි ශිෂ්‍යයින්, පාසලේ ඇති සම්පත් යනාදිය පාසලේ කටයුතු සඳහා බලපෑම් කරන බලවේග බව.
  - එම බලවේග පාසලේ කටයුතු සඳහා ශක්තියක් වන බව.

    **නිදසුන්:**
    - විදුහල්පතිගේ පෞරුෂය
    - ගුරුවරුන්ගේ පුහුණුව හා පළපුරුද්ද
    - ආදි ශිෂ්‍යයින්ගේ ආධාර හා උපකාර
    - අවශ්‍ය භෞතික සම්පත් පැවතීම.
  - එම බලවේගවල දුර්වලතා ද පැවතිය හැකි බව.

    ***නිදසුන්:***
    - ගුරුවරුන්ගේ කැපවීම අඩුකම
    - ආදි ශිෂ්‍යයින්ගේ අනුග්‍රහය නොමැතිවීම
    - අවශ්‍ය භෞතික සම්පත් නොමැතිවීම.
  - ව්‍යාපාර ආයතනවල අභ්‍යන්තර පරිසර බලවේගවල ද ශක්තීන් හා දුර්වලතා ඇති බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් වන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරන අභ්‍යන්තර පරිසර බලවේග යුගල තුනකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන පරිසර බලවේග යුගලය කෙරෙහි අවදානය යොමු කරන්න.
    - අයිතිකරුවෝ - සංවිධානමය සංස්කෘතිය
    - කළමනාකරුවෝ - සංවිධාන ව්‍යූහය
    - සේවකයෝ - සම්පත්

- මාතෘකාවට අදාළ බලවේග හඳුනා ගැනීමට ඔබට හුරුපුරුදු ව්‍යාපාර ආයතනයක් කෙරෙහි අවදානය යොමු කරන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා ඔබට ලැබුණු බලවේගවලින් බලාපොරොත්තු විය හැකි සහාය, සාකච්ඡාවක් මගින් හඳුනා ගන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වය සඳහා එම බලවේගවල තිබිය යුතු ශක්තීන් හඳුනා ගන්න.
- ව්‍යාපාරයේ සාර්ථකත්වයට අහිතකර ලෙස බලපාන එම බලවේගවල තිබිය හැකි දුර්වලතා ලැයිස්තුගත කරන්න.
- එම ශක්තීන්ගෙන් ප්‍රයෝජන ගැනීම සඳහාත්, දුර්වලතා මඟහරවා ගැනීම සඳහාත් ඔබට දිය හැකි යෝජනා ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර අභ්‍යන්තරයේ පරිසර බලවේග පහත දැක්වෙන බව.
    - අයිතිකරුවන්
    - කළමනාකරුවන්
    - සේවකයන්
    - සංවිධානමය සංස්කෘතිය
    - සංවිධාන ව්‍යූහය
    - සම්පත්
- අයිතිකරුවන් වැඩි සංඛ්‍යාවක් සිටීම, අයිතිකරුවන්ගේ දැනුම හා පළපුරුද්ද, මූල්‍ය ශක්තිය යනාදිය අයිතිකරුවන්ගේ ශක්තීන් බව.
- අයිතිකරුවන් සංඛ්‍යාව කුඩාවීම, මූල්‍ය ශක්තිය අඩුවීම, දැනුම හා පළපුරුද්ද අඩුවීම යනාදිය අයිතිකරුවන්ගේ දුර්වලතා බව.
- පුහුණු හා පළපුරුදු කළමනාකරුවන් සිටීම,නිවැරදි තීරණ ගැනීම යනාදිය කළමනාකරුවන්ගේ ශක්තීන් බව.
- නුපුහුණු හා අදක්ෂ කළමනාකරුවන් සිටීම, වැරදි තීරණ ගැනීම යනාදිය කළමනාකරුවන්ගේ දුර්වලතා බව.
- දක්ෂ හා පුහුණු සේවකයන්, අභිප්‍රේරණය වූ සේවකයන් යනාදිය ව්‍යාපාරයට ශක්තියක් බව.

- නුපුහුණු සේවකයන්, ආකර්යක්ෂම සේවකයන් යනාදිය සේවකයන්ගේ දුර්වලතා බව.
- ව්‍යාපාරයේ එකිනෙකා අතර බෙදාහදා ගන්නා හා ඊළඟ පරම්පරාව වෙත පවරනු ලබන විශ්වාස, වටිනාකම්, ආකල්ප, ප්‍රතිමාන, පුරුදු, නීති හා හැසිරීම් රටා සංවිධානමය සංස්කෘතිය ලෙස හැඳින්විය හැකි බව.
- සංවිධානමය සංස්කෘතිය තුළ ද ශක්තීන් මෙන් ම දුර්වලතා පැවතිය හැකි බව.
- සංවිධානයේ අරමුණු පහසුවෙන් ළඟා කර ගැනීමට හැකිවන පරිදි සංවිධානයේ කටයුතු, සම්පත් සහ අධිකාරිය බෙදී යන ආකාරය සංවිධාන ව්‍යුහය ලෙස හැඳින්විය හැකි බව.
- ව්‍යාපාරයේ සංවිධාන ව්‍යුහය ද ව්‍යාපාරයට ශක්තීන් හෝ දුර්වලතා ගෙන දිය හැකි බව.
- භාණ්ඩ හෝ සේවා නිපදවීම සඳහා යෙදවුම් ලෙස භාවිත කරන ඕනෑම දෙයක් සම්පත් ලෙස හැඳින්විය හැකි බව.
- භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය, කාලය, තොරතුරු යන දෑ ව්‍යාපාර සම්පත් වන බව.
- මෙම සම්පත්වල ශක්තීන් මෙන් ම දුර්වලතාද පැවතිය හැකි බව.
- සියලු අභ්‍යන්තර පරිසර බලවේගවල ශක්තීන්වලින් ප්‍රයෝජන ගැනීමටත්, දුර්වලතා අවම කර ගැනීමටත් ව්‍යාපාර උත්සාහ ගත යුතු බව.

**නිපුණතා මට්ටම 2.3** : ආසන්න පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- තෝරාගත් ව්‍යාපාරයක් කෙරෙහි බලපෑම් ඇති කරන ආසන්න පරිසර බලවේග ලැයිස්තු ගත කරයි.
- ආසන්න පරිසරයේ බලවේග ආශ්‍රිත ව ඇති වන ව්‍යාපාර අවස්ථා හඳුන්වයි.
- ආසන්න පරිසර බලවේග ආශ්‍රිත ව ව්‍යාපාරවලට ඇති වන තර්ජන අනාවරණය කරයි.
- ආසන්න පරිසර බලවේග ව්‍යාපාරවලට කරන බලපෑම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- ව්‍යාපාර අවස්ථා හඳුනාගෙන ඒවායින් ප්‍රයෝජන ගැනීමටත්, තර්ජනවලට මුහුණදීමටත් යෝජනා ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර ආසන්න පරිසර බලවේග පහත දැක්වෙන බව.
  - ගනුදෙනුකරුවෝ
  - සැපයුම්කරුවෝ
  - තරගකරුවෝ
  - ආදේශන භාණ්ඩ නිපදවන්නෝ
  - වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂිත නව ව්‍යාපාරිකයෝ
- ව්‍යාපාරයේ භාණ්ඩ හා සේවා මිලට ගන්නන්, ගනුදෙනුකරුවන් වන බව.
- ගනුදෙනුකරුවන්ගේ දැනුවත් බව, ගනුදෙනුකරුවන්ගේ ආදායම යනාදී කරුණු ව්‍යාපාරවලට අවස්ථා මෙන් ම තර්ජන ද ඇති කරන බව.
- ව්‍යාපාරයට අවශ්‍ය සම්පත් සපයන පුද්ගලයින් හා ආයතන සැපයුම්කරුවන් වන බව.
- සැපයුම්කරුවන් කලට වේලාවට ගුණාත්මක ද්‍රව්‍ය සැපයීම හෝ නොසැපයීම, වට්ටම් ලැබීම හෝ නොලැබීම යනාදී කරුණු ව්‍යාපාරවලට තර්ජන හෝ අවස්ථා ඇති කරන බව
- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩ හෝ සේවාවලට සමාන නිෂ්පාදිත ඉදිරිපත් කරන වෙනත් ව්‍යාපාර තරගකරුවන් වන බව.
- නව තරගකරුවන් වෙළෙඳ පොළට පැමිණීම, වෙළෙඳපොළේ සිටින තරගකරුවන් ඉවත්වීම, තරගකරුවන් ඔවුන්ගේ භාණ්ඩ හා සේවා සමඟ විවිධ පහසුකම් සැලසීම ව්‍යාපාරවලට අවස්ථා මෙන්ම තර්ජන ද උදා කරන බව.
- ව්‍යාපාරය ඉදිරිපත් කරන භාණ්ඩය හෝ සේවාවට විකල්ප භාණ්ඩ ඉදිරිපත් කරන්නන්, ආදේශන භාණ්ඩ නිපදවන්නන් බව.
- ආදේශන භාණ්ඩ වෙළඳපොළේ බහුලවීම ව්‍යාපාරයට තර්ජනයක් වන අතර, එය වෙනත් ව්‍යාපාරික අවස්ථා උදා කිරීමට ද හේතු වන බව.
- වෙළෙඳපොළට පිවිසීමට අපේක්ෂාවෙන් සිටින්නන් හෙවත් විභව ආයෝජකයන් ව්‍යාපාරයට අවස්ථා හා තර්ජන ඇති කරන බව.

**නිපුණතා මට්ටම 2.4** : සාර්ව පරිසර බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- තෝරාගත් ව්‍යාපාරයකට බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග ලැයිස්තු ගත කරයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගවල ස්වභාවය පෙන්වා දෙයි.
- එක් එක් සාර්ව පරිසර බලවේගවල වැදගත්කම පෙන්වා දෙයි.
- සාර්ව පරිසරයේ බලවේග ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් විග්‍රහ කරයි.
- සාර්ව පරිසරයේ බලවේග අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව නිදසුන් මගින් පැහැදිලි කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- "ඛනිජ තෙල් මිල ඉහළයාම සඳහන් වන පුවත්පත් දැන්වීමක්" පන්තියට ඉදිරිපත් කරන්න.
- ඛණිජ තෙල් මිල ඉහළ යාම, ඕනෑම ව්‍යාපාරයකට බලපෑම් ඇති කරන ගෝලීය බලපෑමක් වන බව සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- ඛනිජ තෙල් යනු ස්වභාවික පරිසරයේ ඇති ක්ෂය වන සම්පතක් බවත්, මෙම සම්පත ප්‍රවාහන සේවාවට පමණක් නොව සෑම ව්‍යාපාර ක්ෂේත්‍රයකට ම බලපෑම් ඇති කරන ආකාරය සාකච්ඡා කරන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් ප්‍රවෘත්ති කාණ්ඩ අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රවෘත්ති කාණ්ඩ කෙරෙහි අවධානය යොමු කරන්න.

**ප්‍රවෘත්ති කාණ්ඩ 1**

- සෑම වෙළෙඳසැළකම භාණ්ඩවල මිල ගණන් ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.
- ලබන වසරේ පාර්ලිමේන්තු මහා මැතිවරණය පැවැත්වේ.

**ප්‍රවෘත්ති කාණ්ඩ 2**

- සෑම පුද්ගලයන් හතර දෙනෙකුගෙන් එක්අයෙකු වැඩිහිටියෙකු වේ.
- දළදා පෙරහැර අතිඋත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට සියලු කටයුතු සම්පාදනය කර ඇත.

**ප්‍රවෘත්ති කාණ්ඩ 3**

- ලබන මාසයේ දී නැවතත් ගෑස් මිල ඉහළට
- ගොයම් කැපීම හා පෑගීම සඳහා නවීනතම යන්ත්‍රයක් නිෂ්පාදනය කර ඇත.

**ප්‍රවෘත්ති කාණ්ඩ 4**

- ශ්‍රී ලංකා පොළොවෙන් ඛනිජ තෙල්
- සාර්ක් (SAARC) කලාපීය රටවල් එකම මුදල් ඒකකයක් භාවිත කිරීමට යෝජනා ඉදිරිපත් කර ඇත.

- ඔබ කණ්ඩායමට ලැබුණු ප්‍රවෘත්ති කාණ්ඩ මගින් විස්තර වන සාර්ව පරිසර හඳුනා ගන්න.
- ඔබට ලැබුණු සිදුවීම් නිසා ව්‍යාපාරවලට ඇති විය හැකි බලපෑම් පැහැදිලි කරන්න.
- ඔබ හඳුනා ගත් සාර්ව පරිසරය තුළ සිදු විය හැකි ව්‍යාපාරවලට බලපෑම් කරන වෙනත් සිදුවීම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.
- ඔබ හඳුනාගත් සාර්ව පරිසරවල සිදුවන සිදුවීම්, ව්‍යාපාරයේ ආසන්න පරිසර බලවේග කෙරෙහි ඇති කරන බලපෑම් පෙන්වා දෙන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාරවලට බලපෑම් ඇති කරන සාර්ව පරිසර බලවේග පහත දැක්වෙන අයුරින් ලැයිස්තු ගත කළ හැකි බව.
  - දේශපාලන හා නෛතික පරිසරය
  - ආර්ථික පරිසරය
  - සමාජයීය හා සංස්කෘතික පරිසරය
  - තාක්ෂණික පරිසරය
  - ප්‍රජා පරිසරය
  - ස්වභාවික පරිසරය
  - ගෝලීය පරිසරය

- එක් එක් සාර්ව පරිසර බලවේග ව්‍යාපාරවල පැවැත්මට බලපෑම් ඇති කරන බව.
  - <u>දේශපාලන හා නෛතික පරිසරය -</u>

    රජයේ අණපනත් හා නීතිරීති, රාජ්‍ය නියෝජිත ආයතන, පවතින රජයේ දේශපාලන ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් කරයි.

  - <u>ආර්ථික පරිසරය</u> -

    ව්‍යාපාරවල පැවැත්ම සඳහා ක්‍රය ශක්තිය බලපායි. මෙය ආර්ථික සාධක මත රැඳේ. එමෙන්ම ව්‍යාපාර කටයුතු සඳහා දැරීමට සිදුවන පිරිවැය ද ආර්ථික සාධක මත රැඳේ.

    මෙසේ ව්‍යාපාරික හා පරිභෝගික වියදම්වලට අමතර ව පොලී අනුපාතය, ආදායම් බෙදීයාම, උද්ධමන අනුපාතය, රැකියා සුලභතාව, ලෝක වෙළෙඳපොළේ මිල ගණන්වල විචලන යනාදිය ව්‍යාපාරවලට බලපෑම් කරන ආර්ථික පරිසර සාධක වේ.

- සමාජයීය හා සංස්කෘතික පරිසරය -

පුද්ගලයන්ගේ විශ්වාස, අගනාකම්, අපේක්ෂා හා සමාජ සාරධර්ම යනාදිය සමාජයීය හා සංස්කෘතික පරිසරය තුළින් ඔපවත් වේ. වර්තමානයේ රටවල් අතර පවත්නා සමීප සම්බන්ධතා නිසා මිනිසුන්ගේ සිතුම් පැතුම්, අදහස්, චාරිත්‍රවල වෙනස්කම් ඇතිවෙමින් පවතියි. මෙම තත්ත්ව ව්‍යාපාරවලට බලපෑමක් ඇති කරයි.

- තාක්ෂණික පරිසරය-

කෘෂිකාර්මික, කාර්මික, වෛද්‍ය, සන්නිවේදන, ප්‍රවාහන යනාදී ක්ෂේත්‍රවල සිදුවී ඇති තාක්ෂණික වෙනස්කම් නිසා මිනිසුන්ගේ ජීවන රටාව විස්මය ජනක ලෙස වෙනස් කර තිබේ. මෙම තත්ත්ව ව්‍යාපාරික කටයුතුවල වෙනස්වීම් ඇති කිරීමට හේතු වී ඇත.

- ප්‍රජා පරිසරය -

ව්‍යාපාර සමග සම්බන්ධ වන ප්‍රධානම සාධකය ජනගහනය යි. එනම් වෙළෙඳපොළ සමන්විතවන්නේ පුද්ගලයන්ගෙනි. මෙම ජනගහනයේ ප්‍රමාණය, ජනගහන වර්ධන අනුපාතය, වයස් ව්‍යුහය, ස්ත්‍රී පුරුෂභාවය, ජනවාර්ගික මිශ්‍රය, අධ්‍යාපන මට්ටම්, පවුලේ සංයුතිය, ගෘහ රටාව යනාදී සාධක විවිධාකාරයෙන් ව්‍යාපාර කෙරෙහි බලපෑම් ඇති කරයි.

- ස්වභාවික පරිසරය-

ස්වභාවික සම්පත්වලට සිදුවන හානිදායක තත්ත්ව ගැන අද ගෝලීය වශයෙන් අවදානය යොමුවෙමින් පවතියි. ලොව බොහෝ රටවල ව්‍යාපාර කටයුතු නිසා වාතය, ජලය, පස දූෂණයට ලක්ව ඇත. ස්වභාවික පරිසරයේ යහපත් තත්ත්ව ඇති කරමින් ව්‍යාපාර කටයුතුවලට යොමුවීම පිළිබඳ ව නීතිරීති පවා පනවා තිබේ.

- ගෝලීය පරිසරය-

ගෝලීයකරණය හේතුවෙන් රටවල් අතර භාණ්ඩ හා සේවා හුවමාරුවීමට වැඩි අවස්ථා සැලසී තිබේ. එසේ ම පුද්ගලයින්ගේ සංස්කෘතිය ද වෙනසකට ලක් ව තිබේ. මේ නිසා විවිධ භාණ්ඩ හා සේවා ලෝක වෙළෙඳපොළට එක් වී තිබේ. දැඩි තරගකාරිත්වයක් දක්නට ලැබේ.

- සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධතාවක් පවත්නා බව.

***නිදසුන් :***

  - මැණික් ඉල්ලම් ස්වභාවික පරිසරයට අයත් වේ. නමුත් එය ව්‍යාපාර කටයුත්තක් බවට පත් කිරීමේ දී නීතියේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වේ.
  - වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ගේ පහසුව සඳහා නවීන තාක්ෂණික උපකරණයක් වන ටෙලර් යන්ත්‍රයක් සවි කිරීමේ දී මහබැංකුවේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වේ.
  - සමාජ හා සංස්කෘතික සාධක ප්‍රජාව හා සම්බන්ධ වේ.
  - ගෝලීය පරිසරයේ වෙනස්කම් ආර්ථික පරිසරය හා සම්බන්ධ වේ.
  - ආර්ථික පරිසරය, ස්වභාවික හා ගෝලීය පරිසරය සමඟ සම්බන්ධ වේ.
- සාර්ව පරිසර බලවේග වෙන් වෙන්ව විස්තර කළ ද මේවා අතර අන්තර් සම්බන්ධතාවක් පවතින බව.

**නිපුණතාව 3.0** : ගතික ව්‍යාපාර පරිසරයට අනුගතවීමට ව්‍යාපාර සමාජ වගකීම් හා ආචාර ධර්ම කෙරෙහි සැලකිලිමත් වෙයි.

**නිපුණතා මට්ටම 3.1** : ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම අගය යි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 07

## ඉගෙනුම් ඵල

- පිළිගත් නිර්වචන ඇසුරින් ව්‍යාපාර සමාජ වගකීම හඳුන්වයි.
- ව්‍යාපාරිකයන් සමාජ වගකීම් ඉටු කිරීමේ වැදගත්කම පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලින් සමාජ වගකීම් ඉටුවිය යුතු පාර්ශ්ව ලැයිස්තු ගත කරයි.
- එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් වෙන් වෙන්ව නිදසුන් සහිත ව ඉදිරිපත් කරයි.
- ව්‍යාපාරයක් නිදසුන් ලෙස ගෙන අදාළ එක් එක් පාර්ශ්ව වෙත සමාජ වගකීම් ඉටු කරන ආකාරය පෙන්වා දෙයි.
- සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට හිමි කරගත හැකි ප්‍රතිලාභ ලැයිස්තු ගත කරයි.
- ව්‍යාපාරයක් නිදසුන් වශයෙන් ගෙන, එය සමාජ වගකීම ඉටු කිරීමෙන් ලබා ගෙන ඇති ප්‍රතිලාභ පැහැදිලි කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර සමාජ වගකීම් සංකල්පය පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇති බව.

  ***නිදසුන්:***

  "සමස්ත සමාජයේ සහ ප්‍රාදේශීය ජනතාවගේත්, සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වලත්, ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හා සදාචාරාත්මක ව හැසිරෙන බවට ව්‍යාපාර අඛණ්ඩව කැපවීම ව්‍යාපාරයන්හි සමාජ වගකීමයි."

  World business council for sustainable development

  " සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳ වූ අදහසකි, සමාජ වගකීම"

  Mallen Baker

- ව්‍යාපාර සමාජ වගකීම පිළිබඳ ව වූ ජාතික නිර්වචන ද ඇති බව.
  - ඇමෙරිකා එක්සත් ජනපදය (USA)

    "සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳවත්, එමගින් සමාජයට ඇති වන බලපෑම් පිළිබඳවත් පෞද්ගලිකව ම ව්‍යාපාර වගකීම" සමාජ වගකීමයි.

  - පිලිපීනය

    "ව්‍යාපාර සමාජයට ආපසු දෙන දෑ" සමාජ වගකීමයි.
- විද්‍යුත් ව්‍යාපාර, ගෝලීයකරණය, ව්‍යාපාර තරගය යනාදී අංශවල ව්‍යාප්තියත් සමඟ ව්‍යාපාරවල ක්‍රියාකාරකම් , ව්‍යාපාරය කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්වයනට හා පොදුවේ සමාජයට අහිතකර බලපෑම් කරන බව.
- ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දැඩි අවධානයක් වර්තමානයේ වර්ධනය වී ඇති බව.

- **පහත සඳහන් රූප සටහනෙහි දැක්වෙන පරිදි එක් එක් පර්ශ්වය වෙත ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කළ යුතු බව.**

- රැකියා නියුක්තියට දායක වීම
- බඳු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරිම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- ප්‍රජා සත්කාර සේවා
- හරිත නිෂ්පාදිත
- පරිසර හිතකාමී

ලෙස කටයුතු කිරීම




- සමානාත්මතාව
- මනා සේවක සම්බන්ධතා
- වෘත්තීමය ආරක්ෂාව
- සෞඛ්‍ය පහසුකම්

- සාධාරණ ඉපයීමක් ලබාදීම
- ආර්ථික ප්‍රතිලාභ අත්කරදීම
- කාර්යක්ෂම ව හා අවංක ලෙස කළමනාකරණ කටයුතු මෙයෙවීම.

- සාධාරණවීම
- හානි අවම කිරීම (ආරක්ෂාව)
- අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

- එම එක් එක් පාර්ශ්වය වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ හැකි බව.
- ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාර පැවැත්ම තහවුරු වන බව.

***නිදසුන්:***
- කීර්තිනාමය වර්ධනය වීම.
- ව්‍යාපාරය පිළිබඳ විශ්වසනීයත්වය තහවුරු වීම.

**නිපුණතා මට්ටම 3.2** : ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 08

## ඉගෙනුම් ඵල

- ව්‍යාපාර ආචාර ධර්ම සංකල්පය පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලින් සිදුවන හොඳ සහ නරක දැ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක පෙළගස්වයි.
- එම එක් එක් සාධකය සඳහා සුදුසු ව්‍යාපාර ආචාර ධර්ම තම අත්දැකීම් ඇසුරෙන් යෝජනා කරයි.
- දන්නා ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එම ආයතනය පිළිපදින ආචාර ධර්ම සාකච්ඡා කරයි.
- උපකල්පනය කරන ලද ව්‍යාපාරයකට ගැළපෙන ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනගයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- පාසල තුළදී පිළිපැදිය යුතු ආචාර ධර්ම පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - පන්තියට ගුරුවරයෙකු පැමිණි විට ආචාර කිරීම, පාසල ආරම්භ කිරීමට පෙර ආගමික වතාවත් සිදු කිරීම, ජලය, විදුලිය අපතේ යාමට ඉඩ නොහැරීම, අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීම, ගුරුවරයා වේලාවට පැමිණීම, ඇඳුම් පැළඳුම් පිළිබඳ ව සැලකිලිමත් වීම, පාසල තුළ දුම්පානය නොකිරීම, සියලු ම සිසුන්ට සමානව සැලකීම යනාදී යහපත් ක්‍රියා පාසල තුළ දී පිළිපැදිය යුතු බව.
    - යහපත් දේ කිරීමත්, අයහපත් දේ නොකිරීමත් ආචාරධර්ම වන බව.
    - ව්‍යාපාර ආයතන ද මෙලෙස පාරිභෝගිකයන් සමඟ කටයුතු කිරීමේ දී පිළිපැදිය යුතු ආචාරධර්ම පවතින බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් වන්නේ ඔබට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට සිදුවූ අවස්ථා කීපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - නිමි ඇඳුම් හෝ රෙදිපිළි මිලදී ගැනීම සිදුවූ අවස්ථාවක්
    - තෑගි භාණ්ඩයක් මිලදී ගැනීම සිදුවූ අවස්ථාවක්
    - පොදු ප්‍රවාහන සේවා පහසුකම් ලබාගත් අවස්ථාවක්

- අදාළ අවස්ථාව පිළිබඳ කණ්ඩායම් සාමාජිකයින්ගේ අත්දැකීම් සිහිපත් කිරීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- එම අවස්ථාවේ දී එක් එක් සාමාජිකයා අත්දුටු හොඳ සහ නරක අත්දැකීම් ලැයිස්තුගත කරන්න.
- හොඳ සහ නරක පිළිබඳ නිවැරදි අවබෝධයෙන් ව්‍යාපාරිකයන් කටයුතු කළ යුත්තේ මන්ද යන්න පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

- ඔබට ලැබුණු අවස්ථාවට අදාළ ව්‍යාපාරයක් ඔබ කණ්ඩාම විසින් පවත්වාගෙන යන්නේ යැයි උපකල්පනය කර, එම ව්‍යාපාරය සඳහා අනුගමනය කිරීමට බලාපොරොත්තු වන ආචාර ධර්ම පද්ධතියක් ගොඩනගන්න.
- එම ආචාර ධර්ම පද්ධතිය ගොඩනැගීමේ දී ඔබ විසින් සැලකිල්ල යොමු කළ (අවදානය යොමු කළ) සාධක පෙළගස්වන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යාපාර තමන් සමඟ කටයුතු කරන සියලු පර්ශ්වවලට යහපතක් සිදුවන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම, ව්‍යාපාර ආචාර ධර්ම ලෙස හැඳින්විය හැකි බව.
- ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාරවලට වැදගත් වන බව.

***නිදසුන්:***

  - ගිණුම්කරණ කටයුතුවලට අදාළ ආචාරධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුළ සිදුවිය හැකි මූල්‍ය අක්‍රමිකතා වැනි විෂමාචාර පිටුදැකීමට ඉවහල් වේ.
  - සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාර ධර්ම තුළින් සේවකයන්ට ජාති, කුල, ආගම් හෝ ස්ත්‍රී පුරුෂ ආදී වශයෙන් සිදුවන අසාධාරණකම් සිදු නොවීමෙන් මනා මානව සම්පත් කළමනාකරණයක් සිදුවේ.
  - ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණය සිදු කිරීම.

- ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී බොහෝ කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව.

| ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක | |
|---|---|
| → | ව්‍යාපාරය |
| → | ගනුදෙනුකරු |
| → | සේවකයා |
| → | තරඟකරුවන් |
| → | සමාජ සංස්කෘතිය |
| → | සංවිධාන සංස්කෘතිය |
| → | ප්‍රායෝගික බව |

***නිදසුන්:***

- ගනුදෙනුකරු : ඔහු කවුද යන්න අවබෝධයෙන් එනම්, ආගමික, සමාජ,සංස්කෘතීන්ට අදාළ කරුණු මෙන්ම, ඉල්ලුම් රටා, සන්නිවේදන වැනි කරුණු සැලකිල්ලට ගැනීම.
- සමාජ සංස්කෘතිය : ජනවර්ගයා තුළ මුල්බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උපසංස්කෘතීන් ගැන සැලකිලිමත් වී ආචාර ධර්ම පද්ධතිය සැකසීම.

**නිපුණතාව 4.0** : රජය සමඟ සම්බන්ධතා පවත්වා ගනිමින් ව්‍යාපාර පවත්වා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 4.1** : රජය ව්‍යාපාර කෙරේ බලපෑම් කරන අයුරු විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- ශ්‍රී ලංකාවේ ව්‍යාපාරවලට රාජ්‍ය බලපෑම, මධ්‍යම රජය, පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහා සිදුවන බව පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාර ආයතනයක් නිදසුන් වශයෙන් ගෙන එයට මධ්‍යම රජය. පළාත් සභාව හා පළාත් පාලන ආයතනය මැදිහත් වන ආකාරය වෙන් වෙන්ව පෙන්වා දෙයි.
- රජය ව්‍යාපාරවලට බලපෑම් කරන විවිධ ආකාර පැහැදිලි කරයි.
- රජය ව්‍යාපාරවලට බලපෑම් කරන එක් එක් ආකාරය සඳහා නිදසුන් වෙන වෙනම ඉදිරිපත් කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

### පිවිසුම

- අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීමට රජයෙන් සිසුන්ට ලැබෙන විවිධ පහසුකම් සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - රජය සිසුන්ට නිල ඇඳුම්, වාර ප්‍රවේශ පත්‍ර, ශිෂ්‍යාධාර, පෙළපොත්, පාසල් ගොඩනැගිලි යනාදිය සපයන බව.
    - එසේම ව්‍යාපාර කටයුතු සාර්ථක කර ගැනීම සඳහා රජය විසින් ව්‍යාපාරිකයන්ට ද, විවිධ පහසුකම් සපයන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් වන්නේ ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යන ව්‍යාපාර ආයතන තුනකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරය කෙරෙහි අවධානය යොමු කරන්න.
    - ඇගලුම් අපනයනය කරන ආයතනයක්
    - අර්තාපල් වගා කරන ගොවිපළක්
    - ප්‍රවාහන සේවා සපයන ආයතනයක්

- අදාළ ව්‍යාපාර ආයතනය ඔබ කණ්ඩායම විසින් පවත්වාගෙන යන්නේ යැයි උපකල්පනය කරන්න.
- අදාළ ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා ඔබ කණ්ඩායමට රජයෙන් ලබා ගත හැකි සහාය එකිනෙක පෙළගස්වන්න.
- එම එක් එක් සහාය ලබාගත හැකි රජයේ ආයතන ලැයිස්තුගත කරන්න.

- එම ආයතන මධ්‍යම රජයේ ආයතන, පළාත් සභා යටතේ ඇති ආයතන හා පළාත් පාලන ආයතන ලෙස වර්ග කර දක්වන්න.
- රජය එම සහාය ව්‍යාපාරවලට සැපයීම වැදගත් වන්නේ මන්දයි පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්**

- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කෙරෙහි රාජ්‍ය බලපෑම පහත ආකාරයෙන් සිදු වන බව.
  - මධ්‍යම රජයේ ප්‍රතිපත්ති, නීතිරීති හා රෙගුලාසි
  - පළාත් සභා ප්‍රතිපත්ති, නීතිරීති හා රෙගුලාසි
  - පළාත් පාලන ආයතන ප්‍රතිපත්ති, නිතිරීති හා රෙගුලාසි

- රජය ව්‍යාපාරවලට බලපෑම් කරන ආකාර කිහිපයක් පහත සඳහන් කරුණු ඔස්සේ පැහැදිලි කළ හැකි බව.
  - යටිතල පහසුකම් සැපයීම
  - තරඟකරුවෙකු වීම
  - ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
  - නීතිරීති පැනවීම
  - දිරිගැන්වීම් ලබාදීම
  - බදු අය කරන්නෙකුවීම

**නිපුණතා මට්ටම 4.2** : රජයක ආර්ථික අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- රජයක ආර්ථික අරමුණු විස්තර කරයි.
- රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට ව්‍යාපාර දායක වන ආකාරය පැහැදිලි කරයි.
- තෝරාගත් ව්‍යාපාරයක් නිදසුනක් ලෙස ගෙන එය රජයේ ආර්ථික අරමුණු ඉටු කිරීමට දායක වන ආකාරය පෙන්වා දෙයි.
- රජයත්, ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව තුළින් දෙපාර්ශ්වයේ ම අරමුණු ඉටුකර ගත හැකි ආකාරය පෙන්වා දෙයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- සෑම ආර්ථිකයක් ම පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීමට උත්සාහ දරන බව.
    - ක්‍රමික ආර්ථික වර්ධනය හා සංවර්ධනය
    - පූර්ණ සේවා නියුක්තිය
    - ආර්ථික ස්ථායිතාව
    - සාධාරණ ආදායම් ව්‍යාප්තිය
    - යහපත් අන්තර්ජාතික වෙළෙඳාම

  (එක් එක් අරමුණ වෙන වෙනම කෙටියෙන් පැහැදිලි කළ යුතු ය.)

- ව්‍යාපාර, රජයේ අරමුණු ඉටු කිරීමට පහත සඳහන් ආකාරවලින් දායක වන බව.
    - බදු ගෙවීම
    - දේශිය සම්පත් භාවිත කිරීම.
    - රජය ක්‍රියාත්මක කරන ප්‍රතිපත්ති පිළිපැදීම
    - නීතිරීති පිළිපැදීම
    - සේවා නියුක්තියට දායක වීම
    - පරිසර හානි අවම කිරීම.
- රජය ව්‍යාපාරවලට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ව්‍යාපාර දිරිමත් ව කටයුතු කරන බව හා ව්‍යාපාර සංවර්ධනය තුළින් රජයේ අරමුණු ඉටු කරගත හැකිවීම නිසා රජයත්, ව්‍යාපාරත් අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව වැදගත් වන බව.

**නිපුණතා මට්ටම 4.3** : රජයේ පිස්කල් ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- රජයේ පිස්කල් ප්‍රතිපත්තිය පැහැදිලි කරයි.
- රජයේ පිස්කල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව විස්තර කරයි.
- රජයේ ආදායම් හා වියදම් ව්‍යූහය රූපසටහනකින් දක්වයි.
- බදු වර්ග කොට එක් එක් වර්ගය නිදසුන් දක්වමින් පැහැදිලි කරයි.
- රජයේ බදු නොවන ආදායම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- ආසන්නම වසරේ අයවැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම විග්‍රහ කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- රාජ්‍ය ආදායම් හා වියදම් සම්බන්ධ කටයුතු පිස්කල් ප්‍රතිපත්තිය බව.
- පිස්කල් ප්‍රතිපත්තියේ අරමුණ, සාර්ව ආර්ථික ස්ථායිතාව ආරක්ෂා කර ගැනීම බව.
- යම් ආර්ථිකයක මුදල් වර්ෂයක් තුළ ලැබෙන ආදායම රාජ්‍ය ආදායම වන බව හා රජයක් එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ හා ආර්ථික වර්ධන කටයුතු සඳහා වර්ෂයක් තුළ දී දරනු ලබන්නා වූ මුළු වියදම රාජ්‍ය වියදම බව.
- රාජ්‍ය ආදායම් හා රාජ්‍ය වියදම් පහත දැක්වෙන ලෙස වර්ග කළ හැකි බව.




- යම් පුද්ගලයකු හෝ ආයතනයක් විසින් අනිවාර්යයෙන් ම ගෙවිය යුතු යයි රජය හෝ රජයේ බලාධිකාරී ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීම බද්දක් බව.
- පහත දැක්වෙන ආකාරයට බදු වර්ග කළ හැකි බව.




- අදාළ පුද්ගලයා හෝ ආයතනය විසින් ම ගෙවන බදු සෘජු බදු බව.
- ගෙවන ලද බද්ද වෙනත් කෙනෙකු වෙත විතැන් කළ හැකි බදු වක්‍ර බදු බව.
- රජයකට බදු ආදායම් මෙන් ම බදු නොවන ආදායම් ද ඇති බව.
- බදු නොවන ආදායම්වලට නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව.

  ***නිදසුන්:***
  - බලපත්‍ර ගාස්තු
  - දඩ මුදල්
  - මුද්දර ගාස්තු
- රාජ්‍ය සේවා අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා දරන වියදම් වර්තන වියදම් නැතහොත් පුනරාවර්තන වියදම් ලෙස හඳුන්වන බව.
- වර්තන වියදම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව.

  ***නිදසුන්:***
  - වැටුප් හා වේතන
  - පොලී ගෙවීම්
- දිගුකාලීන ආයෝජනය සඳහා රජය දරන වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙන් හඳුන්වන බව.
- ප්‍රාග්ධන වියදම් සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව.
  - මහා මාර්ග ඉදිකිරීම
  - පාලම් ඉදිකිරීම
- රජයේ පිස්කල් ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපාන ආකාරය පහත සඳහන් ආකාරයේ උදාහරණ මගින් පැහැදිලි කළ හැකි බව.
  - ව්‍යාපාරවලින් අය කරන බදු ආදායම රජය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා යෙදවීම.
  - ආනයන මත පනවන සමහර බදු නිසා දේශීය කර්මාන්ත/ නිෂ්පාදන ආරක්ෂාවීම.
  - නිෂ්පාදන මත විවිධ වර්ගයේ බදු පැනවීම නිසා භාණ්ඩ මිල ඉහළ යා හැකිවීම.
- ආසන්නම වසරේ රජයේ අයවැය යෝජනා සැලකිල්ලට ගෙන ඒවා ව්‍යාපාර කෙරෙහි ඇති කරන බලපෑම් පැහැදිලි කර දෙන්න.

**නිපුණතා මට්ටම 4.4** : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලට අනුකූල ව ව්‍යාපාර පවත්වාගෙන යාමේ වැදගත්කම අගය යි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය පැහැදිලි කරයි.
- රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණු විස්තර කරයි.
- රටක මූල්‍ය කටයුතු පාලනය සඳහා රජයකට අනුගමනය කළ හැකි උපායමාර්ග පෙන්වා දෙයි.
- රජය අනුගමනය කරන මූල්‍ය පාලන උපක්‍රම ව්‍යාපාරිකයන්ට බලපාන ආකාරය විග්‍රහ කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ආර්ථිකයේ මුදල් සැපයුම කෙරෙහි බලපෑම් ඇති කිරීම සඳහා රජය අනුගමනය කරනුයේ මූල්‍ය ප්‍රතිපත්තිය බව.
- රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන බව.
- රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වී ඇත්තේ දේශීය ආර්ථිකය තුළ මිල ස්ථායිතාව පවත්වා ගැනීම බව.
- මිල ස්ථායිතාව පවත්වා ගැනීම යනු, දීර්ඝ කාලයක් පුරා මිල මට්ටම ස්ථාවර මට්ටමක පවත්වාගෙන යාම බව.
- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් උපකරණ භාවිත කරන බව.
  - පොලී අනුපාතිකය
  - සංචිත අවශ්‍යතා වෙනස් කිරීම.
  - විවෘත වෙළෙඳපොළ කටයුතු
  - වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම
  - ණය සීමා පැනවීම

- මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විසින් භාවිත කරනු ලබන පොලී අනුපාතිකය "ප්‍රතිපත්ති පොලී අනුපාතිකය" ලෙස හඳුන්වන බව.
- පහත දැක්වෙන ආකාරයට ප්‍රතිපත්ති පොලී අනුපාත ප්‍රධාන වර්ග තුනක් පවතින බව.
  - ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය
  - ප්‍රතිවිකුණුම් අනුපාතිකය
  - බැංකු පොලී අනුපාතිකය

- ප්‍රතිමිලදී ගැනීම් අනුපාතය යනු වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් ඔවුන්ගේ අතිරික්ත අරමුදල් මහබැංකුවේ ඇති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේ දී ගෙවනු ලබන පොලී අනුපාතිකය බව.

- ප්‍රතිවිකුණුම් අනුපාතිකය යනු වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් රජයේ සුරැකුම්පත් ඇපයට තබා මහබැංකුවෙන් අරමුදල් ලබා ගැනීමේ දී අය කරනු ලබන පොලී අනුපාතිකය බව.

- බැංකු පොළී අනුපාතිකය යනු ද්‍රවශීලතා දුෂ්කරතාවලට මුහුණදෙන වාණිජ බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසාන ණය දෙන්නා වශයෙන් සපයනු ලබන ණය සඳහා අය කරනු ලබන පොළී අනුපාතිකය බව.
- වාණිජ බැංකු විසින් තම තැන්පතුවලට අදාළ ව මහබැංකුවේ පවත්වාගත යුතු මුදල් ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත බව. මෙම සංචිත අවශ්‍යතා වෙනස් කිරීම මගින් මහ බැංකුව ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කරනු ලබන බව.
- මහබැංකුව විසින් රජයේ සුරැකුම්පත් මිලට ගැනීමේ හා විකිණීමේ කටයුතු විවෘත වෙළෙඳපොළ කටයුතු බව.
- මහබැංකුව විසින් නිකුත් කරන සුරැකුම්පත් මිලදීගත් පාර්ශ්ව ඒවා කල්පිරීමට පෙර වාණිජ බැංකුවලට ඉදිරිපත් කර වට්ටම් කරවා ගැනීමේ දී අයකරන වට්ටම් අනුපාතිකය වෙනස් කිරීම තුළින් ආර්ථිකයේ මුදල් සැපයුම පාලනය කළ හැකි බව.
- ණය සීමා පැනවීම ප්‍රමාණාත්මක ස්වරූපයෙන් මෙන් ම ගුණාත්මක ස්වරූපයෙන් ද ක්‍රියාත්මක කළ හැකි බව.
- තෝරාගත් ක්ෂේත්‍ර සඳහා ලබාදෙන ණය සඳහා සීමා පැනවීම ගුණාත්මක ණය සීමා පැනවීම බව.
- ණය පිළිබඳ ප්‍රමාණාත්මක සීමා පහත ස්වරූපයන්ගෙන් ක්‍රියාත්මක වන බව.
  - වාණිජ බැංකු විසින් ලබදෙන ණය සඳහා උපරිම පරිණත කාලය නියම කිරීම.
  - අලුතින් නිකුත් කරන ණය සඳහා උපරිම සීමා පැනවීම හෝ ණය නිකුත් කිරීම නතර කිරීම.
  - වාණිජ බැංකුවල ප්‍රාග්ධනය හා වත්කම් අතර අවම අනුපාත නියම කිරීම.
  - ණයවර ලිපි නිකුත් කිරීමේ දී තැන්පත් කළ යුතු අවම මුදල් ප්‍රමාණ නියම කිරීම.

  (මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිත කරන උපකරණ පිළිබඳ ව සරල පැහැදිලි කිරීමක් ප්‍රමාණවත් වේ.)

- පහත නිදසුනෙන් දැක්වෙන ආකාරයට එක් එක් මූල්‍ය පාලන උපකරණ ව්‍යාපාරවලට බලපාන ආකාරය පැහැදිලි කළ හැකි බව.
  - වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගත යුතු සංචිත ප්‍රමාණය අඩු කළ විට වාණිජ බැංකුවලට ණය සැපයීම සඳහා වෙන් කළ හැකි මුදල් ප්‍රමාණය වැඩිවන නිසා ව්‍යාපාරිකයින්ට පහසුවෙන් ණය ලබා ගැනීමට හැකිවීම තුළින් ආයෝජන වැඩිවේ. ඒ තුළින් නිෂ්පාදනය වැඩිවී භාණ්ඩ මිල අඩුවේ. මිල අඩුවීම නිසා ව්‍යාපාරවල පිරිවැටුම වැඩි වී ලාභ වැඩිවන බව.

**නිපුණතා මට්ටම 4.5 :** පාරිභෝගික ආරක්ෂණය සඳහා රජය ගන්නා ක්‍රියාමාර්ගවලට අනුකූලවෙමින් ව්‍යාපාර පවත්වාගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

## ඉගෙනුම් ඵල

- පාරිභෝගික ආරක්ෂණ සංකල්පය පැහැදිලි කරයි.
- පාරිභෝගික ආරක්ෂණය කාලීනව වඩා වැදගත්වීමට හේතු දක්වයි.
- පාරිභෝගික ආරක්ෂණයෙන් පාරිභෝගිකයාට හා ව්‍යාපාරිකයාට ඇති වන වාසි වෙන වෙනම ලැයිස්තු ගත කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් මෙන්ම පාරිභෝගික වගකීම් ද ඇති බව පෙන්වා දෙයි.
- තාර්කික පාරිභෝගිකයකුගේ හැසිරීම විස්තර කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වන සිසුන් දෙදෙනෙකු ලවා පහත දැක්වෙන භූමිකා රංගනය පන්තියට ඉදිරිපත් කරවන්න.

**භූමිකා රංගනය**

පාරිභෝගිකයා : මුදලාලි මට බිස්කට් පැකට් එකක් දෙන්න.

වෙළෙන්දා : ආ.. මෙන්න. රුපියල් 65/-ක් දෙන්න.

පාරිභෝගිකයා : (පැකට්ටුව හොඳින් පරීක්ෂා කර බලා) මුදලාලි මේ බිස්කට් පැකට් එකේ කාලය ඉකුත් වෙලානෙ.

වෙළෙන්දා : (පරීක්ෂා කර බලා) ආ ඇත්තද .....කෝ දෙන්න. මං වෙන එකක් දෙන්නම්. (වෙන එකක් දෙයි.)

පාරිභෝගිකයා : (එහි මිල පරීක්ෂා කර බලා) මුදලිලා මේ බිස්කට් පැකට් එකේ මිල වෙනස් කරලානෙ. උඩින් වෙනත් මිලක් අළවලානේ.

වෙළෙන්දා : ඒවා අපි වෙනස් කරපුවා නෙවෙයි. කොම්පැනියෙන්ම වෙනස් කරලා තිබුණේ. කමක් නැහැ මම ඒකට වෙන එකක් දෙන්නම්

පාරිභෝගිකයා : මිල වෙනස් කරපුවා මට එපා. මෙන්න මුදලාලි බිස්කට් පැකට් එක. මම යනවා.

- භූමිකා රංගනය තුළින් මතුවන වෙළෙඳ විෂමාචාර පිළිබඳ විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පාරිභෝගිකයින්ට වෙළෙඳපොළේදී නොයෙකුත් වෙළෙඳ විෂමාචාරවලට මුහුණදීමට සිදුවන බව.

- දැනුවත්කමින් යුතු තාර්කික පාරිභෝගිකයා වෙළෙඳපොළේ දී වෙළෙඳ විෂමාචාරවලින් ආරක්ෂා වන බව.
- වෙළෙඳ විෂමාචාරවලින් වැළකීම හොඳ ව්‍යාපාරික ගුණාංගයක් මෙන් ම එය ව්‍යාපාරයේ සාර්ථකත්වයට ද හේතු වන බව.

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත දැක්වෙන්නේ පාරිභෝගික අයිතිවාසිකම් යුගල කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අයිතිවාසිකම් යුගලය කෙරෙහි අවධානය යොමු කරන්න.
  - ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය - තොරතුරු දැන ගැනීමේ අයිතිය
  - තෝරා ගැනීමේ අයිතිය - සවන් යොමුකරවා ගැනීමේ අයිතිය
  - මූලික අවශ්‍යතා සපුරා ගැනීමේ අයිතිය- වන්දි ලබා ගැනීමේ අයිතිය
  - පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය - සෞඛ්‍ය සම්පන්න පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය

- ඔබට ලබුණු පාරිභෝගික අයිතිවාසිකම් යුගලය පැහැදිලි කරන්න.
- එවැනි අයිතිවාසිකම් ස්ථාපිත කිරීමට හේතු ලෙස ඔබ දකින දෑ පැහැදිලි කරන්න.
- ඔබට ලැබුණු අයිතිවාසිකම් යුගලය නිසා පාරිභෝගික ආරක්ෂාව සැලසෙන ආකාරය පැහැදිලි කරන්න.
- ඔබට ලැබුණු අයිතිවාසිකම් යුගලය රැක ගැනීම සඳහා ඔබගෙන් ඉටුවිය යුතු යුතුකම් පෙන්වා දෙන්න.
- එම යුතුකම් ඉටුකිරීම තුළින් ඔබට ලැබුණු අයිතිවාසිකම් ආරක්ෂා වන ආකාරය විස්තර කරන්න.
- පාරිභෝගික අයිතිවාසිකම් හා යුතුකම් පිළිබඳ ව සැලකිලිමත්වීමෙන් ව්‍යාපාරිකයෙකුට අත්කර ගත හැකි වාසි පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබාදීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය පාරිභෝගික ආරක්ෂණය බව.
- මෑත කාලයේ පාරිභෝගික ආරක්ෂාවේ අවශ්‍යතාව වැඩිවීමට බලපෑ ඇති හේතු කිහිපයක් පහත දැක්වෙන බව.
  - වෙළෙඳපොළ සංකීර්ණවීම.
  - තරගකාරී බව
  - නිදහස් වෙළෙඳාම
  - ගෝලීයකරණය

- පාරිභෝගිකයන්ට පහත සඳහන් හේතු නිසා පාරිභෝගික ආරක්ෂණය වැදගත් වන බව.
    - ගෙවන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන, භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම.
    - වෙළෙඳ විෂමාචාරවලට එරෙහිව නීතිමය ආවරණය ලබා ගත හැකිවීම.
    - පාරිභෝගික සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරුවීම

  යනාදිය.

- ව්‍යාපාරිකයින්ට පහත සඳහන් හේතු නිසා පාරිභෝගික ආරක්ෂණය වැදගත් වන බව.
    - ගුණත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම නිසා පාරිභෝගික විශ්වාසය දිනා ගත හැකිවීම.
    - පිරිවැටුම වැඩිවීම තුළින් ලබන ලාභය වැඩිවීම.
    - ප්‍රමිතියකට අනුව නිෂ්පාදනය කරන නිසා පිරිවැය අඩුවීම

  යනාදිය.

- ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයෙකු වූ ජෝන් එෆ් කෙනඩි විසින් පහත සඳහන් පරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කරන ලද බව.
    - ආරක්ෂාව සලසා ගැනීමේ අයිතිය.
    - තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය
    - තෝරා ගැනීමට ඇති අයිතිය
    - සවන් යොමු කරවා ගැනීමට ඇති අයිතිය

- මීට අමතර ව අන්තර්ජාතික පාරිභෝගික සමිති සම්මේලනය විසින් පහත සඳහන් පාරිභෝගික අයිතිවාසිකම් ප්‍රකාශයට පත් කරන ඇති බව.
    - මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ඇති අයිතිය.
    - වන්දි ලබා ගැනීමට ඇති අයිතිය
    - පාරිභෝගික අධ්‍යාපනයට ඇති අයිතිය
    - සෞඛ්‍යය සම්පන්න  පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය
- ඉහත දැක්වූ අයිතිවාසිකම් අට අන්තර්ජාතික වශයෙන් පිළිගත් පාරිභෝගික අයිතිවාසිකම් බව.
- පහත සඳහන් වගකීම් පාරිභෝගිකයන් සතු බව.
    - විචාරාත්මක දැනුවත්භාවය
    - සක්‍රීය සහභාගිත්වය
    - සමාජය ගැන සැලකිලිමත් වීම
    - පරිසරය පිළිබඳ සැලකිලිමත් වීම
    - සහයෝගීතාව

**නිපුණතා මට්ටම 4.6 :** පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතනවල කාර්යභාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

## ඉගෙනුම් ඵල

- ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන ලැයිස්තු ගත කරයි.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අරමුණු හා කාර්යභාරය විස්තර කරයි.
- වෙළෙඳාම විධිමත් කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ බලතල හා ඒවායේ වැදගත්කම පහදයි.
- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අරමුණු හා කාර්ය විස්තර කරයි.
- පාරිභෝගික අයිතිවාසිකම් කඩවීමක් සම්බන්ධ ව පැමිණිලි කළ යුතු ආයතන පෙන්වා දෙයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා පිහිටුවා ඇති බව.
  - පාරිභෝගිකයින්ගේ ජීවිත හා දේපළවලට උපද්‍රවයක් සිදුවන භාණ්ඩ අලෙවිය හා සේවා සැපයීමට එරෙහිව ඔවුන් ආරක්ෂා කිරීම.
  - අසාධාරණ වෙළෙඳ පිළිවෙත්වලට විරුද්ධව පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සහ පාරිභෝගිකයන්ගේ අයිතිවාසිකම්වලට නිසි සැලකිල්ල දැක්වීමට සහතික වීම.
  - හැකි සෑමවිටම පාරිභෝගිකයන්ට තරගකාරි මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම.
  - අසාධාරණ වෙළෙඳ පිළිවෙත්, සීමිත වෙළෙඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදු කරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයක් ලබාදීම.
- පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ කාර්ය සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වෙන බව.

  ***නිදසුන්:***
  - ව්‍යවසායන් අතර සීමාකාරී ගිවිසුම් පාලනය කිරීම හෝ ඉවත් කිරීම.
  - වෙළෙඳපොළ ඇතුළත හෝ වෙළෙඳපොළේ සැලකිය යුතු කොටසක දේශීය වෙළෙඳාමේ හෝ ආර්ථික සංවර්ධනය පිළිබඳ ආධිපත්‍ය තත්ත්වයක් අනිසි ලෙස යොදා ගැනීම නැති කිරීම.
  - දේශීය හෝ ජාත්‍යන්තර වෙළෙඳාමට හෝ ආර්ථික සංවර්ධනයට අහිතකර ලෙස බලපාන තරගකාරීත්වය පිළිබඳ අවහිරතා නැති කිරීම.
  - තරග විරෝධී චර්යා හා ආධිපත්‍යය තත්ත්ව අනිසි ලෙස යොදා ගැනීම පිළිබඳ විමර්ශන හෝ පරීක්ෂා කිරීම.
  - භාණ්ඩ හා සේවා සපයන තැනැත්තන් අතර ඵලදායී තරගකාරීත්වය පවත්වා ගැනීම හා ප්‍රවර්ධනය කිරීම.

  - භාණ්ඩ හා සේවාවල මිල, ඒවා ලබා ගැනීමට හැකිවීම සහ ඒවායෙහි තත්ත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ අයිතිවාසිකම් සහ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරිම හා ආරක්ෂා කිරීම.
- වෙළෙඳාම විධිමත් කිරිම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතුව ඇති බලතල කිහිපයක් පහත දැක්වෙන බව.
  - ඕනෑම භාණ්ඩයක මිල ලකුණු කිරීම, ලේබල් කිරීම, ඇසිරීම, විකිණීම හෝ නිෂ්පාදනය කිරීම සම්බන්ධව නිෂ්පාදකයන්ගෙන් හා වෙළෙඳුන්ගෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා අධිකාරියට සුදුසු පරිදි කටයුතු කළ හැකි වේ.
  - පාරිභෝගික ආරක්ෂාව සඳහා බලපාන  කරුණු සම්බන්ධ ව නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම. ගබඩා කිරීම, විකිණීම සහ තොග තබා ගැනීම සම්බන්ධ ව නිෂ්පාදකයන්ට හා වෙළෙඳුන්ට විශේෂ නියෝග නිකුත් කිරීම අධිකාරියට හැකිවේ.
  - අධිකාරිය විසින් ඉහත සඳහන් පරිදි නිකුත් කරනු ලබන විධානයන්ට අනුකූල ව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.
  - භාණ්ඩ හා සේවාවල ප්‍රමිතිය පිළිබඳ ව පාරිභෝගිකයින්ගේ ආරක්ෂාව සඳහා යම් විධාන අධිකාරිය විසින් නිකුත් කළ හැකි ය.
  - අධිකාරිය විසින් නියම කර ඇති ප්‍රමිතියට අනුව නිෂ්පාදනය, සැපයීම, ගබඩා කිරීම, ප්‍රවාහනය සහ විකිණීම නොකරන වෙළෙන්දන්ට එරෙහි ව පාරිභෝගිකයන් විසින් අධිකාරියට පැමිණිලි කළ හැකි ය. එවැනි භාණ්ඩ හෝ සේවා සපයන්නන්ට/වෙළෙන්දන්ට එරෙහිව විකිණීම හෝ සැපයීම සිදුකර මාස තුනක් ඇතුළත් ලිඛිත ව අධිකාරියට ඉදිරිපත් කළ යුතු ය.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාත්මක වන බව.
  - නිෂ්පාදන ක්‍රියාවලිය හා සැකසීම පිළිබඳ ව ජාතික හා අන්තර්ජාතික පදනම මත ප්‍රමිති පිළියෙල කිරීම.
  - කාර්මික හා වාණිජ  ක්ෂේත්‍රවල ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලනය ප්‍රවර්ධනය කිරීම. ඒ සඳහා රසායනාගාර හා පුස්තකාල සේවා පිහිටුවා පවත්වාගෙන යාම.
  - දේශීය නිෂ්පාදිත මෙන් ම ආනයනය කරන ලද භාණ්ඩ ප්‍රමිතිවලට අනුකූල ද යන්න පරීක්ෂා කිරීම.
  - ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලන කටයුතු සඳහා පර්යේෂණ පහසුකම් සැපයීම.
  - ප්‍රමිති සහතික සලකුණු ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.
  - ජාත්‍යන්තර ප්‍රමිති ආයතන හා ඒ සමාන කටයුතුවල යෙදෙන සංවිධාන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.
  - අධ්‍යාපනය, උපදේශනය හා වෙනත්  මාර්ගවලින් ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන කටයුතු දිරිගැන්වීම.

- ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පහත දක්වෙන කාර්ය ඉටුකරන බව.
  - ප්‍රමිති පිළියෙල කිරීම.
  - ප්‍රමිති ක්‍රියාත්මක කිරිම.
    - ස්වෙච්ඡාවෙන්
    - SLS සහතික ලාංඡන ක්‍රමය මගින්
    - පූර්ව අපනයන පරීක්ෂාව මගින්
    - ආනයන පරීක්ෂාව මගින්
    - අපනයනය සඳහා පිළියෙල කළ මුහුදු ආහාර පරීක්ෂාව මගින්
  - ISO ප්‍රමිති ක්‍රියාත්මක කිරීම
  - ප්‍රමිතිකරණය හා තත්ත්ව පාලනය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.
  - ප්‍රමිතිකරණය සහ තත්ත්ව පාලන ප්‍රවර්ධන කටයුතු
  - උපකරණ ක්‍රමාංකන සේවා
  - පාරිභෝගික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම
  - පුස්තකාල සේවාව, දේශීය විදේශීය ප්‍රමිති අලෙවිය සහ තොරතුරු සේවා
  - තත්ත්ව පද්ධති පිළිබඳ අන්තර්ජාතික ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම

**නිපුණතාව 5.0** : විධිමත්ව ව්‍යාපාර ආරම්භ කිරීමටත්, පවත්වා ගෙන යාමටත් ව්‍යාපාර සංවිධාන අවශ්‍ය බව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 5.1** : ව්‍යාපාර සංවිධාන හිමිකාරත්වය මත වර්ග කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- සංවිධානයක් යන්න හඳුන්වා නිදසුන් දක්වයි.
- විධිමත් සංවිධානයක දැකිය හැකි ලක්ෂණ ලැයිස්තු ගත කරයි.
- ව්‍යාපාර සංවිධාන හිමිකාරත්වය මත වර්ග කරයි.
- පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තු ගත කරයි.
- පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධාන ලැයිස්තු ගත කරයි.
- සියලු ම ව්‍යාපාර සංවිධාන සැලකිල්ලට ගෙන හිමිකාරත්වය මත වර්ග කොට රූපසටහනකින් ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශි වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සමාජ ඒකකය සංවිධානයක් බව.
- ලාභ ඉපයීම හෝ සමාජ සුභසාධනය අරමුණු කරගෙන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම හා බෙදාහැරීමේ නිරත ආයතන ව්‍යාපාර සංවිධාන බව.
- විධිමත් සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
  ***නිදසුන්:*** අරමුණක් තිබීම, සංවිධාන ව්‍යුහයක් පැවතීම, පුද්ගලයන් සිටීම.

- හිමිකාරත්වය මත පෞද්ගලික අංශයේ ව්‍යාපාර හා රාජ්‍ය අංශයේ ව්‍යාපාර වශයෙන් ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කළ හැකි බව.
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය පහත පරිදි ගැලීම් සටහනකින් ඉදිරිපත් කළ හැකි බව.

**ව්‍යාපාර සංවිධාන**

- පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන
  - කේවල ස්වාමි ව්‍යාපාර
  - හවුල් ව්‍යාපාර
  - සංස්ථාපිත සමාගම්
  - සමුපකාර
  - වරලත් ව්‍යාපාර
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන
  - දෙපාර්තමේන්තු
  - රාජ්‍ය සංස්ථා
  - ප්‍රාදේශීය අධිකාර යටතේ පවතින ව්‍යාපාර
  - රාජ්‍ය සමාගම්

**නිපුණතා මට්ටම 5.2** : කේවල ස්වාමි ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා අවාසි තුලනාත්මක ව සසඳයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- කේවල ස්වාමි ව්‍යාපාර හඳුන්වයි.
- තෝරාගත් කේවල ස්වාමි ව්‍යාපාරයක සුවිශේෂ ලක්ෂණ විස්තර කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරවල වාසි හා අවාසි සන්සන්දනය කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී බලපාන නීතිරීති පැහැදිලි කරයි.
- තෝරාගත් කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරිමේ දී අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය විස්තර කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- හිමිකාරත්වය තනි පුද්ගලයකු සතුවන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර බව.
- පහත සඳහන් විශේෂ ලක්ෂණ කේවල ස්වාමි ව්‍යාපාරවල දැකිය හැකි බව.
  - කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් වීම.
  - අයිතිකරුගේ අසීමිත වගකීම.
  - ව්‍යාපාරයට නෛතික පුද්ගලභාවයක් නොමැතිවීම.
  - ලියාපදිංචිය අනිවර්ය නොවීම.
  - ලාභ හෝ අලාභ තනිව භුක්ති විඳීම.
  - අවදානමට තනිව මුහුණ දීම.
  - අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම.
  - ගිණුම් තැබීම අනිවාර්ය නොවීම.
  - ව්‍යාපාරය නමින් බදු ගෙවීමක් සිදු නොවන අතර ව්‍යාපාරයේ ආදායම මත අයිතිකරුගේ නමින් බදු ගෙවිය යුතුවීම.

- කේවල ස්වාමි ව්‍යාපාරවල දැකිය හැකි වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - පහසුවෙන් ආරම්භ කළ හැකිවීම.
  - සියලු ලාභ අයිතිකරු සතුවීම.
  - ස්වාධීන තීරණ ගත හැකිවීම.
  - බලපවත්වනු ලබන නීතිරීති හා රෙගුලාසි අවම වීම.
  - ව්‍යාපාරික තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා වීම.
  - ව්‍යාපාරය විසුරුවා හැරීම පහසුවීම.

- කේවල ස්වාමි ව්‍යාපාරවල දක්නට ඇති අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - අයිතිකරුගේ අසීමිත වගකීම
  - ප්‍රාග්ධනය සපයා ගැනීමේ දී දුෂ්කරතා මතුවීම.
  - අයිතිකරු විසින් ම තීරණ ගනු ලබන නිසා ඒවා අසාර්ථක විය හැකිවීම.
  - අඛණ්ඩ පැවත්මක් නොමැතිවීම.

- කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥා පනත යටතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කර්යාලයේ ලියාපදිංචි කළ යුතු බව.
- එසේ ලියාපදිංචි කරන්නේ නම් පහත ක්‍රියාපටිපාටිය අනුගමනය කළ යුතු බව.
  - ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම.
    - තනි පුද්ගල ව්‍යාපාර නාමයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය.
    - ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම සඳහා වූ ග්‍රාම නිලධාරී වාර්තාව
  - ග්‍රාම නිලධාරී සහතික කළ වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාළ ගාස්තුව ද සමඟ ප්‍රාදේශීය ලේකම් වෙත භාරදීම.
  - ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතිකය නිකුත් කිරීම.

**නිපුණතා මට්ටම 5.3** : හවුල් ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් එම ව්‍යාපාර සංවිධානවල වාසි හා අවාසි තුලනාත්මක ව සසඳයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- හවුල් ආඥාපනතේ සඳහන් පරිදි හවුල් ව්‍යාපාර අර්ථ දක්වයි.
- හවුල් ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ මතුකර දක්වයි.
- හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ ලැයිස්තුගත කරයි.
- හවුල් ව්‍යාපාරයක් ලියපාදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය පැහැදිලි කරයි.
- හවුල් ව්‍යාපාරවල පවත්නා වාසි හා අවාසි පැහැදිලි කරයි.
- කේවල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් තුලනාත්මක ව සසඳයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- හවුල් ව්‍යාපාර ආඥා පනතේ හවුල් ව්‍යාපාරයක් පහත පරිදි නිර්වචනය කර ඇති බව.
  - ලාභ ඉපයීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයන් අතර පවත්නා සම්බන්ධතාව හවුල් ව්‍යාපාරයක් බව.
- හවුල් ව්‍යාපාරයකට සුවිශේෂී වූ ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
  - හවුල්කරුවන් අවම වශයෙන් දෙදෙනෙකු සිටිය යුතු අතර, උපරිමය විස්සකට සීමාවීම.
  - හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතුවීම.
  - කිසියම් ව්‍යාපාරයක් පැවතීම.
  - ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් එකඟතාවක් දැකිය හැකිවීම
  - සෑම හවුල්කරුවකුම තමාගේ සහ සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියෙකු වශයෙන් සැලකීම.
- හවුල් ව්‍යාපරයක වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - පහසුවෙන් ආරම්භ කළ හැකිවීම
  - වැඩි ප්‍රාග්ධනයක් රැස් කර ගත හැකිවීම.
  - කීපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශි කරගත හැකිවීම.
  - වගකීම කිහිපදෙනෙකු අතර බෙදීයාම.
- හවුල් ව්‍යාපාරයක අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - හවුල්කරුවන්ගේ වගකීම අසීමිතවීම.
  - හවුල්කරුවන් අතර ඇති විය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකර ලෙස බලපෑම.
  - අඛණ්ඩ පැවැත්මක් නොමැතිවීම.
- හවුල් ව්‍යාපාරය එහි සියලුම හවුල්කරුවන්ගේ නම්වලින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම්, එය 1918 අංක 6 දරන ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචි කළ යුතු බව.
- හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ දී අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට සමාන බව.

**නිපුණතා මට්ටම 5.4** : හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම සඳහා හවුල් ඔප්පුවක ඇති අවශ්‍යතාව තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- හවුල් ගිවිසුමක් යනු කුමක්දැයි පැහැදිලි කරයි.
- හවුල් ගිවිසුමක් ඇති විය හැකි ආකාර විස්තර කරයි.
- හවුල් ඔප්පුවක වැදගත්කම අගයයි.
- හවුල් ඔප්පුවක සාමාන්‍යයෙන් ඇතුළත් වන කරුණු අනාවරණය කරයි.
- 1890 හවුල් ආඥාපනතේ 24 වන වගන්තියේ ඇතුළත් කරුණු විග්‍රහ කරයි.
- හවුල්කරුවන්ගේ යුතුකම් හා අයිතිවාසිකම් ලැයිස්තුගත කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- පන්තිය පිරිසිදු කිරීම සඳහා සිසුන් කණ්ඩායම් වශයෙන් බෙදා දැක්වෙන සටහන පෙන්වා, එය ලිඛිතව පවත්වාගෙන යාමට හේතු සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පන්තිය පිරිසිදු කිරීම සිසුන් අතර ඇගවීමකින් හෝ වාචිකව සිසුන් නම් කිරීමෙන් කළ හැකි වුවද එහිදී ගැටලු මතු විය හැකි බව.
  - නමුත් ලිඛිතව නාමලේඛනයක් පැවතීමෙන් මතුවිය හැකි ගැටලු අවම වන බව.
  - හවුල් ව්‍යාපාරයක් ද ඇගවීමෙන් වාචිකව හෝ ලිඛිතව ආරම්භ කළ හැකි බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් වන්නේ හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර එකඟත්වයක් ඇති කර ගත යුතු කාරණා යුගල තුනකි. එවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන යුගලය කෙරෙහි අවදානය යොමු කරන්න.
  - ප්‍රාග්ධනය යෙදවීම - ලාභාලාභ බෙදා ගැනීම.
  - ව්‍යාපාරයේ කටයුතු ඉටු කිරීම - පෞද්ගලික ප්‍රයෝජනයට භාණ්ඩ හා මුදල් ගැනීම.
  - ප්‍රාග්ධනයට අමතරව ව්‍යාපාරයට ණය ලබාදීම. - නව හවුල්කරුවෙකු බඳවා ගැනීම.

- ඔබ කණ්ඩායම හවුල් ව්‍යාපාරයක් කරගෙන යන හවුල්කරුවන් යැයි උපකල්පනය කරන්න.
- අදාළ කාරණා සම්බන්ධයෙන් ඔබ කණ්ඩායම විසින් ඇති කර ගනු ලබන එකඟතා සියලු ම සාමාජිකයන්ගේ එකඟත්වය මත තීරණය කරන්න.
- ඔබ කණ්ඩායමට ලැබුණු එකඟතා යුගලයට අමතරව තවදුරටත් එකඟත්වයක් ඇති කරගත යුතු කරුණු පෙළගස්වන්න.
- එම කාරණා සම්බන්ධයෙන් ඔබ කණ්ඩායම ඇති කර ගනු ලබන එකඟතා කණ්ඩායමේ සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- ඔබ කණ්ඩායම විසින් ඇති කරගනු ලබන එකඟතා පවත්වා ගැනීම වඩාත් යෝග්‍ය වන්නේ ඇගවීමෙන් ද, වාචිකව ද, ලිඛිතව ද යන්න හේතු සහිත ව පැහැදිලි කරන්න.

- හවුල් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු කර ගැනීමට එක් එක් සාමාජිකයා සතු වගකීම් පැහැදිලි කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- හවුල්කරුවන් අතර ඇති කර ගනු ලබන  එකඟතා ඇතුළත් ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව බව.
- ලිඛිත ගිවිසුමක් නොමැති විටක 1890 හවුල් ආඥාපනතේ 24 වන වගන්තියේ සඳහන් කරුණු බලපාන බව.
  - හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමාන ව බෙදා ගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමාන ව බෙදා ගැනීමට හවුල්කරුවන්ට හිමිකමක් ඇත.
  - ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පෞද්ගලික ව දරන ලද වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ගෙවිය යුතුය.
  - ගිවිසගත් ප්‍රාග්ධනයට අමතර ව හවුල්කරුවන් විසින්  සපයා ඇති මුදල් සඳහා 5%ක වාර්ෂික පොළියක් හිමිවේ.
  - ප්‍රාග්ධනය වෙනුවෙන් පොළියක් කිසිම හවුල්කරුවකුට හිමි නොවේ.
  - ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සහභාගිවීමට සෑම හවුල්කරුවෙකුටම පුළුවන.
  - කිසිම හවුල්කරුවෙකුට  තම සේවය වෙනුවෙන් වේතනයක් හවුල් ව්‍යාපාරයෙන් ලැබිය නොහැකි ය.
  - සියලු ම හවුල්කරුවන්ගේ කැමැත්ත නැතිව නව හවුල්කරුවෙකු බඳවා ගත නොහැකි ය.
  - හවුල් ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් පැන නගින සාමාන්‍ය ගැටලුවක දී හවුල්කරුවන්ගේ වැඩි ඡන්දයෙන් තීරණයක් ගත හැකි අතර, හවුල් ව්‍යාපාර කටයුතුවල ස්වභාවය වෙනස් කෙරෙන කිසිවක් සියලුම හවුල්කරුවන්ගේ කැමැත්තෙන් තොරව කළ නොහැකි ය.
  - හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත් ප්‍රධාන  කාර්යාලයේ තැබිය යුතු අතර, ඕනෑම අවස්ථාවක ඒවා පරීක්ෂා කිරීමට, පිටපත් කර ගැනීමට සියලු ම  හවුල්කරුවන්ට අවසර තිබිය යුතු ය.
- හවුල්කරුවන්ගේ අයිතිවාසිකම් කිහිපයක් පහත දැක්වෙන බව.
  - ව්‍යපාරයේ කටයුතුවලට සහභාගිවීමට ඇති අයිතිය
  - ව්‍යාපාරය උපයන ලාභයට දායකවීමට ඇති අයිතිය.
  - යෙදූ ප්‍රාග්ධනයට පොළී ලබා ගැනීමට ඇති අයිතිය.
  - සපයන ණය අත්තිකාරම් සඳහා පොළී ලබා ගැනීමට ඇති අයිතිය.
  - ගිණුම් පොත් පරීක්ෂා කිරීමට ඇති අයිතිය.
- හවුල්කරුවන් විසින් ඉටු කළ යුතු යුතුකම් කිහිපයක් පහත දැක්වෙන බව.
  - ව්‍යාපාර කටයුතුවලට උනන්දුවෙන් සහභාගිවීම.
  - පෞද්ගලික ලාභ නොලැබීම.
  - අලාභ සඳහා දායකවීම.
  - තරගකාරී ව්‍යාපාරවල නොයෙදීම.

( 5.5 හා 5.6 නිපුණතා මට්ටම්වල සඳහන් සමුපකාර ව්‍යාපාර පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර 5.7, 5.8 හා 5.9 නිපුණතා මට්ටම්වලට අදාළ සංස්ථාපිත සමාගම් හා වරලත් ව්‍යාපාර සාකච්ඡා කිරීම කළ යුතු වේ.)

**නිපුණතා මට්ටම 5.5** : සංස්ථාපිත සමාගම්වල සුවිශේෂ ලක්ෂණ විමසයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- සංස්ථාපිත සමාගම් අර්ථ දක්වයි.
- සංස්ථාපිත සමාගම්වල සුවිශේෂී ලක්ෂණ විස්තර කරයි.
- සමාගම්වල වාසි හා අවාසි විග්‍රහ කරයි.
- සමාගමක් සංස්ථාපනය කිරිමට අදාළ ක්‍රියාමාර්ග පැහැදිලි කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද පුද්ගලයන්ගේ එකතුවක් සමාගමක් ලෙස හැඳින්විය හැකි බව.
- සංස්ථාපිත සමාගම්වල දැකිය හැකි පොදු ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
    - සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ආයතනයක් වීම.
    - සමාගමක් එහි සාමාජිකත්වයෙන් වෙන් වූ නීතිමය ඒකකයක් වීම.
    - අඛණ්ඩ පැවත්මක් තිබීම
    - අයිතිකරුවන්ගේ වගකීම සීමා සහිත වීම.
    - කළමනාකරණය, අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුවීම.
- සමාගම් සම්බන්ධව දැකිය හැකි වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - විශාල ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකිවීම.
    - මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකිවීම.
    - දක්ෂ කළමනාකරුවන් බඳවාගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකිවීම.
    - කොටස්කරුවන්ගේ වගකීම සීමාසහිත වීම නිසා ආයෝජකයන් ආකර්ශනය කර ගත හැකිවීම.
    - කොටස්කරුවකුගේ මරණය හෝ ඉවත්වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නොවීම.
    - කොටස් පැවරිය හැකිවීම.
    - ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශි කර ගත හැකිවීම.

- සමාගම්වල දැකිය හැකි අවාසි කිහිපයක් පහත දක්වෙන බව.
    - නීතිමය බලපෑම් දැඩිවීම.
    - ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතුවීම හා ඒ සඳහා පිරිවැයක් දැරිය යුතුවීම.
    - කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවීම නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නොවීම.
    - සමාගමේ ලාභය මත මෙන්ම කොටස්කරුවන්ට හිමිවන ලාභාංශ මත ද බදු ගෙවීමට සිදුවීම.
- සමාගමක් ලියාපදිංචි කිරීම අදාළ රටේ සමාගම් පනතට අනුව කළ යුතු බව. ශ්‍රී ලංකාවේ සමාගමක් සංස්ථාපනය කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතට අනුව කළ යුතු බව.
- ඒ අනුව සමාගමක් සංස්ථාපනය කිරීමේ දී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත පහත ලියවිලි ඉදිරිපත් කළ යුතු බව.
    - සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය
    - සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය
    - සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියාකිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය
    - සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියාකිරීමට කැමති බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශයක්

**නිපුණතා මට්ටම 5.6** : විවිධ වර්ගයේ සමාගම්වල සුවිශේෂ ලක්ෂණ සන්සන්දනය කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- සංස්ථාපිත සමාගම් වර්ග කරයි.
- සංස්ථාපිත සමාගම් වර්ග සැසඳීමේ නිර්ණායක පැහැදිලි කරයි.
- හඳුනාගත් නිර්ණායක පදනම් කරගෙන සංස්ථාපිත සමාගම් වර්ග සන්සන්දනය කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුව පහත දැක්වෙන සමාගම් වර්ග සංස්ථාගත කළ හැකි බව.
  - සීමාසහිත සමාගම්
    - සීමාසහිත පුද්ගලික සමාගම්
    - සීමාසහිත පොදු සමාගම්
      - මිල ලැයිස්තුගත සමාගම්
      - මිල ලැයිස්තුගත නොවූ සමාගම්
    - සිමාසහිත අක්වෙරළ සමාගම්
  - සීමාරහිත සමාගම්
  - ඇපයෙන් සීමිත සමාගම්
  - විදේශීය සමාගම්

- එකිනෙක සමාගම් වර්ග සැසඳීමේ දී පහත දැක්වෙන නිර්ණායක යොදාගන්නා බව.
  - සාමාජික සංඛ්‍යාව
  - වගකීම
  - ප්‍රාග්ධන සම්පාදනය
    - කොටස්
    - ණයකර
  - කළමනාකරණය

- කොටස්කරුවන් මිලදීගත් කොටස් වෙනුවෙන් ගෙවූ හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සිමාවන සමාගම්, සීමාසහිත සමාගම් වන බව. මේවා කොටසින් සීමාසහිත සමාගම් ලෙස ද හැඳින්වෙන බව.
- සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
  - අවම සාමාජික සංඛ්‍යාව 01ක් වන අතර, උපරිම සාමාජික සංඛ්‍යාව 50ක් වීම. මෙම උපරිම ප්‍රමාණයට සමාගමේ සේවකයින් වන කොටස්කරුවන් අයත් නොවේ.
  - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 01කි. උපරිමය පිළිබඳ සීමාවක් නැත.
  - සමාගමේ කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කිරීම තහනම් වීම.
  - ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව සියලු ම කොටස්කරුවන්ගේ කැමත්ත මත ලාභාංශ බෙදාහැරිය හැකිවීම.

- සීමාසහිත පොදු සමාගමක ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
    - අවම සාමාජික සංඛ්‍යාව 01ක් වීම හා උපරිමය පිළිබඳ සීමාවක් නොමැති වීම.
    - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව දෙදෙනෙකු වීම, උපරිමය පිළිබඳ සීමාවක් නොමැතිවීම.
    - කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකිවීම.
    - කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතුවීම.
- කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත වූ පොදු සමාගම්, මිල කළ (ලැයිස්තුගත) පොදු සමාගම් ලෙස හැඳින්වෙන අතර එසේ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොවූ සමාගම් මිල ලැයිස්තුගත නොවූ සමාගම් ලෙස හැඳින්වෙන බව.
- ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් අක්වෙරළ සමාගමක් ලෙස හඳුන්වන බව.
- විදේශයක දී සංස්ථාගත සමාගමක් වුවද නැවත ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කිරීමට ඉල්ලීමක් කර ලියාපදිංචි කරනු ලැබූ සමාගමක් නම් හා ව්‍යාපාර කටයුතු විදේශයක දී පමණක් කිරීම කරන්නේ නම් ඒවා ද අක්වෙරළ සමාගම් ලෙස සලකන බව.
- කොටස් කරුවන්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස් ප්‍රමාණයට සීමා නොවන සමාගම්, සීමාරහිත සමාගම් බව.
- ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
    - කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
    - සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමක දී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතුවීම.
    - අවම වශයෙන් සාමාජිකයන් දෙදෙනෙකුවත් සිටිය යුතුවීම. උපරිමය පිළිබඳ සීමාවක් නොවීම.
    - පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම.
    - සමාගමේ ලාභ බෙදාහැරීමක් නොකිරීම.
- ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් පිහිටුවා ඇති නමුත් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කර ඇති සමාගමක් විදේශීය සමාගමක් බව.
- විදේශීය සමාගමක් ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ස්ථාපිත කර මසක් තුළදී සමාගම පිළිබඳ විස්තරයක් ශ්‍රී ලංකාවේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.
- සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමාගම පිළිබඳ ව පරීක්ෂා කර බලා එම විදේශීය සමාගම, ලියාපදිංචි කළ විදේශීය සමාගමක් සේ විදේශීය සමාගම් ලේඛනයේ ඇතුළත් කරන බව.

**නිපුණතා මට්ටම 5.7** : වරලත් ව්‍යාපාරවල සුවිශේෂ ලක්ෂණ විමසමින් ඒවායේ වාසි හා අවාසි සන්සන්දනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- වරලත් ව්‍යාපාර හඳුන්වයි.
- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශ්ව පෙන්වා දෙයි.
- වරලත්හිමියා හා වරලත්ලාභියා අතර පවත්නා අන්තර් සම්බන්ධතාව විස්තර කරයි.
- වරලත්හිමියා වරලත්ලාභියාට සපයන පහසුකම් පැහැදිලි කරයි.
- වරලත් ව්‍යාපාර වර්ග කරයි.
- වරලත් ව්‍යාපාරවල වාසි හා අවාසි පෙන්වා දෙයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර ආයතනයක් එම භාණ්ඩය හෝ සේවාව නිශ්චිත වෙළෙඳපොළ ප්‍රදේශයක අලෙවි කිරීමට තවත් ව්‍යාපාර ආයතනයකට අවස්ථාව දීමට යොදා ගන්නා ව්‍යාපාර සංවිධාන ක්‍රමය වරලත් ව්‍යාපාර ලෙස හඳුන්වන බව.
- වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ ප්‍රධාන පාර්ශ්ව දෙකක් දැකිය හැකි බව.
  - වරලත් සමාගමේ වෙළෙඳ නාමය යටතේ භාණ්ඩ විකිණීමට අවසර දෙන වරලත් සමාගම (වරලත්හිමියා)
  - වරලත් සමාගමෙන් අවසර ලබාගත් ආයතනය (වරලත්ලාභියා)
- වරලත් ව්‍යාපාර ආරම්භ කිරීමේ දී වරලත්ලාභියා හා වරලත්හිමියා අතර ඇතිවන ගිවිසුම වරලත් ගිවිසුම බව.
- වරලත්හිමියා විසින් වරලත්ලාභියාට පහත සඳහන් දෑ සපයන බව.
  - සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම.
  - කළමනාකරණ පුහුණුව ලබාදීම.
  - අලෙවිකරණ සහාය ලබාදීම.
  - මූල්‍ය පහසුකම් ලබාදීම.
  - වෙළෙඳසැලේ නිමාව සකස් කරදීම.
  - නිෂ්පාදිතය හෙවත් භාණ්ඩ හා උපකරණ සැපයීම
  - ශිල්පීය ඥානය ලබාදීම.
- වරලත්ලාභියා විසින් පහත සඳහන් කාර්ය ඉටුකළ යුතු බව.
  - වරලත්හිමියා පනවන කොන්දේසි අනුව කටයුතු කිරීමට එකඟවීම.
  - ප්‍රාග්ධනය ආයෝජනය කිරීම.
  - වරලත්හිමියාගෙන් හෝ එමගින් නිර්දේශ කරන ලද සැපයුම්කරුවන්ගෙන් පමණක් භාණ්ඩ මිලදී ගැනීම.
  - වරලත්හිමියාට ගිවිසගත් පරිදි පුරස්කාරය ගෙවීම.

- වරලත් ව්‍යාපාර පහත පරිදි වර්ග කළ හැකි බව.
  - නිෂ්පාදිත වරලත් ව්‍යාපාර
  - නිෂ්පාදන වරලත් ව්‍යාපාර
  - ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර
- වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි කිහිපයක් පහත දක්වෙන බව.
  - වරලත්හිමියාට ඔහුගේ ම ආයෝජනයකින් තොරව ව්‍යාපාරය පුළුල් කිරීමට හැකියාව ලැබීම.
  - වරලත්හිමියාගේ කීර්තිනාමය මත වරලත්ලාභියාට විශාල වෙළෙඳපොළක් ලබාගත හැකිවීම.
  - වරලත්ලාභියාට විශාල ලාභයක් ලබා ගැනීමට අවකාශ ලැබීම.
  - වරලත්හිමියාගේ කළමනාකරණ පුහුණුව වරලත්ලාභියාට ලැබීම
- වරලත් ව්‍යාපාර ක්‍රමයේ අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - වරලත්හිමියාගේ පාලනයක් ඇති නිසා වරලත්ලාභියාට පූර්ණ ස්වාධීනත්වයක් නොමැතිවීම.
  - වරලත්හිමියාගේ කීර්තිනාමය මත රැඳෙන නිසා ආයෝජනය පිළිබඳ අවදානමක් පැවතීම.
  - ලාභය පිළිබඳ අවිනිශ්චිතතාවක් පැවතීම.
  - වරලත් ව්‍යාපාර ක්‍රමය ලබා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවීම.

**නිපුණතා මට්ටම 5.8** : සමුපකාර ව්‍යාපාරවල ලක්ෂණ විමසමින් ඒවායේ වාසි සහ අවාසි සසඳයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 04

## ඉගෙනුම් ඵල

- සමුපකාර ව්‍යාපාරය අර්ථ දක්වයි.
- සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂ ලක්ෂණ විමර්ශනය කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ වාසි හා අවාසි පෙන්වා දෙයි.
- සමුපකාර ව්‍යාපාර ලියාපදිංචි කිරීමට අදාළ ක්‍රියා පටිපාටිය පැහැදිලි කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ජාත්‍යන්තර සමුපකාර සංධානය සමුපකාර ව්‍යාපාරය පහත පරිදි හඳුන්වා දී ඇති බව.
  "සිය ආර්ථික සාමාජීය හා සංස්කෘතිකමය අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගැනීම උදෙසා ස්වෙච්ඡාවෙන් එක්සත් වූ පුද්ගලයන්ගේ ස්වාධීන සංගමයක් මෙන් ම, සාමූහික අයිතිය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යාපාරයකි."

- මේ අනුව සමුපකාර ව්‍යාපාරය තුළ දැකිය හැකි ලක්ෂණ කිහිපයක් පහත දැක්වෙන බව.
  - ස්වාධීන සංවිධානයක් වීම.
  - ස්වෙච්ඡාවෙන් එක්වූ පුද්ගල සමූහයක් සිටීම.
  - සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
  - පොදු අවශ්‍යතා හා අපේක්ෂාවලින් යුතුවීම.
  - ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහිත ව්‍යාපාරයක් වීම.

- සමුපකාර ව්‍යාපාරයේ වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් පැවතීම.
  - අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සාධාරණ මිලට සැපයීම.
  - විවිධ ක්ෂේත්‍රවල ව්‍යාපාරික කටයුතු කළ හැකි වීම.
  - අන්‍යොන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීම.

- සමුපකාර ව්‍යාපාරයේ අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
  - මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම.
  - සමුපකාර ප්‍රතිපත්ති මතම පිහිටා කටයුතු කිරීමට සිදුවීම.

- ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ, සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා මගින් අදාළ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් යටතේ සිදුවන බව.
- සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේ දී පහත දැක්වෙන ලියකියවිලි සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු බව.
  - අයදුම්පත්‍රය
  - අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්
  - යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතාව දැක්වෙන වාර්තාවක්
  - සමුපකාර සමිතිය ලියාපදිංචිය සඳහා වූ යෝජනාව සම්මත වූ මහා සභා රැස්වීමේ වාර්තාව
  - ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින් සාමාජික ගාස්තු ගෙවන ලද බවටත්, එකී මුදල් කාරක සභාවේ භාරකාරීත්වයෙහි පවතින බවටත් කාරක සභාවේ සහතිකයක්.
  - සමිතිය පිහිටි ලිපිනයට ළඟා විය හැකි මාර්ගය දක්වන සටහනක්

**නිපුණතා මට්ටම 5.9** : සමුපකාර ව්‍යාපාරයේ විකාශනය විමසමින් සමුකාරවල ප්‍රවණතා පුරෝකථනය කරයි.

**කාලච්ජේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ විකාශනය විස්තර කරයි.
- සමුපකාර ප්‍රතිපත්ති අනාවරණය කරයි.
- සමුපකාර ව්‍යාපාරය රටේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය විග්‍රහ කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ ප්‍රවණතා පුරෝකථනය කරයි.
- සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය සඳහා සුදුසු යෝජනා ඉදිරිපත් කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ශ්‍රී ලංකාව තුළ සමුපකාර ව්‍යාපාරයේ විකාශනයේ වැදගත් අවස්ථා පහත පරිදි දැක්විය හැකි බව.

  1912 ණය දෙන සමුපකාර සමිති ඇරඹීම.

  1942 පාරිභෝගික සමුපකාර කඩ සමිති පිහිටුවීම.

  1947 ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා බෙදාහැරීමේ සමුපකාර සමිති පිහිටුවීම.

  1957 විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කිරිම.

  1971 සමුපකාර ප්‍රතිසංවිධානය කිරීම.

  1992 සමුපකාර සමිති සංශෝධනය කිරීම.

- සමුපකාර ප්‍රතිපත්ති පහත පරිදි දක්විය හැකි බව.
  - ස්වෙච්ඡා හා විවෘත සාමාජිකත්වය
  - ප්‍රජාතන්ත්‍රවාදි සාමාජික පාලනය
  - සාමාජික ආර්ථික සහභාගිත්වය
  - ස්වෛරීභාවය හා නිදහස
  - සමුපකාර අධ්‍යාපනය පුහුණුව හා තොරතුරු
  - ප්‍රාදේශීය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමුපකාර සමිති අතර සහයෝගීතාව
  - සමාජය පිළිබඳ සැලකිලිමත් වීම
- රටේ ආර්ථික සංවර්ධනයට සමුපකාර සමිති විවිධාකාරයෙන් දායක වන බව.

  ***නිදසුන්:***

  විවිධ සේවා සමුපකාර සමිති, නිෂ්පාදන සමුපකාර සමිති, සකසුරුවම් හා ණය ගනුදෙනු සමුපකාර සමිති හා කර්මාන්ත සමුපකාර සමිති යනාදිය හරහා ජාතික නිෂ්පාදිතයට දායක වෙමින් සේවා නියුක්තිය ඉහළ නැංවීම.

- වත්මන් තරගකාරී සංකීර්ණ ආර්ථිකය තුළ සමුපකාර ව්‍යාපාරයේ නව ප්‍රවණතා දැකිය හැකි බව.

  ***නිදසුන්:***

  - ස්වයං සේවා වෙළෙඳසැල් ඇරඹීම.
  - නව ව්‍යාපාර ක්ෂේත්‍රවලට පිවිසීම

**නිපුණතා මට්ටම 5.10 :** රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසමින් ඒවායේ වැදගත්කම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

### ඉගෙනුම් ඵල

- ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වාගෙන යාමට හේතු විමසයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධාන සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ විමසයි.
- පෞද්ගලීකරණය යන්න පැහැදිලි කරයි
- පෞද්ගලීකරණයේ යහපත් හා අයහපත් ප්‍රතිඵල සන්සන්දනය කරයි.

### විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- පොදු ජනතාවගේ සුභසිද්ධිය උදෙසා ව්‍යාපාර පවත්වා ගෙන යාමට රජය මැදිහත් වන බව.
- පහත හේතු සාධක මත රජය ව්‍යාපාර කටයුතු කරගෙන යනු දැකිය හැකි බව.
  - පෞද්ගලික අංශයේ අහිතකර වෙළෙඳපොළ තත්ත්ව පාලනයට
  - ඒකාධිකාරී ආයතන බිහිවීම වළකාලීමට
  - පොදු ජනතාවට අත්‍යවශ්‍ය සේවා සැපයීමට
  - සම්පත් නාස්තිය අවම කර ගැනීමට

- විශේෂ හෝ පොදු පනතක් යටතේ සංස්ථාපනය කෙරෙන පූර්ණ අයිතිය රජය සතුවන හෝ අයිතියෙන් වැඩි ප්‍රමාණයක් රජය සතු වන, රජය විසින් පත් කරන අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වන, ව්‍යාපාර රාජ්‍ය සංස්ථා ලෙස හැඳින්වෙන බව.
- අමාත්‍යාංශයක් යටතේ රජයේ ඍජු පාලනයට යටත්වන ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි අනුව ක්‍රියාත්මක වන, බොහෝ විට සේවා සැපයීමේ නිරත වන ආයතන විශේෂයක් ලෙස රාජ්‍ය දෙපාර්තමේන්තු හඳුන්වා දිය හැකි බව.
- පළාත් සභා, මහනගර සභා, නගර සභා හා ප්‍රාදේශිය සභා යන ආයතන විසින් ද ව්‍යාපාර කටයුතු සිදු කරන බව.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාර සියල්ල පොදු අංශයේ ව්‍යාපාර ලෙස ද හඳුන්වන බව.
- අකාර්යක්ෂම බවට පත් වූ පොදු අංශයේ ව්‍යාපාර කාර්යක්ෂම ආයතන බවට පත් කරලීම සඳහා රජය විසින් හඳුන්වා දෙන ලද එක් ක්‍රියාමාර්ගයක් ලෙස පෞද්ගලීකරණය හඳුන්වා දිය හැකි බව.
- පෞද්ගලීකරණයේ යහපත් ප්‍රතිඵල මෙන් ම අයහපත් ප්‍රතිඵල ද දැකිය හැකි බව.
- රාජ්‍ය අංශයේ ව්‍යාපාරවල ද යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල ද දැකිය හැකි බව.

**නිපුණතාව 6.0** : ආර්ථික හා පුද්ගල සංවර්ධනය සඳහා ව්‍යවසායකත්වයෙහි දායකත්වය පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම 6.1** : ව්‍යවසායකත්වයේ වැදගත්කම හා ප්‍රතිලාභ අධ්‍යයනයෙන් ව්‍යවසායකයෙකු වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- පිළිගත් නිර්වචන අධ්‍යයනය කිරීමෙන් ව්‍යවසායකත්වය සඳහා අර්ථකථනයක් ගොඩනගයි.
- ව්‍යවසායකත්වයේ වැදගත්කම අගය කරයි.
- ව්‍යවසායකත්වය තුළින් ලැබෙන පුද්ගල, සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභ ලැයිස්තු ගත කරයි.
- තෝරාගත් ව්‍යවසායන් සැලකිල්ලට ගෙන ඉන් ව්‍යවසායකයාට, සමාජයට හා ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන්ව ගොනු කරයි.
- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර ඇති සම්බන්ධතාව පැහැදිලි කරයි.
- ව්‍යවසායකත්වයේ නව ප්‍රවණතා අධ්‍යයනයෙන් ව්‍යවසායකත්වයේ අනාගතය පිළිබඳ ව අදහස් දක්වයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යවසායකත්වය පිළිබඳ විවිධ නිර්වචන ඇති බව.

  ***නිදසුන්:***

  " අවස්ථාවක් උදාකර ගෙන ඉන් ප්‍රයෝජන ගැනීමට සංවිධානයක් නිර්මාණය කරන්නා ව්‍යවසායකයෙකි. අවස්ථා උදාකර ගෙන ඒවා ප්‍රයෝජනයට ගැනීම සඳහා සංවිධාන නිර්මාණය කිරීමේ දී සම්බන්ධ වන සියලු කටයුතු සහ කාර්ය ව්‍යසායකත්ව ක්‍රියාවලියට ඇතුළත් වේ."

  William D Bygrave

- පහත සඳහන් කරුණු හේතු කොට ගෙන ව්‍යවසායකත්වය වැදගත් වන බව.
  - වේගයෙන් වෙනස්වන ලෝකයේ එම වෙනස්කම්වලට ප්‍රතික්‍රියා දැක්විය හැකි, නව්‍යතා සෙවිය හැකි ව්‍යවසායකයින්ගේ දැඩි අවශ්‍යතාවක් පැවතීම.
  - තරගකාරී ව්‍යාපාර ලෝකය තුළ ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමටත්, ඒවා ක්‍රියාත්මක කළ හැකි තත්ත්වයට පත්කර ගැනීමටත්, ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනිත කර ගැනීමටත් ව්‍යවසායකත්වය අවශ්‍ය වීම.
  - වෙනස්වන ලෝකයට නායකත්වය දිය හැක්කේ ව්‍යවසායකයින්ට බැවින්, ගොවිපළ, පාසල විශ්ව විද්‍යාල, ආරෝග්‍යශාලා, රජය, සමාජීය නියෝජිත ආයතන යනාදී සෑම ආයතනයකටම ව්‍යවසායකයින් අවශ්‍ය වීම.
- ව්‍යවසායකත්වය තුළින් පුද්ගල සමාජ හා ආර්ථික ප්‍රතිලාභ අත්වන බව.

***නිදසුන්***

පුද්ගල ප්‍රතිලාභ

- පුද්ගල හැකියාවලින් ප්‍රයෝජන ගැනීමට ඉඩ ප්‍රස්තා ලැබීම.
- ඉහළ කැපවීම මත ඉහළ ප්‍රතිලාභ ලබා ගත හැකිවීම.
- සමාජ තත්ත්වය හා පිළිගැනීම ඇතිවීම.
- පෞද්ගලික මූල්‍යමය ලාභ

සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභ

- නව රැකියා අවස්ථා උත්පාදනය වීම.
- ආදායම් අවස්ථා බිහිවීම.
- නව භාණ්ඩ හා සේවා පරිභෝජනයට අවස්ථා උදාවීම.
- ජනතාවගේ ජීවන මට්ටම ඉහළයාම.
- පූර්ණ සේවා නියුක්තිය ඇතිවීම.
- ප්‍රාදේශීය සම්පත් නිෂ්පාදනයට යොදා ගැනීම.
- නව වෙළෙඳපොළවල් සංවර්ධනයවීම.

- ව්‍යවසායකත්වය හා ආර්ථික සංවර්ධනය අතර පවත්නා සම්බන්ධතාව පැහැදිලි කළ හැකි කරුණු කිහිපයක් පහත දැක්වෙන බව.
  - ව්‍යවසායකත්වය නිසා නවයාතා බිහිවීමෙන් ජාතික නිෂ්පාදිතය ඉහළයාම.
  - නව රැකියා අවස්ථා බිහිවීමෙන් ආර්ථික සංවර්ධනයට දායකවීම.
  - වෙළෙඳපොළ කටයුතු පුළුල්වීමත්, නව තරගකරී වෙළෙඳපොළවල් බිහිවීමත් ආර්ථික සංවර්ධනයට හේතු වීම.
  - ප්‍රාදේශීය සම්පත් භාවිතයට ගැනීමෙන් ඒවාට ඉහළ ඉල්ලුමක් ඇතිවීම.
  - නව ව්‍යාපාර බිහිවීම ආර්ථික සංවර්ධනයට ඉවහල්වීම.
- ව්‍යවසායකත්වයේ ප්‍රවණතා කිහිපයක් පහත දැක්වෙන බව.
  - සමාජයීය ව්‍යවසායකත්වය
  - කාන්තා ව්‍යවසායකත්වය
  - අභ්‍යන්තර ව්‍යවසායකත්වය

**නිපුණතා මට්ටම 6.2** : ව්‍යවාසයකයන් බිහිවීමට පසුබිම් වූ හේතු අධ්‍යයනය කරයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

### ඉගෙනුම් ඵල

- ව්‍යවසායකයා යන්න හඳුන්වයි.
- ව්‍යවසායකයන් බිහිවීමට තුඩුදෙන හේතු ඉදිරිපත් කරයි.
- සැබෑ ව්‍යවසායකයන්ගේ ජීවන කතා අධ්‍යයනයෙන් ඔවුන් ව්‍යවසායකයන්වීමට පසුබිම් වූ හේතු අනාවරණය කරයි.

### ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

### පිවිසුම

- ප්‍රදේශයේ සිටින ව්‍යවසායකයෙකු පාසලට ගෙන්වා ඔහු/ ඇය සමඟ සාකච්ඡාවක් කරන්න. එහිදී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වන්න.
  - ව්‍යාපාරයේ ස්වභාවය
  - සාර්ථකත්වය/ අසාර්ථකත්වය
  - සාර්ථකත්වය හෝ අසාර්ථකත්වයට හේතු
  - ව්‍යවසායකයින් බිහිවීමට පොදුවේ බලපාන හේතු
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යවසායකයින් උපතින් බිහිවන්නේ ද, නැතහොත් ව්‍යවසායකයන් තැනිය හැකි ද යන්න විවාදයට භාජනය වන්නක් බව.
  - කෙසේ වුවද සහජයෙන් ඇතිවන ව්‍යවසාකයන් මෙන් ම සහජයෙන් තොරව බිහිවන ව්‍යවසායකයින් ද සිටින බව.
  - සාර්ථක ව්‍යවාසයකයින්ගේ ජීවන කතා අධ්‍යයනයෙන් ඔවුන්ගේ සාර්ථකත්වයට හේතු හඳුනා ගත හැකි බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

### ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් ව්‍යාපාර ක්ෂේත්‍ර අතරින් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාර ක්ෂේත්‍රය කෙරේ අවධානය යොමු කරන්න.
  - කාර්මික නිෂ්පාදන ව්‍යාපාර
  - වෙළෙඳ ව්‍යාපාර
  - සේවා ව්‍යාපාර
  - කෘෂි නිෂ්පාදන ව්‍යාපාර

- ඔබට ලැබුණ ව්‍යාපාර අංශය හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- ඔබේ මාතෘකාවට අදාළ ව්‍යවසායකයකු කණ්ඩායම් සාකච්ඡාවක් ඇසුරෙන් හඳුනා ගන්න.

- ඔහුගේ වත්මන් ව්‍යාපාර කටයුතු පිළිබඳ ව සංක්ෂිප්ත විස්තරයක් කරන්න.
- ඔහුගේ ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාව/ අවධිය පිළිබඳ ව තොරතුරු අනාවරණය කරන්න.
- ඔහුගේ ව්‍යාපාරය බිහිවීමට පසුබිම් වූ හේතු සාධක හඳුන්වා දෙන්න.
- ඔහුගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට ඉවහල් වූ සුවිශේෂී හේතු කවරේද?
- ඔහු ව්‍යවසායකයෙකු ලෙස ඔබ අර්ථ දක්වන්නේ ඇයි? හේතු දක්වන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යවසායකයා යන්නට විවිධ නිර්වචන ඇති බව.

***නිදසුන්:***

" ව්‍යාපාරයක අවදානම උපකල්පනය කරමින්, එම ව්‍යාපාරය සංවිධානය කර, කළමනාකරණය කරන තැනැත්තා ව්‍යවසායකයෙකි."

*The Merrian Webster Dictionary*

" පවත්නා ආර්ථික ක්‍රම වෙනස් කරමින් නව අමුද්‍රව්‍ය සොයා ගැනීමෙන් හෝ නව සංවිධාන ක්‍රම නිර්මාණය කිරීමෙන් නව භාණ්ඩ හා සේවා හඳුන්වාදෙන පුද්ගලයා ව්‍යවසායකයෙකි."

*ජෝශප් ෂුම්පීටර්*

- ව්‍යවසායකයන් බිහිවීමට පසුබිම් වන හේතු කිහිපයක් පහත දැක්වෙන බව.
  - ස්වයං නිර්මාණ කෙරෙහි යොමුවීම.
    
    ***නිදසුන්:*** • නවතම භාණ්ඩ හා සේවා නිර්මාණය
  - දෙමාපියන් සහ පවුලේ සාමාජිකයින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට නැඹුරු වී සිටීම නිසා එම පවුලේ සෙසු සාමාජිකයින්ට ද එම ආභාෂය ලැබීම.
  - ව්‍යවසායකයින් බිහිවීමට උචිත සමාජ හා ආර්ථික පසුබිමක් පැවතීම.
    
    ***නිදසුන්:*** • ව්‍යවසායකයෝ අගය කරන සමාජ පසුබිමක් තිබීම.
    
    • රජයේ අනුබලය දිරිගැන්වීම ලබාදීම.
  - රැකියාවෙන් ලද පළපුරුද්ද තුළින්
  - විනෝදාංශ ලෙස කරන ලද කටයුතු ව්‍යාපාර බවට පත්වීම.
    
    ***නිදසුන්:*** • සුරතල් මසුන් ඇති කිරීම
  - යම් යම් වෘත්තීන් පිළිබඳ හෝ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ව ලබා ගන්නා අධ්‍යාපනය හා පුහුණුව.
  - සමාජයේ පවත්නා විවිධ ගැටලුවලට විසඳුම් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස
    
    ***නිදසුන්:***
    - කැළි කසල ඉවත් කිරීමේ ගැටලුවට කොම්පෝස්ට් නිෂ්පාදනය.
    - මැසි මදුරු උවදුරට විවිධ විසඳුම් ඉදිරිපත් කිරීම
    - ඉන්ධන අර්බුදයට විවිධ උදුන් නිර්මාණය කිරීම.

**නිපුණතා මට්ටම 6.3** : ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගනිමින් ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- ව්‍යවසායකත්ව නිපුණතා ලැයිස්තු ගත කරයි.
- ව්‍යවසායකයන්ගේ චරිත කතා අධ්‍යයනයෙන් ඔවුන් තුළ දක්නට ඇති ව්‍යවසායකත්ව නිපුණතා මතුකර දක්වයි.
- ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගත හැකි මාර්ග යෝජනා කරයි.
- සාර්ථක ව්‍යවසායකයෙකුවීම සඳහා ව්‍යවසායකත්ව නිපුණතා සංවර්ධනය කර ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- සමාජයේ යම් යම් වෘත්තීන්වල යෙදෙන අය නිදසුන් වශයෙන් දක්වමින් ඒ ඒ වෘත්තිය සඳහා එම පුද්ගලයන්ට අවශ්‍ය කුසලතා මොනවාද? යන ප්‍රශ්නය පන්තියට ඉදිරිපත් කරන්න.

  ***නිදසුන්:***
  - ගීත රචකයෙක්
  - සැලසුම් ශිල්පියෙක්
  - ව්‍යාපාරිකයෙක්
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ව්‍යාපාරිකයින්ට ව්‍යාපාරවල සාර්ථකව නියැලීම සඳහා විවිධ කුසලතා අවශ්‍ය බව.
  - ව්‍යවසායකයන් තුළ විශේෂ කුසලතා හා ගතිලක්ෂණ විද්‍යමාන වන බව.
  - පහත සඳහන් ක්‍රීඩාව ඇසුරෙන් එවැනි කුසලතා හඳුනා ගත හැකි බව.

- **වළලු විසිකිරීමේ ක්‍රීඩාව සඳහා ගුරුවරයාට උපදෙස්**
  - පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට හෝ තුනකට වෙන් කරන්න.

    ***නිදර්ශනඃ*** කණ්ඩායම I

    කණ්ඩායම II
- වළලු විසිකිරීමේ ක්‍රීඩාව කරන ආකාරය පිළිබඳ උපදෙස් කණ්ඩායම්වලට ලබා දෙන්න.
  - විෂ්කම්භය සෙ.මී. 6, 8, 10 ප්‍රමාණවලින් යුත් වළලු තුනක් සකස් කර ගන්න. මේ සඳහා ප්ලාස්ටික් බට (අඟල් $\frac{1}{2}$) /වයරින් බට යොදාගත හැකි ය.

- සෙ.මී. 8ක් හෝ 10ක් පමණ පොළොවෙන් මතුපිටට සිටිනසේ කුඤ්ඤයක් පොළොවේ සවි කරන්න. මෙය පැතලි පෘෂ්ටයක් මත සවිකර පොළොවට සෘජුව තබා ගත හැකිසේ සකස් කර ගන්න.
- කුඤ්ඤය ඇති තැන සිට සෙ.මී. 30 බැගින් දුර ලකුණු කර ගන්න. එම දුර ප්‍රමාණ 1. 2. 3, 4 .... ආදී ලෙස ලකුණු කරන්න.

***නිදර්ශන***




- ඒ ඒ දුර ප්‍රමාණයේ සිට කරනු ලබන සාර්ථක විසිකිරීමකට (වළල්ල කුඤ්ඤයට වැටෙනසේ විසිකිරීමකට) හිමිවන ලකුණු ප්‍රමාණ පිළිබඳ ව කණ්ඩායම් දැනුවත් කරන්න.
- වළලු තුනෙන් ඕනෑම වළල්ලක් තෝරාගත හැකි බවත්, ක්‍රීඩා කිරීමට වාර 6ක් ලැබෙන බවත් සිසුන් දැනුවත් කරන්න.
- කණ්ඩායමේ සියලු දෙනාටම හෝ තෝරාගත් අයට පමණක් ක්‍රීඩාවේ යෙදිය හැකි ය.
- ක්‍රීඩාව කරන අතරතුර ඒ ඒ කණ්ඩායම ලබා ගන්නා ලකුණු කණ්ඩායම ඉදිරියේ සටහන් තබන්න.
- ක්‍රීඩාවේ යෙදීමෙන් අනතුරුව ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී සිසු අත්දැකීම් අනාවරණය කර ගන්න.
- සිසුන් ක්‍රීඩාවේ යෙදීමේ දී හැසිරෙන ආකාරය හොඳින් නිරීක්ෂණය කිරීමටත්, සමාලෝචනයේ දී එම නිරීක්ෂණ විෂය කරුණුවලට අදාළ කර ගැනීමටත් සැලකිලිමත් වන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- ගුරුවරයාගේ උපදෙස් අනුව වළලු විසිකිරීමේ ක්‍රීඩාවේ යෙදෙන්න.
- ක්‍රීඩාවෙන් අනතුරුව පහත කරුණු අනාවරණය කර ගැනීමට කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ක්‍රීඩාවේ යෙදුන අය ක්‍රීඩාවේ දී කළ දෙවල් මොනවා ද?
  - වළලු විසිකිරීමේ දී සිටින ස්ථාන මාරු කිරීම හෝ නොකිරීමට හේතු මොනවා ද?
  - තෝරාගත් වළලු හෝ වළල්ල පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.
  - ක්‍රීඩාව අතරතුර බාහිර පරිසරයේ බලපෑම ක්‍රීඩාවෙහි ප්‍රතිඵලයට කළ බලපෑම් කෙසේ ද?
  - ක්‍රීඩාවට තෝරා ගැනීම හෝ නොගැනීම පිළිබඳ ව ඔබගේ හැඟීම කුමක් ද?
  - ජයග්‍රහණය/ පරාජය සඳහා ඉවහල් වූ සුවිශේෂී සාධක පැවතුණේ ද?

- මෙම ක්‍රීඩාව තුළින් ඔබ ලබාගත් අත්දැකීම් සියල්ල සැලකිල්ලට ගනිමින් ඔබේ අනාවරණ සමස්ත පන්තියට ඉදිරිපත් කරන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ව්‍යවසායකයන්ගේ චරිත කතා අධ්‍යයනයෙන් ඔවුන් තුළ දක්නට ඇති නිපුණතා උපුටා දක්වන්න.
- ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගැනීමේ විවිධ මාර්ග ඇති බව.

  ***නිදසුන්:***

  - පළමුව ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිතව හඳුනාගෙන, එම නිපුණතා තමා තුළ කොතෙක්දුරට පවතී ද? තමා තුළ නැති නිපුණතා මොනවා ද? තවදුරටත් සංවර්ධනය කරගත යුතු නිපුණතා මොනවා ද? යන්න ස්වයං ඇගයීමක් කිරීම මගින්
  - ව්‍යවසායත්ව නිපුණතා වර්ධනය කර ගැනීමට ඇති විවිධ පුහුණු වැඩසටහන් මගින්
  - සාමාන්‍ය අධ්‍යාපනයට අමතර ව, ව්‍යවසායකත්වය පිළිබඳ ව ලබන අධ්‍යාපනය තුළින්.
  - වෙනත් ව්‍යවසායවල කටයුතු කිරීමෙන් හෝ තමාම ව්‍යවසායකයෙකු ලෙස කටයුතු කිරීමෙන් ලබන අත්දැකීම්වලින්

- ව්‍යවසායකත්ව නිපුණතා සහිත පුද්ගලයන්, සාර්ථක ව්‍යවසායකයන් බවට පත්වන බව.
- ඉන්දියාවේ ව්‍යවසායකත්ව සංවර්ධන ආයතනය(EDI) පර්යේෂණයකින් පසු පහත සඳහන් ව්‍යවසායකත්ව නිපුණතා හඳුනාගෙන ඇති බව.
  - ආරම්භන හැකියාව - Initiative
  - අවස්ථා හඳුනා ගැනීම සහ ක්‍රියාවට නැංවීම - Sees and Acts on Opportunities
  - නොනැවතී කරගෙන යාම - Persistence
  - දැන සිටීම - Knowing
  - වැඩෙහි ඉහළ ගුණාත්මක බව ගැන සැලකිලිමත් වීම.
  - ගිවිසගෙන වැඩට කැපවීම - Commitment to work contract
  - කාර්යක්ෂම නැඹුරුව - Efficiency orientation
  - විධිමත් සැලසුම්කරණය - Systematic planning
  - ගැටලු විසඳීම - Problem solving
  - බලපෑම් කිරීමේ හැකියාව - Assertiveness
  - ආත්ම විශ්වාසය - Self-confidence
  - ඒත්තු ගැන්වීමේ හැකියාව - Persuation
  - බලපෑම් උපායන් භාවිතය - Use of Influence Strategies
  - නියාමනය - Monitoring
  - සේවක සුභසාධනය ගැන සැලකිලිමත්වීම- Concern for Employee welfare

- සිසුන් ක්‍රීඩාවේ යෙදෙන අවස්ථාවේ කටයුතු කළ ආකාරය සහ ගත් ක්‍රියාමාර්ග පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- එසේ ම සිසුන් ක්‍රීඩාවේ යෙදීමෙන් අනතුරුව, ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්වලට අනුව ඉදිරිපත් කරන සිසු අනාවරණවලට සැලකිල්ලෙන් සවන් දෙන්න.

- සමාලෝචනයේ දී, සිසුන් මගින් ප්‍රදර්ශනය වූ හෝ නොවූ ව්‍යවසායකත්ව නිපුණතා පිළිබඳ ව සාකච්ඡා කරන්න.

***නිදසුන්:***

  - සිසුන් එක වළල්ලකින් පමණක් ක්‍රීඩාව කළේ නම් එහිදී සිසුන් අවස්ථා හඳුනාගෙන නොමැති බව හා වළලු මාරු කරමින් ක්‍රීඩාව කළේ නම් විවිධ අවස්ථා හඳුනාගෙන ඒවා ක්‍රියාවට නැංවීම සඳහා උත්සාහ ගත් බව.
  - ස්ථාන මාරු කරමින් ක්‍රීඩාව කළේ නම්, එහිදී අවදානම බාර ගැනීම මෙන් ම අභිලාෂ මුදුන් පමණුවා ගැනීම සඳහා කටයුතු කළ බව හා එකම ස්ථානයේ සිට වළලු දැමීමට උත්සාහ කළේ නම්, අවදානමට මුහුණදීමට බියවීම හා ජයග්‍රහණය කිරීමේ අභිලාභය නොතිබුණු බව.

- මෙලෙස සෑම කණ්ඩායමකම සෑම සාමාජිකයෙකුගෙන් ම ප්‍රදර්ශනය වූ හෝ නොවූ ව්‍යවසායකත්ව නිපුණතා සැලකිල්ලට ගෙන ඒවා සංවර්ධනය කර ගැනීමට රුකුලක් වන ලෙස සාකච්ඡාවක් මෙහෙයවන්න.

**නිපුණතා මට්ටම 6.4** : ආර්ථික සංවර්ධනය සඳහා කුඩා ව්‍යාපාරවල දායකත්වය විමසයි.
**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- පිළිගත් නිර්ණායක සළකා බලමින් කුඩා ව්‍යාපාර යන්න අර්ථ දක්වයි.
- කුඩා ව්‍යාපාරවල දැකිය හැකි සුවිශේෂ ලක්ෂණ පෙළගස්වයි.
- රටක ආර්ථික සංවර්ධනය සඳහා කුඩා ව්‍යාපාරවලින් ලැබෙන පිටුවහල නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය කෙරෙහි ව්‍යවසායකත්වය හේතුවන ආකාරය විග්‍රහ කරයි.
- කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී සැලකිලිමත් විය යුතු කරුණු වෙන වෙනම ලැයිස්තු ගත කරයි.
- කුඩා ව්‍යාපාර සාර්ථකවීමට හෝ අසාර්ථකවීමට බලපෑ හේතු විග්‍රහ කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- විවිධ ආයතන විවිධ අවශ්‍යතා මත විවිධ නිර්ණායක භාවිත කරමින් කුඩා ව්‍යාපාර නිර්වචනය කර ඇති බව.
- ඇමරිකා එක්සත් ජනපදයේ Small Business Administration ආයතනය පහත දැක්වෙන පරිදි කුඩා ව්‍යාපාර නිර්වචනය කර ඇති බව.

  "ස්වාධීනව අයිති හා ස්වාධීනව ක්‍රියාත්මක වන, එසේ ම ක්ෂේත්‍රය තුළ බලයක් හිමි නොවූ ව්‍යාපාර කුඩා ව්‍යාපාර වේ."

- කුඩා ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ යම් යම් ආයතන විවිධ නිර්ණායක භාවිත කරන බව.

***නිදසුන්:***

| ආයතනය | නිර්ණායකය |
|---|---|
| 1. කාර්මික සංවර්ධන මණ්ඩලය | 1. යොදවා අති ප්‍රාග්ධනය රු. මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 2. කාර්මික තාක්ෂණික ආයතනය | 2. යොදවා අති ප්‍රාග්ධනය රු. මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 3. කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව | 3. යොදවා අති ප්‍රාග්ධනය රු. මිලියන 4 නොඉක්මවන ව්‍යාපාර |
| 4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 4. ආයෝජිත ප්‍රාග්ධනය රු. මිලියන 20 නොඉක්මවන ව්‍යාපාර |
| 5. ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව | 5. සේවක සංඛ්‍යාව 25ට අඩු ව්‍යාපාර |
| 6. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය | 6. ස්ථිර සේවක සංඛ්‍යාව 50ට අඩු ව්‍යාපාර |
| 7. ශ්‍රී ලංකා මහ බැංකුව | 7. භාවිත කරන විදුලිබල ධාරිතාව කිලෝවොට් ඇම්පියර් 50ට අඩු ව්‍යාපාර |

- කුඩා ව්‍යාපාරවලට සුවිශේෂ වූ ලක්ෂණ ඇති බව.

***නිදසුන්:***

  - වෙළෙඳපොළ කුඩාවීම.
  - කුඩා ප්‍රාග්ධනයක් ආයෝජනය කර තිබීම.
  - අඩු සේවක සංඛ්‍යාවක් සිටීම.
  - පවුලේ ශ්‍රමය වැඩි වශයෙන් භාවිත කිරීම.
  - තීරණ ගැනීම තමන් සතු තොරතුරු මත පමණක් සිදුවීම.
  - ව්‍යාපාරයේ කළමනාකරණය ස්වාධීනය. බොහෝවිට අයිතිකරු ප්‍රධාන කළමනාකරු ද වේ.
  - වෙළෙඳපොළ බොහෝ විට දේශීය වේ. නමුත් විදේශීය වෙළෙඳපොළට ද නිෂ්පාදිත සපය යි.
  - විශාල ව්‍යාපාරවලට සාපේක්ෂව මේවායේ මූල්‍ය බැඳීම් අඩු ය.
  - නවීන තාක්ෂණය භාවිතය අඩු ය.

- රටක ආර්ථික සංවර්ධනයට කුඩා ව්‍යාපාර විවිධ ආකාරයෙන් ඉවහල් වන බව.

***නිදසුන්:***

  - මහාපරිමාණ ව්‍යාපාරවලට සාපේක්ෂව වැඩි රැකියා ප්‍රමාණයක් ජනිත කිරීමට හැකිවීම.
  - ජාතික නිෂ්පාදිතයේ වර්ධනයට දායක වීම.
  - මහා පරිමාණ ව්‍යාපාරවලට අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීම හා භාණ්ඩ කොටස් හා සේවා සැපයීම.
  - දේශීය හා ප්‍රාදේශීය සම්පත්වල උපරිම භාවිතය
  - ජනතාවගේ ආදායම් මට්ටම ඉහළයාම
  - මහා පරිමාණ ව්‍යාපාර ඉටු නොකරන ව්‍යාපාර කටයුතුවල නිරතවීම.
  - සම්ප්‍රදායික ශිල්ප ක්‍රම නව තාක්ෂණය හා බද්ධ කර ගැනීමෙන් නිෂ්පාදිතවල ගුණාත්මක භාවය වැඩිකර ගත හැකිවීම.
  - ප්‍රාදේශීය සංවර්ධනය ඇතිවීම සමඟ නාගරීකරණය නිසා ඇති වන ගැටලු අවම වීම.

- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වයට ව්‍යවසායකත්වය ඉවහල් වන බව.

***නිදසුන්:***

  - ව්‍යාපාර ඇරඹීම අවදානම් සහිත ය. එහෙත් ව්‍යවසායකයා අවදානම්වලට සාර්ථකව මුහුණ දේ. මෙහිදී ව්‍යවසායකයාගේ කැපවීම කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වේ.

- කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

  ***නිදසුන්:***

  - වෙළෙඳපොලේ ස්වභාවය
  - නිෂ්පාදිතයේ ස්වභාවය
  - අවශ්‍ය ප්‍රාග්ධනය හා එය සපයා ගන්නා ආකාරය
  - තරගය
  - සංවිධාන ක්‍රමය
  - බලපාන නීතිරීති

- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වයට බලපාන හේතු කිහිපයක් පහත දැක්වෙන බව.
  - ස්ථාවර දේශපාලන හා ආර්ථික පසුබිමක් පැවතීම.
  - ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම.
  - මූල්‍ය හා බදු සහන ආදී දිරිගැන්වීම්.
  - පුළුල් වෙළෙඳපොළක් පැවතීම.
  - ආයතනික පහසුකම් අලෙවි පහසුකම් ආදිය පැවතීම.

- කුඩා ව්‍යාපාරවල අසාර්ථකත්වයට බලපාන හේතු කිහිපයක් පහත දැක්වෙන බව.
  - ව්‍යවසායකත්ව හැකියා අඩුවීම
  - කළමනාකරණයේ දුර්වලතා
  - මූල්‍ය දුෂ්කරතා
  - යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
  - නව තාක්ෂණය යොදා නොගැනීම
  - වෙළෙඳපොළ ගැටලු

**නිපුණතා මට්ටම 6.5** : කුඩා ව්‍යාපාර සාර්ථක කර ගැනීම සඳහා ඇති දිරිගැන්වීම් සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

## ඉගෙනුම් ඵල

- කුඩා ව්‍යාපාර දිරිගැන්වීමට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග ලැයිස්තුගත කරයි.
- රජය ලබාදෙන දිරිගැන්වීම් මූල්‍යමය හා මූල්‍යමය නොවන අංශ යටතේ වර්ග කොට දක්වයි.
- කුඩා ව්‍යාපාරවලට දිරිගැන්වීම් ලබාදෙන ආයතන හා ඒවායින් ලබාදෙන දිරි ගැන්වීම් වගුගත කරයි.
- තෝරාගත් ව්‍යාපාරයක් ඇසුරින් ඊට ලබා දී ඇති දිරිගැන්වීම් හඳුනාගෙන ඒවා මූල්‍යමය හා මූල්‍යමය නොවන ලෙස වර්ග කර දක්වයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- කුඩා දරුවෙකුට නැඟිටීමට අත දෙන මවකගේ පින්තූරයක් පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - ළමයාට තනිව ඇවිදින්නට හැකිවූ විට අතදීම අනවශ්‍ය බව.
  - එලෙසම කුඩා ව්‍යාපාරිකයන්ට තනිව නැඟී සිටිය නොහැකි බව.
  - ඒ සඳහා විවිධාකාර අතදීම් අවශ්‍ය බව.
  - ව්‍යාපාරිකයින් නැඟී සිටිය පසු ඔවුන් ව්‍යාපාර පුළුල් කර ගන්නා බව.
  - එය ජාතික සංවර්ධනයට හේතු වන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත දැක්වෙන්නේ පළාත් වාණිජ මණ්ඩල වාර්ෂික සම්මේලනයක දී තේ විවේකය තුළ ව්‍යාපාරිකයන් කීපදෙනෙකු අතර ඇති වූ කතා බහකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ව්‍යාපාරිකයාගේ ප්‍රකාශයට අවදානය යොමු කරන්න.

ධනවර්ධන - "මගේ බිස්නස් එකට දාන්න තව ලක්ෂ විසිපහක් තිබුණා නම් පළාතෙම මාකට් එක අල්ල ගන්න තිබුණා."

විදුලසේන - "මගේ ප්‍රශ්නේ ඕක නොවේ, හදාගත්ත බඩු ටික විකුණගන්න විදියක් නැති එක ගැනයි. බඩුටික විකුණ ගත්තා නම් මම ගොඩ."

කීර්ති - "මම දැනට භාවිත කරන යන්ත්‍ර සූත්‍ර හා ක්‍රම එක්ක මාර්කට් එක අල්ලන්න බැහැ. අලුත් මැෂින් ටිකක් හොයා ගත්ත නම් ෆොරින් මාර්කට් එකටත් යන්න පුළුවන්."

කාලිංග - "මම හිතනවා මම යොදවන මුදල්වලට ඉපැයුම් මදි කියලා. සමහර අය මේ තරම් සල්ලි යට කරන්නෙ නැතිව හොඳට බිස්නස් කරගෙන යනවා. මම හිතන්නෙ මම නිවැරදිව මුදල් යොදවලා නැහැ."

- ඔබේ කණ්ඩායමට ලැබුණු ව්‍යාපාරිකයාගේ ප්‍රකාශය අධ්‍යයනය කොට ඔහුගේ අවශ්‍යතාව (ගැටලුව) හඳුනාගෙන ලියන්න.
- එම අවශ්‍යතාව සැපයීම සඳහා ප්‍රදේශයේ හෝ රටේ පවතින ආයතන හෝ පුද්ගලයන් තෝරා ගෙන ලැයිස්තුගත කරන්න.
- ඒ ආයතනවලින් ලබාදෙන සේවා ලැයිස්තුවක් සකස් කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- කුඩා ව්‍යාපාරවලට රජය විවිධ මූල්‍යමය දිරිගැන්වීම් ලබාදෙන බව.

  ***නිදසුන්***
  - කෙටි හා දිගුකාලීන ණය
  - මූල්‍යමය ආධාර
  - බදු සහන
  - ප්‍රතිමූල්‍ය පහසුකම්
- කුඩා ව්‍යාපාර සඳහා රජය විවිධ මූල්‍යමය නොවන දිරිගැන්වීම් ලබාදෙන බව.

  ***නිදසුන්:***
  - විශේෂඥ උපදේශන සේවා
  - ව්‍යවසායක සංවර්ධන වැඩසටහන්
  - තොරතුරු සැපයීමේ සේවා
  - යටිතල පහසුකම් සැපයීම
  - වෙළෙඳපොළ පහසුකම් ලබාදීම
  - ආයතනික පහසුකම් සැපයීම
  - තාක්ෂණික සේවා ලබාදීම
- කුඩා ව්‍යාපාරවලට විවිධ ආයතන මගින් විවිධ දිරිගැන්වීම් ලබා දෙන බව.

  ***නිදසුන්:***

| **ආයතනය** | **ලබා දෙන දිරිගැන්වීම්** |
|---|---|
| • කාර්මික සංවර්ධන මණ්ඩලය | • උපදේශන සේවා<br>• තාක්ෂණික සේවා<br>• යටිතල පහසුකම් |
| • අපනයන සංවර්ධන මණ්ඩලය | • අලෙවි පහසුකම්<br>• උපදේශන සේවා |
| • ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | • උපදේශන සේවා |
| • ජාතික සංවර්ධන බැංකුව | • මූල්‍ය පහසුකම් |
| • කාර්මික තාක්ෂණ ආයතනය | • තාක්ෂණික සේවා සැපයීම<br>• උපදේශන සේවා සැපයීම |

**නිපුණතා මට්ටම 6.6** : කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ඇති විශේෂ ව්‍යාපෘති විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා වර්තමානයේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවලට නිදසුන් දක්වයි.
- කුඩා ව්‍යාපාරවලට ආධාර සපයනු ලබන කාලීන ව්‍යාපෘති පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරයි.
- තෝරාගත් කුඩා ව්‍යාපාරයකට ආධාර කරනු ලබන ව්‍යාපෘති පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

**සුවන** - මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වන්නේ අන්තර්ජාතික සහයෝගීතාව සඳහා වූ ජපාන බැංකුව (JBIC) වන අතර, ප්‍රතිමුල්‍ය පහසුකම් සපයන්නේ ජාතික සංවර්ධන බැංකුවයි. මෙමගින් සුළු කර්මාන්ත හා ව්‍යවසායකයන් නංවාලීම සඳහා ණය සපය යි. මෙය SMILE (Small & Micro Industries Leader &Entrepreneur promotion project) ලෙස ද හඳුන්වයි. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ මෙහි III වන අදියර ය.

**සහන්‍යා** - සුළු පරිමාණ ව්‍යාපාරිකයින්ට ණය සැපයීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලදි. මේ සඳහා DFCC බැංකුව සහ අනෙකුත් වාණිජ බැංකු සම්බන්ධ වී ඇත. මූල්‍ය අනුග්‍රහය ලබා දෙන්නේ ආසියානු සංවර්ධන බැංකුවයි.

**නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය** -

තෘතීය අධ්‍යාපන හා පුහුණු අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන නිපුණතා පාඨමාලා සාර්ථකව නිම කළ අයට ණය සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර ඒ සඳහා මූල්‍යනය කරනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුව විසින් ය.

**ගැමි පුබුදුව වැඩසටහන**

ස්වයං රැකියා සඳහා ණය සැපයීමට හැටන් නැෂනල් බැංකුව මගින් ආරම්භ කර ඇති ව්‍යාපෘතියකි.

**සණස ණය ව්‍යාපෘතිය**

කෘෂි, සත්ව, කුඩා කර්මාන්ත, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සපය යි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදවා ගන්නා අතර සණස මහා සංවර්ධන සංගමය පරිපාලන කටයුතු සිදු කරයි.

**සමුපකාර ග්‍රාමීය බැංකු ණය**

කෘෂි, ධීවර, සත්ව පාලනය, වෙළෙඳාම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම මෙමගින් සිදු කරයි. ජාතික සංවර්ධන භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ. මේ සඳහා විවිධ සේවා සමුපකාර සමිති හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පරිපාලන දායකත්වය ලබා දේ.

**සමෘද්ධි සංවර්ධන ණය යෝජනා ක්‍රමය**

සමෘද්ධි බැංකු සංගම් හරහා සමෘද්ධිලාභීන් වෙත ණයදීම සහ අනෙකුත් සේවා සැපයීම සිදු කිරීම සඳහා මෙම යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මේ සඳහා අවශ්‍ය මුදල් රජයේ ප්‍රදානයන්ගෙන් හා සාමාජිකයන්ගේ තැන්පතු මගින් රැස් කළ ඉතුරුම් මුදල් තුළින් ලබා ගනියි. මෙහි පාලනය ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් සිදු කරනු ලැබේ.

**ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය**

කෘෂිකර්ම සංවර්ධන හා ගෙවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘතියකි. වගා කටයුතු සඳහා ගොවීන්ට කෙටිකාලීන ණය හා දිගුකාලීන ණය ලබා දෙයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ පිහිටුවා ඇති ගොවීන්ගේ භාරකාර අරමුදල හා සාමාජික තැන්පතු මේ සඳහා යොදා ගැනේ.

- කුඩා ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා වෙනත් කාලීන ව්‍යාපෘති ද ක්‍රියාත්මක වන බව.

***නිදසුන්:***

- නව සපිරි ග්‍රාමිය ණය යෝජනා ක්‍රමය (NCRCS)
- කෘෂි නවෝදය ණය යෝජනා ක්‍රමය
- දෙවන බහුවාර්ගික බෝග සංවර්ධන චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය(SPCDP-RF)
- තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (TDP-RF)
- කෘෂි සත්ත්ව පාලන සංවර්ධන ණය යේජනා ක්‍රමය (ALDL)
- දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මුල්‍ය ව්‍යාපෘතිය (PAMP)
- සුළු ගොවීන් සහ ඉඩම් නොමැති ණය ව්‍යාපෘතිය (SFLCP)

**නිපුණතාව 7.0** : ව්‍යාපාරවල පැවැත්මට හා වර්ධනයට මුදල් හා මූල්‍ය ආයතනවලින් වන දායකත්වය අගය කරයි.

**නිපුණතා මට්ටම 7.1** : ගනුදෙනු පහසු කර ගැනීම සඳහා මුදලේ අවශ්‍යතාව තහවුරු කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- මුදල් අර්ථකථනය කරයි.
- මුදලේ විකාශනය අධ්‍යයනය කරමින් විවිධ කාලවකවානුවල මුදල් ලෙස භාවිත වූ දෑ හඳුන්වයි.
- හුවමාරුව සඳහා මුදලේ අවශ්‍යතාව පෙන්වා දෙයි.
- මුදලින් ඉටුවන ප්‍රධාන කාර්ය හඳුන්වා, ඒවායේ වැදගත්කම නිදසුන් සහිත ව පැහැදිලි කරයි.
- මුදල්වල පොදු ලක්ෂණ පෙන්වා දෙයි.
- හුවමාරුවේ දී භාවිත වන විවිධ මුදල් වර්ග නම් කොට පැහැදිලි කරයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය :

## පිවිසුම

- ස්ව කැමැත්තෙන් ඉදිරිපත් වන සිසුන් ලවා පහත සඳහන් රංගන පන්තියට ඉදිරිපත් කරවන්න.

**භූමිකා රංගනය 1 - චරිත 2යි.**

- රෙදි නිපදවන්නෙක් සහ පළතුරු නිපදවන්නෙක්

**චරිතවල හැසිරීම.**

- රෙදි නිපදවන්නා පළතුරු නිපදවන්නා ළඟට පැමිණෙයි.
- රෙදි දී පළතුරු ඉල්ලයි.
- හුවමාරුව සිදුවේ.
- දෙදෙනා තෘප්තිමත් ව පිටව යයි.

**භූමිකා රංගනය 2- චරිත 2යි.**

- රෙදි නිපදවන්නෙක් සහ වඩු කාර්මිකයෙක්

**චරිතවල හැසිරීම.**

- රෙදි නිපදවන්නා රෙදි රැගෙන වඩු කාර්මිකයා ළඟට යයි.
- රෙදි දී මේසයක් ඉල්ලයි.
- රෙදි අවශ්‍ය නොමැති බවත්, මේසය දීමට සහල් අවශ්‍ය බවත් පවසයි.
- ගනුදෙනුව සිදුනොවේ. දෙදෙනා අතෘප්තිමත් ව පිටව යයි.

**භූමිකා රංගනය 3- චරිත 2යි.**

- සුපිරි වෙළෙඳසැල් හිමියෙක් හා ගනුදෙනුකරුවෙක්

**චරිතවල හැසිරීම.**

- ගනුදෙනුකරු භාණ්ඩ තෝරාගෙන මුදල් ගෙවීමට මුදල් නෝට්ටුවක් ඉදිරිපත් කරයි.
- මුදල් නෝට්ටුව ලාච්චුවට දමා ඉතුරු මුදල් ලබා දෙයි.
- ගනුදෙනුකරු තෘප්තිමත්ව පිටව යයි.

**භූමිකා රංගනය 4- චරිත 2යි.**

- සුපිරි වෙළෙඳසැල් හිමියෙක් සහ ගනුදෙනුකරුවෙක්

**චරිතවල හැසිරීම**.

- ගනුදෙනුකරු භාණ්ඩ තෝරාගෙන මුදල් ගෙවීම සඳහා වෙළෙඳසැල්හිමියාට ප්ලාස්ටික් කාඩ්පතක් ඉදිරිපත් කරයි.
- කාඩ්පත යන්ත්‍රයකට ඇතුල් කරන බව හඟවා බිලක් නිකුත් කරයි. එය ගනුදෙනුකරු අත්සන් කරයි.
- ගනුදෙනුකරු තෘප්තිමත් ව පිටව යයි.

- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - පළමු භූමිකා රංගනයෙන් භාණ්ඩයට භාණ්ඩය හුවමාරුව සිදුවූ බව.
  - දෙවන භූමිකා රංගනයෙන් භාණ්ඩ හුවමාරුව සම්පූර්ණ නොවූ බව හා ඒ සඳහා බලපෑ හේතු ඇති බව.
  - තුන්වන භූමිකා රංගනයෙන් ව්‍යවහාර මුදල් භාවිතයෙන් ගනුදෙනුව සම්පූර්ණ වූ බව.
  - හතරවන භූමිකා රංගනයෙන් ගනුදෙනුව සම්පූර්ණ වු අයුරු හා ගෙවීම් උපකරණය ලෙස ණයපත /හරපත භාවිත කළ බව.
  - වර්තමානයේ ගනුදෙනු පියවීම සඳහා විවිධ ගෙවීම් උපකරණ භාවිත කරන බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර පහත දැක්වෙන ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

## ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්

- පහත සඳහන් වන්නේ ගෙවීම් කිරීම සඳහා භාවිත කළ හැකි උපකරණ කිහිපයකි. ඒවායින් ඔබට ලැබෙන උපකරණය කෙරෙහි අවදානය යොමු කරන්න.
  - රුපියල් 100 නෝට්ටුවක්
  - චෙක්පතක්
  - ණයපතක්
- ඔබට ලැබුණු උපකරණය කෙටියෙන් හඳුන්වන්න.
- ඔබට ලැබුණු ගෙවීම් පියවීමේ උපකරණය භාවිත කිරීමේ දී ඇති විය හැකි වාසි හා අවාසි දක්වන්න.
- ඔබට ලැබුණු උපකරණයෙන් ඉටුවන කාර්ය ලැයිස්තු ගත කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලි ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

### විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- භාණ්ඩ හා සේවා හුවමාරුවේ දී පොදුවේ පිළිගනු ලබන ඕනෑම මාධ්‍යයක් මුදල් වශයෙන් සලකන බව.
- භාණ්ඩ හුවමාරු ක්‍රමයේ සිට අද දක්වා මුදල් භාවිතයේ ඇති වූ ක්‍රමික විකාශනය පහත දැක්වෙන පරිදි පෙළගැස්විය හැකි බව.
  - ද්‍රව්‍ය භාවිතය - ගල් කැබලි, සිප්පි කටු, සත්ත්ව ඇට, දුම්කොළ වැනි ද්‍රව්‍ය භාවිතය.
  - ලෝහ වර්ග භාවිතය - රන් රිදී වැනි ලෝහ වර්ග භාවිත කිරීම.
  - ලෝහ කාසි මුදල් භාවිතය
    - විවිධ ප්‍රමාණවලින් යුත් ලෝහ කැබලිවල මුහුණත බර, පිරිසිදු බව සහ අගය යනාදිය සඳහන් කරන ලදි. පසුකාලීනව ඇති වූ අච්චු කාසිවලට පදනම වූයේ මෙයයි.
  - කාසි හා නෝට්ටු මුදල් භාවිතය
    - වටිනා ලෝහ මුදල් වශයෙන් භාවිතයට ගැනීමේ අපහසුතාවට පිළියමක් වශයෙන් නෝට්ටු මුදල් භාවිතයට ගන්නා ලදි.
    - රජයේ බලයලත් අධිකාරිය විසින් නිකුත් කරනු ලබන කාසි හා නෝට්ටු මෙයට අයත් වේ.

      ***නිදසුන්:***

      | | |
      |---|---|
      | ශ්‍රී ලංකාව | - රුපියල් ශත |
      | මහා බ්‍රිතාන්‍ය | - පවුම් ශත |
      | ඇ.එ. ජනපදය | - ඩොලර් ශත |
      | යුරෝපා සංගමයේ සමහර රටවල් | - යූරෝ ශත |

  - බැංකු මුදල් භාවිතය - බැංකු ජංගම ගිණුම් ආශ්‍රිතව නිකුත් කරනු ලබන චෙක්පත් වේ.
  - විද්‍යුත් මුදල් භාවිතය - තොරතුරු සහ ඩිජිටල් තාක්ෂණයේ දියුණුවත් සමඟ හඳුන්වාදුන් කාඩ්පත් විශේෂ තිබේ.

    ***නිදසුන්:*** ණයපත්, හරපත්, පෙර ගෙවුම් කාඩ්පත්

- පහත දැක්වෙන්නේ හොඳ මුදලක ලක්ෂණ කිහිපයක් බව.
  - පොදු පිළිගැනීමක් තිබීම
  - කල්පැවැත්ම
  - අනුකරණයේ දුෂ්කරතාව
  - පහසුවෙන් ගෙන යා හැකි වීම
  - පහසුවෙන් හඳුනාගත හැකිවීම හෙවත් සමජාතීය බව.
  - කුඩා කොටස්වලට බෙදිය හැකිවීම.

- පහත දැක්වෙන පරිදි මුදල් වර්ග කළ හැකි බව.
  - **ව්‍යවහාර මුදල්** (Currency)- මූල්‍ය අධිකාරියේ නියෝග මත නිකුත් කරන කාසි හා නෝට්ටු මෙලෙස හඳුන්වයි. නෛතික පිළිගැනීමක් ඇති මුදල් ය.

  - **බැංකු මුදල්** (Bank Money)
    වාණිජ බැංකු පවත්වාගෙන යන ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම්වල ශේෂ බැංකු මුදල් වේ. මේ මුදල් ගෙවීම් කටයුතු කරන්නේ චෙක්පත් හරහා ය. ව්‍යවහාර මුදල්වල මෙන්ම ද්‍රවශීලතාව 100%ක්ම නැතත් ආසන්න මුදල්වලට වඩා ද්‍රවශීලතාවෙන් යුක්ත ය.

  - **ආසන්න මුදල්** (Near Money)
    ව්‍යවහාර මුදල් මෙන් 100%ක් ද්‍රවශීලතාවෙන් යුක්ත නොවූ එහෙත් වටිනාකම් සන්නිධියක කාර්ය ඉටු කරනු ලබන පහසුවෙන් මුදල් බවට පත් කළ හැකි වත්කම් ය.
    ***නිදසුන්:*** වාණිජ බැංකුවල ඇති මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු, භාණ්ඩාගාර බිල්පත්, වාණිජ පත්‍රිකා

  - **විද්‍යුත් මුදල්** (E- Money)
    තොරතුරු හා ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවී ඇති, දේශීය මෙන් ම ජාත්‍යන්තර ගනුදෙනුවල දී ගෙවීම් කිරීමට යෙදාගනු ලබන මුදල් ය.
    ***උදාහරණ:***
    <u>හර කාඩ්පත් (Debit card)</u> - ගෙවනු ලබන මුදල් ප්‍රමාණය, විද්‍යුත් ලෙස ගිණුමට හර වන බැංකු ගිණුමේ මුදල් තිබෙන අයට පමණක් ලබාගත හැකි කාඩ් පත් ය.
    <u>ණය කාඩ්පත් (Credit card)</u> - බැංකු ගිණුමක් නොමැති වුවද ණය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා භාවිත කරන කාඩ්පත් විශේෂයකි.

    <u>පෙර ගෙවූ කාඩ්පත් (Pre paid card)</u> -කලින් මුදල් ගෙවා ලබා ගත හැකි කාඩ්පත් ය.

- මෙම කාඩ්පත් මගින් ගෙවීම් කිරීම පහසු කිරීම සඳහා යොදා ගනු ලබන පහසුකම් කිහිපයක් පහත දැක්වෙන බව.
  - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර - ATM යන්ත්‍ර (Automatic teller machine
  - වෙළෙඳසැල් ගෙවීම් විද්‍යුත් පැවරුම් ජාල - EFTPOS යන්ත්‍ර (Electronic funds transfer point of sales)
  - ටෙලි බැංකු පහසුකම් - Tele Banking
  - අන්තර්ජාල බැංකු කටයුතු - Internet Banking (Online banking)

**නිපුණතා මට්ටම 7.2** : ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පද්ධතිය ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට හා වර්ධනයට දායක වන ආකාරය අගය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- ශ්‍රී ලංකා මහබැංකු වාර්ෂික වාර්තාව පදනම් කර ගනිමින් ශ්‍රී ලංකාව් මූල්‍ය ආයතන වර්ග කරයි.
- දෙන ලද මූල්‍ය ආයතන සමූහය එක් එක් වර්ගය යටතේ වෙන් කොට දක්වයි.
- එක් එක් වර්ගයට අයත් මූල්‍ය ආයතන ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට දායක වන ආකාරය විමර්ශනය කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන පහත සඳහන් ආකාරයට වර්ග කළ හැකි බව.
  - ශ්‍රී ලංකා මහ බැංකුව
  - බැංකු අංශය
    - බලපත්‍රලාභී වාණිජ බැංකු
    - බලපත්‍රලාභී විශේෂිත බැංකු
  - තැන්පතු භාරගන්නා අනෙකුත් මූල්‍ය ආයතන
    - ලියාපදිංචි මූල්‍ය සමාගම්
    - සමුපකාර ග්‍රාමීය බැංකු
    - සකසුරුවම් හා ණයදෙන සමුපකාර සමිති
  - අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන
    - විශේෂිත කල්බදු සමාගම්
    - වණික් බැංකු
    - ප්‍රාථමික වෙළෙඳුන්
    - කොටස් තැරැව්කාර සමාගම්
    - ඒකක භාර
    - ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්
    - ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන
  - ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන
    - රක්ෂණ සමාගම්
    - සේවක අර්ථසාධක අරමුදල
    - සේවක භාරකාර අරමුදල
    - අනෙකුත් අර්ථසාධක අරමුදල්
    - රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල

(2008 මහබැංකු වාර්ෂික වාර්තාව අනුව)

- බලපත්‍රලාභී වාණිජ බැංකුවක් යනු ඉල්ලුම් තැන්පතු හෙවත් ජංගම ගිණුම් ඇතුළු අනෙකුත් තැන්පතු ගිණුම් පවත්වාගෙන යමින්, මුදල් මැවීමට හැකියාව ඇති විදේශ විනිමය ගනුදෙනුවල යෙදෙන මූල්‍යායතන විශේෂයක් බව.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ ලියාපදිංචි බලපත්‍රලාභී වාණිජ බැංකු රාශියක් ඇති බව හා මේවායින් කිහිපයක් රාජ්‍ය අංශයට ද, බහුතරයක් පෞද්ගලික අංශයට ද අයත් බව.

- බලපත්‍රලාභී වාණිජ බැංකු තැන්පතු බාර ගැනීම සහ ණයදීම ඇතුළු සේවා රාශියක් ඉටු කරන බව හා එම සේවා නිසා ව්‍යාපාර කටයුතු වඩාත් පහසුවන බව සිසුන්ට පැහැදිලි කර දෙන්න. (වාණිජ බැංකුවල සේවා 7.3 හා 7.4 නිපුණතා මට්ටම්වල දැක්වේ.)

- බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් යන්න පහත පරිදි හැඳින්විය හැකි බව.

  බැංකු පනත යටතේ විශේෂිත බැංකු ව්‍යාපාර කටයුතු කරගෙන යාමට මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති ආයතන විශේෂයකි. මෙහි ඇති විශේෂත්වය නම් ජංගම ගිණුම් පවත්වාගෙන යාමට හා විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමට අවසර නොමැතිවීම යි. එහෙත් ඉතිරිකිරීමේ ගිණුම් හා කාලීන තැන්පත් ගිණුම් වශයෙන් මහජනතාවගෙන් මුදල් තැන්පත් භාර ගැනීමට අවසර ඇත.

- තැන්පතු භාර ගැනීම හා ණයදීම ඇතුළු පොදුවේ මෙම බැංකු විසින් ඉටුකරන සේවා ව්‍යාපාර කටයුතුවලට වැදගත් වන ආකාරය පැහැදිලි කර දෙන්න.
- බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- ලියාපදිංචි මූල්‍ය සමාගම් පහත සඳහන් පරිදි පැහැදිලි කළ හැකි බව.
  - කාලීන තැන්පතු භාර ගැනීම සහ එම මුදල් මත ණයදීම සහ අයෝජනයට පහසුකම් සලසන, මූල්‍ය සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවෙන් බලපත්‍රයක් ලබාගෙන ඇති පොදු සමාගම් විශේෂයකි, මූල්‍ය සමාගම්.

- මූල්‍ය සමාගම්වල කාර්ය කිහිපයක් පහත දැක්වෙන බව.
  - කුලීපිට ගැනුම් පහසුකම් සැපයීම
  - දේපළ හා ඉඩම් වෙළෙඳාම් කිරීම
  - කල්බදු මූල්‍යකරණය
  - කෙටිකාලීන ණය සැපයීම
  - වාණිජ බැංකු සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය
  - කාලීන තැන්පතු භාර ගැනීම
- මෙම කාර්ය ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට හා වර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න
- ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා නිදසුන් කිහිපයක් දක්වන්න.

- සමුපකාර ග්‍රාමීය බැංකු ඉටු කරන කාර්ය කිහිපයක් පහත දැක්වෙන බව.
    - සාමාජික හා සාමාජික නොවන්නන්ගෙන් තැන්පත් ලබා ගැනීම.
    - උකස් කටයුතු කිරීම
    - විවිධ තැන්පත් ගිණුම් පවත්වා ගැනීම.(ඉතිරිකිරීමේ තැන්පතු ගිණුම්, ස්ථාවර තැන්පතු ගිණුම්)
    - සාමාජිකයන්ට කෘෂිකර්මය, නිෂ්පාදනය, කර්මාන්ත හා අලෙවි කටයුතු සඳහා ණය පහසුකම් සැලසීම.
    - සමුපකාර ජීවන ක්‍රමය ගැමිජනතාව අතර ප්‍රචලිත කිරීම

- සකසුරුවම් හා ණයදෙන සමුපකාර සමිති ද ව්‍යාපාර කටයුතුවල දී සහාය සලසන බව.
  මේවා පිහිටුවා ඇත්තේ ඉතිරි කිරීම් දිරිමත් කිරීමත්, සාමාජිකයනට ණය සැපයීමත් අරමුණු කරගෙන ය. සමාජිකයන්ගෙන් ඉතුරුම් ලෙස හා සාමාජික කොටස් ලෙස මුදල් ලබාගෙන සාමාජිකයන්ට පමණක් ණය සපයයි. සමුපකාර පනත යටතේ සමුපකාර කොමසාරිස් වෙත ලියාපදිංචි වී අවසරය ලබා ගත යුතු ය.

- විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් පහත පරිදි හැඳින්විය හැකි බව.
  ව්‍යාපාරිකයන්ට අවශ්‍ය යන්ත්‍රෝපකරණ හා වෙනත් වත්කම් පාවිච්චි කිරීම පිණිස ව්‍යාපාරිකයින්ගේ ඉල්ලීම පරිදි බද්දට ගැනීම සඳහා මූල්‍ය පහසුකම් සැපයීම ප්‍රධාන ව්‍යාපාරික කටයුත්ත කරගත් මූල්‍ය ආයතන විශේෂයකි. අදාළ වත්කම් බද්දට දීමෙන් ලැබෙන කුලී ආදායම් මෙම ආයතනවල ප්‍රධාන ආදායම වේ.

- කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - විශාල වටිනාකමින් යුත් වත්කම්, මුළු මුදලම නොගෙවා භාවිතයට ඉඩකඩ සැලසීම.
    - කල්බදු සඳහා ගෙවන කුලිය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
    - යන්ත්‍ර යල්පැනීම නිසා සිදුවන පාඩු හා ප්‍රාග්ධන දුෂ්කරතා මගහැරීම.
    - ව්‍යාපාරයේ ශේෂ පත්‍රයේ වගකීම් ලෙස ප්‍රදර්ශනය නොවීම.
    - විශාල මුදලක් ආයෝජනය නොකර වැඩි ආදායමක් ඉපයීමේ හැකියාව
- කල්බදු සමාගම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- කොටස් තැරැව්කාර සමාගම් පහත සඳහන් පරිදි හැඳින්විය හැකි බව.
  සංස්ථාපිත සමාගම්වල කොටස් හෝ ණයකර විකිණීම සහ මිලට ගැනීම සම්බන්ධ කටයුතු කිරීමට අතරමැදියන් ලෙස කටයුතු කරන ආයතන තැරැව්කාර සමාගම් වශයෙන් සැලකේ. කොටස් වෙළෙඳපොළ ආයෝජකයින් වෙනුවෙන් මෙම තැරැව්කාර ආයතන සේවා රැසක් ඉටුකරයි.
- කොටස් තැරැව්කාර සමාගම් ඉටුකරන ව්‍යාපාරික සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
    - ආයෝජකයින්ගේ ගැනුම් ඇණවුම් හා විකුණුම් ඇණවුම් භාර ගැනීම.
    - ආයෝජකයින් වෙනුවෙන් මධ්‍යම තැන්පතු ක්‍රමයේ ගිණුම් විවෘත කිරීම.
    - කොටස් හා ණයකරවල ආයෝජනය සම්බන්ධ උපදෙස් ආයෝජකයින්ට සැපයීම.

- කොටස් වෙළෙඳපොළ විශ්ලේෂණය කිරීම සහ වෙළෙඳපොළ සමීක්ෂණ වාර්තා සැකසීම මගින් ආයෝජකයන්ගේ ප්‍රතිලාභ උපරිම කිරීම සහතික කිරීම
    - සමාගම් ලැයිස්තුගත කිරීමට අනුග්‍රහය දැක්වීම.
    - සීමාසහිත පොදු සමාගම්වලට ප්‍රාග්ධන සම්පාදනය සඳහා සහායවීම.
- කොටස් තැරැව්කාර සමාගම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

(කොටස් තැරැව්කාර සමාගම් පිළිබඳ ව 15.9 නිපුණතා මට්ටමේ දී ද සාකච්ඡා කෙරේ)

- වාණිජ බැංකු පහත පරිදි හැඳින්විය හැකි බව.
    - ව්‍යාපාරිකයින්ට උපදේශන සේවා, කළමනාකරණ සේවා වැනි විශේෂඥ සේවා සපයන එහෙත් තැන්පතු භාර නොගන්නා ආයතන වාණිජ බැංකු ලෙස සැලකේ.
- වාණිජ බැංකු සපයන ව්‍යාපාරික සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
    - ව්‍යාපෘති වාර්තා සකස් කරදීම.
    - මූල්‍ය හා අලෙවි උපදේශන සේවා සැපයීම.
    - ප්‍රාරක්ෂණ කටයුතු කිරීම
    - කල්බදු පහසුකම් සැපයීම
- වාණිජ බැංකු සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- ඒකකභාර පහත සඳහන් පරිදි හැඳින්විය හැකි බව.

ඒකකභාරයක් යනු ආයෝජකයන්ට ඒකක විකිණීමෙන් එක්රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස්කර ගත් මුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කලඹක යොදවනු ලැබේ.එහි ප්‍රතිලාභ ඒකකභාරයේ ඒකක මිලටගත් ආයෝජකයන් අතර බෙදාහරිනු ලැබේ.

- ඒකකභාරයක සංවිධානය පාර්ශ්ව තුනකින් සමන්විත වන බව.
    - ඒකක භාරකරු
    - අරමුදල් කළමනාකරණ සමාගම
    - ඒකක හිමියන් හෙවත් ආයෝජකයන්
- ඒකකභාරවල ආයෝජනයෙන් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වෙන බව
    - විවිධාංගීකරණය වූ ආයෝජනවල මුදල් යෙදවීම නිසා අවදානම අඩුවීම.
    - ආයෝජන කළමනාකරණය සඳහා වෘත්තීය කළමනාකරුවන්ගේ සේවය ලබා ගත හැකිවීම.

- ඒකකභාර සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් (Venture capital companies) ද ව්‍යාපාරික සේවා සපයන බව. නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් කටයුතු කරන සමාගම් විශේෂයකි. නව ව්‍යාපාර ආරම්භ කිරීම, පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර පවරා ගැනීම හා මිලදී ගැනීම වැනි කටයුතුවලදී අරමුදල් සපයයි. මීට අමතරව කොටස් ප්‍රාරක්ෂණය හා ණයසම්මේලනය කිරීම ආදියෙහි ද යෙදේ.

- ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම් සඳහා නිදසුන් ඉදිරිපත් කරන්න.

- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් ද ව්‍යාපාරික සේවා සපයන බව.
  මූල්‍ය වෙළෙඳපොළේ ණය උපකරණවල ආයෝජනය කරන ආයෝජකයන්ට ඒවායේ ගුණාත්මක තත්ත්වය නිවැරදි ව හඳුනාගෙන ආයෝජන තේරීම් කිරීමට විධිමත් මගපෙන්වීමක් මේවායින් සලසා ඇත. ණය ශ්‍රේණිගත කිරීම යනු ණය හෝ මූල්‍ය උපකරණ හෝ නිකුත් කරන්නාගේ මූල්‍ය ශක්තිය පිළිබඳ ඇගයීමක් ඉදිරිපත් කිරීමකි. ණය මුදලක් දුන් විට ණය ආපසු ලැබීමේ සම්භාවිතාව ණයහිමියාට හෝ ආයෝජකයාට මේ මගින් දැන ගැනීමට හැකිවේ. ණය ශ්‍රේණිගත කිරීම සඳහා පොදු නිර්ණායක භාවිත කරන බැවින් ඒවා ජාත්‍යන්තර ව සන්සන්දනය කළ හැකියි.

- ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට නිදසුන් ඉදිරිපත් කරන්න.

- ගිවිසුම්ගත ඉතිරිකිරීම් ආයතන ද ව්‍යාපාරික සේවා සපයන බව.
  **රක්ෂණ සමාගම්**
  විවිධ රක්ෂණ ඔප්පු මහජනයාට ලබාදීම මගින් අරමුදල් සපයා ගනී. මූල්‍ය වෙළෙඳපොළ ණය හා ආයෝජනය කිරීම මගින් මූල්‍ය අතරමැදිකරණයක නිරත වේ.
  **අර්ථසාධක සහ විශ්‍රාම අරමුදල්**
  කම්කරු පනත යටතේ ස්ථාපිත ය. සේව්‍ය සේවක දෙපක්ෂයෙන් ම දායක මුදල් ලබා ගනියි. සේවකයන් විශ්‍රාම යන අවස්ථාවේ දී දායක මුදල් සමඟ ප්‍රතිලාභ (පොලී ආදායම්) ආපසු ලබා දෙයි.

**නිපුණතා මට්ටම 7.3** : වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු සහ සපයන ණය ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට හා වර්ධනයට කරන බලපෑම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- වාණිජ බැංකු විසින් පවත්වාගෙන යනු ලබන විවිධ තැන්පතු වර්ග හඳුන්වයි.
- වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු අතර සමාන අසමානකම් සන්සන්දනය කරයි.
- වාණිජ බැංකු පවත්වාගෙන යන විවිධ තැන්පතු වර්ග ව්‍යාපාරිකයකුට වැදගත් වන ආකාරය පෙන්වා දෙයි.
- වාණිජ බැංකු සපයන ණය වර්ගීකරණය කරයි.
- වාණිජ බැංකු විසින් සපයන ණය වර්ගවල සුවිශේෂ ලක්ෂණ වගුගත කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- වාණිජ බැංකු පහත සඳහන් තැන්පතු වර්ග පවත්වාගෙන යන බව.
  - **ජංගම ගිණුම් (ඉල්ලුම් තැන්පතු)**

    චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුකම් ඇති, ශේෂය මත පොළී හිමි නොවන ගිණුම් වර්ගයකි. බැංකු අයිරා පහසුකම් සැලසෙන අතර ටෙලර්පත් භාවිතයෙන් ගනුදෙනු කළ හැකි ය.

  - **ඉතිරිකිරීමේ ගිණුම්**

    ඉතිරිකිරීමේ පරමාර්ථයෙන් හඳුන්වා දී ඇති මෙම ගිණුම් වර්ගයට ශේෂය මත පොළියක් හිමි වේ. තැන්පත්කරුගේ අභිමතය පරිදි මුදල් තැන්පත් කිරීම හා ආපසු ගැනීම කළ හැකි ය. ටෙලර්පත් මගින් ද ගනුදෙනු කළ හැකිය.

  - **ස්ථාවර තැන්පතු**

    නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා නිශ්චිත මුදල් ප්‍රමාණයක්, නිශ්චිත පොළියක් යටතේ තැන්පත් කිරීමකි. ඉහළ පොළියක් හිමිවේ.

- ජංගම ගිණුමක් පවත්වා ගැනීමෙන් ව්‍යාපාරිකයන්ට පහත දැක්වෙන පහසුකම් ලබා ගත හැකි බව.
  - චෙක්පත් මගින් ගෙවීම් කළ හැකිවීම.
  - ප්‍රේෂණ පහසුකම් ලබා ගත හැකිවීම.
  - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකිවීම.
  - අයිරා පහසුකම් ලබා ගත හැකිවීම.
  - ගිණුම් වාර්තා ලබා ගත හැකිවීම.

- වාණිජ බැංකු සපයන ණය පහසුකම් පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකි බව.
  - අයිරා
  - සාමාන්‍ය ණය

- බැංකු අයිරා යනු ජංගම ගිණුමේ  බැර ශේෂය ඉක්මවා කිසියම් නිශ්චිත මුදල් ප්‍රමාණයක් දක්වා චෙක්පත් නිකුත් කිරීමට වාණිජ බැංකු විසින් ලබාදෙන අනුමැතියක් බව.
- තාවකාලික අයිරා හා ස්ථාවර අයිරා ලෙස අයිරා වර්ග දෙකක් පවතින බව.

- බැංකු ණය යනු කිසියම් පොළී ප්‍රතිශතයක් යටතේ ලබා ගන්නා ණය මුදල හා  අදාළ පොළිය ආපසු ගෙවීමට යටත්ව,  ගිවිසගත් කොන්දේසි යටතේ බැංකුවක් විසින් දෙනු ලබන මුදලක් බව.
- බැංකු ණය, ව්‍යාපාරික ණය සහ පාරිභෝගික ණය ලෙස වර්ග කළ හැකි බව.
- ව්‍යාපාරික ණය යනු පුද්ගලයෙකුට  හෝ ආයතනයකට ව්‍යාපාරික කටයුතු වෙනුවෙන් කෙටිකාලීන ව, මධ්‍යකාලීන ව හා දිගුකාලීන ව ණය සැපයීම බව.
- පාරිභෝගික ණය යනු වත්කම් මිලට ගැනීමට සහ හදිසි ආපදාවලදී  පිරිමසා ගැනීමට පාරිභෝගිකයින්ට බැංකුව විසින් සපයන ණය බව.

**නිපුණතා මට්ටම 7.4** : වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා ව්‍යාපාරවල ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

## ඉගෙනුම් ඵල

- වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා ලැයිස්තු ගත කරයි.
- වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා වෙන වෙනම පැහැදිලි කරයි.
- එම සේවා ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පෙන්වා දෙයි.
- තෝරාගත් ව්‍යාපාරයක් වාණිජ බැංකුවලින් ලබාගෙන ඇති අනෙකුත් සේවා විමසා ලැයිස්තු ගත කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක්

- වාණිජ බැංකු සපයන අනෙකුත් සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
  - **කල්බදු සේවා**
  - **ණයවර ලිපි නිකුත් කිරීම**

    ආනයනකරුගේ ඉල්ලීම මත ආනයනකරුගේ බැංකුව විසින් ආනයනකරු වෙනුවෙන් මුදල් ගෙවන බවට එකඟවෙමින් අපනයනකරුගේ බැංකුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ල ණයවර ලිපිය බව.

  - **සංචාරක චෙක්පත් නිකුත් කිරීම**

    පොදුවේ පිළිගන්නා මුදල් වර්ගවලින් විවිධ වටිනාකම් යටතේ නිකුත් කරයි. නිකුත් කිරීමේ දී ගාස්තු අය කරයි. ඒවා අදාළ මූල්‍ය ආයතනයේ ආදායම් ය. දෙස් විදෙස් සංචාරකයන්ගේ ගනුදෙනු පහසුවෙන් හා ආරක්ෂාකාරීව කිරීම සඳහා සංචාරක චෙක්පත් වැදගත් වේ.

  - **සුරක්ෂිතාගාර පහසුකම්**

    පුද්ගලයන්ගේ රන්, රිදී, මැණික්, ආභරණ, ඔප්පු වැනි වටිනා භාණ්ඩ හා වැදගත් ලියවිලි ආරක්ෂා කරදීම සඳහා පිහිටුවා ඇති සේප්පු විශේෂයකි.

  - **විදේශ විනිමය මිලදී ගැනීම හා විකිණීම**

    විනිමය පාලන නියමයන්ට යටත්ව ගනුදෙනුකරුවන් විදේශ විනිමය මිලට ගැනීමත්, ඔවුන්ට විදේශ විනිමය විකිණීමත් වාණිජ බැංකු කරයි.

- **නියෝජිත සේවා**

  අවශ්‍ය අවස්ථාවල දී සිය ගනුදෙනුකරුවන් වෙනුවෙන් නියෝජිතයෙකු ලෙස වාණිජ බැංකුව කටයුතු කරයි.

- **ස්වයංක්‍රීය බැංකු සේවා**

  ස්වයංක්‍රීය බැංකු සේවා නිසා බැංකුවලට හා ගනුදෙනුකරුට පහත සඳහන් වාසි අත්වන බව.

| බැංකුවලට අත්වන වාසි | ගනුදෙනුකරුට අත්වන වාසි |
|---|---|
| • පිරිවැය අඩුවීම<br>• තදබදය අඩුවීම<br>• නිවැරදිතාව ඉහළවීම<br>• කාර්ය මණ්ඩලය අඩුකර ගත හැකිවීම.<br>• බැංකු සේවා පුළුල් වී බැංකුවල ලාභදායිත්වය වැඩිවීම. | • පැය 24 පුරා ගනුදෙනු කළ හැකි වීම<br>• කාලය ඉතිරි වීම.<br>• බිල්පත් ගෙවීම් පහසුවීම<br>• ගිණුමේ තොරතුරු ලබා ගත හැකිවීම.<br>• ගිණුමකින් තවත් ගිණුමකට මුදල් මාරු කර ගත හැකිවීම |

- **ණයපත් සේවාව**

  කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකිවන පරිදි වාණිජ බැංකු හෝ බලයලත් ආයතන විසින් නිකුත් කරන කාඩ්පත් විශේෂයකි.

  ***නිදසුන්:***

  වීසා කාඩ්
  මාස්ටර් කාඩ්
  ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්

- **ටෙලිබෑන්කින් සේවය (Tele Banking)**

  ගනුදෙනුකරුවන්ට බැංකුව වෙත නොගොස් දුරකථනය භාවිතයෙන් වාණිජ බැංකු සේවා ඉටුකර ගැනීමට මේ ක්‍රමය යටතේ හැකියාව ඇත.

- **මංගත බැංකුකරණය (Online Banking)**

  අන්තර්ජාලය ඔස්සේ බැංකුවේ වෙබ් අඩවියට පිවිස රහස් අංකය භාවිතයෙන් ස්වයංක්‍රීයව බැංකු පහසුකම් ලබා ගැනීම මින් අදහස් කරයි. විද්‍යුත් බැංකුකරණය, ගෘහස්ත බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය වැනි නාමයන්ගෙන් ද මෙම ක්‍රමය හඳුන්වයි.

- **උකස් සේවා**

  ස්වර්ණාභරණ ඇපයට ගෙන හදිසි මුදල් අවශ්‍යතා සඳහා ණය ලබාදීම වාණිජ බැංකු විසින් සිදුකරන වැදගත් සේවාවකි.

- **මුදල් ප්‍රේෂණ කටයුතු**

  ගිණුම් හිමියා වෙනුවෙන් ඔහුට ලැබීමට ඇති මුදල් ඔහුගේ ගිණුමට රැස් කිරීම මෙයින් අදහස් වේ.

- කාලීන වශයෙන් වාණිජ බැංකු හඳුන්වා දෙන අනෙකුත් සේවා පැහැදිලි කරන්න.

**නිපුණතා මට්ටම 7.5 :** චෙක්පත් භාවිතයෙන් ගනුදෙනු පහසු කරගත හැකි ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- චෙක්පත නිර්වචනය කරයි.
- ඉදිරිපත් කරනු ලබන චෙක්පත් අධ්‍යයනයෙන් ඒවායේ මූලික කරුණු පැහැදිලි කරයි.
- චෙක්පතකට සම්බන්ධ ප්‍රධාන පාර්ශව නම් කර පැහැදිලි කරයි.
- චෙක්පත් වර්ග කරයි.
- ධාරක චෙක්පත් හා විධාන චෙක්පත් අතර වෙනස පැහැදිලි කරයි.
- චෙක්පත් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු ඉදිරිපත් කරයි.
- චෙක්පත් රේඛනය හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරයි.
- දෙන ලද රේඛිත චෙක්පත් අධ්‍යයනයෙන් ඒවායේ ඇති රේඛන වර්ග කරයි.
- සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය කළ හැකි ආකාර පැහැදිලි කරයි.
- චෙක්පත් පිටසන් කිරීම හඳුන්වයි.
- චෙක්පත් අගරුවීම හඳුන්වා අගරුවන අවස්ථා පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ජංගම ගිණුම් හිමියෙකු විසින් (අණකරු) එහි සඳහන් මුදල නම් සඳහන් පුද්ගලයාට (ආදායකයාට) හෝ රැගෙන එන අයෙකුට ගෙවන ලෙස බැංකුවට (අණලද්දා) කරනු ලබන ලිඛිත නියෝගය චෙක්පතක් ලෙස අර්ථකතනය කළ හැකි බව.
- චෙක්පතක මූලික ලක්ෂණ පහත දැක්වෙන බව.
    - දිනය
    - බැංකුවේ නම හා ශාඛාවේ නම
    - ආදායකයාගේ නම
    - හෝ රැගෙන එන්නාට යන යෙදුම
    - මුදල අකුරෙන් හා ඉලක්කමෙන්
    - ගෙවනු යන පදය
    - අණකරුගේ අත්සන
    - චුම්බක හැඳුනුම් තීරය (චෙක්පත් අංකය, බැංකුවේ අංකය, ශාඛාවේ අංකය හා ගිණුම් අංකය)
- චෙක්පතකට විවිධ පාර්ශව සම්බන්ධ වන බව.
    - අණකරු
    - අණලදු
    - ආදායකයා

- පහත සඳහන් පරිදි චෙක්පත් වර්ග කළ හැකි බව.
    - ධාරක චෙක්පත්
    - විධාන චෙක්පත්
- චෙක්පත් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් පහත දැක්වෙන බව.
    - ලිවීමේ දී නොමැකෙන තීන්ත වර්ගයක් භාවිත කළ යුතු ය.
    - පිලිපතේ අදාළ විස්තර සටහන් කළ යුතු ය.
    - ලිවීමේ දී සිදුවන වැරදි තනි ඉරකින් කපා අණකරුගේ සම්පූර්ණ අත්සන යෙදිය යුතු ය.
    - අණකරුගේ අත්සන නියම ආකාරයෙන් යෙදීම.
    - චෙක්පතට යොදන දිනය හා ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම.
    - හිස් චෙක්පතකට අත්සන නොයෙදීම.
- චෙක්පතක මුහුණත හරහා, සමාන්තර රේඛා දෙකක් ඇඳීම හෝ වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම චෙක්පත රේඛනය කිරීම ලෙස අර්ථකතනය කළ හැකි බව. මෙසේ රේඛනය කරන ලද චෙක්පත් රේඛිත චෙක්පත් ලෙස හැඳින්වෙන බව.
- චෙක්පතට අමතර ආරක්ෂාව සැලසීම සඳහා චෙක්පත් රේඛනය කරන බව.
- සාමාන්‍ය රේඛනය හා විශේෂ රේඛනය ලෙස චෙක්පත් රේඛන වර්ග කළ හැකි බව.
- ගණුදෙනු කළ නොහැක යන වගන්තිය සහිත ව හෝ රහිත ව චෙක්පතේ මුහුණත හරහා සරල සමාන්තර රේඛා දෙකක් ඇඳීම සාමාන්‍ය රේඛනය බව.

**නිදසුන් :**




- රේඛිත ඉරි සහිත ව හෝ රහිත ව චෙක්පතක මුහුණත හරහා වාණිජ බැංකුවක නමක් සඳහන් කිරීම විශේෂ රේඛනය බව.

**නිදසුන් :**



- චෙක්පතෙහි මුහුණත සඳහන්වන ආකාරයටම ආදායකයා සිය නම චෙක්පතේ පිටුපස ලිවීම චෙක්පත් පිටසන් කිරීම ලෙස හැඳින්වෙන බව. පහත සඳහන් අවස්ථාවල පිටසන යෙදිය යුතු බව.
    - ආදායකයා විසින් චෙක්පත බැංකුවෙහි තැන්පත් කිරීමේ දී
    - විධාන චෙක්පතක් නම් අන් අයෙකුට පවරන අවස්ථාවේ දී
    - රේඛනය නොකරන ලද චෙක්පත් බැංකු කවුන්ටරයට දී මුදල් ලබා ගැනීමේ දී
- ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කළ චෙක්පතට මුදල් ගෙවීම බැංකුව ප්‍රතික්ෂේප කළ හැකි ය. මෙය චෙක්පතක් අගරුවීම ලෙස හැඳින්වෙන බව.
- චෙක්පතක් අගරුවීම සඳහා බලපාන හේතු කිහිපයක් පහත දැක්වෙන බව.
    - අණකරු විසින් ගෙවීම් නතර කර තිබීම.
    - අණකරු මරණයට පත්වීම හා ඒ බව බැංකුවට දැනුම් දී තිබීම.
    - අණකරු බුන්වත්වීම.
    - ගානිෂි නියෝගයක් ලැබීම.
    - ලිඛිත වැරදි
    - ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති වීම

**නිපුණතා මට්ටම 7.6 :** විද්‍යුත් මුදල් භාවිතයෙන් ගනුදෙනු පහසු කරගත හැකි ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- විද්‍යුත් මුදල් පැහැදිලි කරයි.
- භාවිතයේ පවත්නා විවිධ විද්‍යුත් මුදල් වර්ග පැහැදිලි කරයි.
- විද්‍යුත් මුදල් කාඩ්පතක ලක්ෂණ හා එම කාඩ්පතකට සම්බන්ධ පාර්ශව පැහැදිලි කරයි.
- විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි ලැයිස්තුගත කරයි.
- භාවිත වන එක් එක් විද්‍යුත් මුදල් වර්ගවල සුවිශේෂතා වගුගත කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගනුදෙනුවල දී භාවිත කරන ණය කාඩ්පත් (Credit card), හර කාඩ්පත් (Debit card) වැනි ප්ලාස්ටික් මුදල් කාඩ්පත් විද්‍යුත් මුදල් ලෙස හැඳින්වෙන බව.
- කිසියම් නිශ්චිත වටිනාකමක් දක්වා අනුමත වෙළෙඳ ආයතනවලින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට හැකි වන පරිදි වාණිජ බැංකුවක් හෝ බලයලත් ආයතනයක් විසින් නිකුත් කරනු ලබන කාඩ්පත් විශේෂය ණයපතක් ලෙස හඳුන්වන බව.
- බැංකු ගිණුම් හිමියෙකුට, තම ගිණුමේ ඇති මුදල් වෙළෙඳසැල් ගෙවීම් පියවීමට පැවරීම සඳහාත්, ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් මුදල් ආපසු ලබා ගැනීම සඳහාත් බැංකුව විසින් නිකුත් කරනු ලබන ප්ලාස්ටික් කාඩ්පත් විශේෂය හරපත් බව.
- විද්‍යුත් මුදල්වලින් ගනුදෙනු පියවීමේ දී පහත සඳහන් පාර්ශව සම්බන්ධ වන බව.
  - කාඩ්පත් හිමියා
  - කාඩ්පත් නිකුත් කරන බැංකුව
  - වෙළෙන්දා හෙවත් විකුණුම්කරු
  - ණයපත් සංගමය
- විද්‍යුත් මුදල් කාඩ්පත්වල පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි බව.

  <u>විද්‍යුත් මුදල් කාඩ්පතක මුහුණත සඳහන් ලක්ෂණ</u>
  - නිකුත් කරන ලද බැංකුවේ ලාංඡනය (LOGO)
  - ත්‍රිමාණ චිත්‍රය (Hologram)
  - කාඩ්පත් අංකය
  - සන්නාම් ලාංඡනය (Brand Logo)
  - කල් ඉකුත්වන දිනය
  - කාඩ්පත් හිමියාගේ නම

විද්‍යුත් මුදල් කාඩ්පතක පිටුපස සඳහන් ලක්ෂණ

- කාන්දම් පටිය (Magnetic Stripe)
- අත්සන් පටිය (Signature Stripe)
- කාඩ්පතේ ආරක්ෂිත සංකේතය (Card Security Code)
- නිකුතු ආයතනයේ නම හා කොන්දේසි
- ගනුදෙනුකරු සේවා දුරකථන අංකය (Customer Service Hotline)

- ණය කාඩ්පත් භාවිතයෙන් ගනුදෙනු කිරීම තුළින් **ගනුදෙනුකරුට** පහත සඳහන් වාසි හිමිවන බව.
  - පහසුව
  - යම් කාලසීමාවක් දක්වා පොළී රහිත ණයක් ලැබීම
  - විදේශ ගනුදෙනු සඳහා ද යොදාගත හැකි වීම
  - අනුමත සීමාව තුළ ATM යන්ත්‍ර මගින් මුදල් ලබා ගත හැකි වීම
  - මුදල් එහා මෙහා ගෙන යාමේ අවදානම ඉවත් වීම
  - වට්ටම් / ප්‍රසාද ලකුණු හිමි වීම
- ණය කාඩ්පත් භාවිතයෙන් ගනුදෙනු කිරීම තුළින් **ගනුදෙනුකරුට** පහත සඳහන් අවාසි ද සිදුවන බව.
  - පිරිවැයක් දැරීමට සිදුවීම
  - ගෙවීම් පමා වූ විට ප්‍රමාද ගාස්තු හා ඉහළ පොළී අය කිරීම
  - සෑම වෙළෙඳසැලකදීම ගෙවීම් කිරීමට නොහැකි වීම
  - වංචනික ක්‍රියා සිදුවීම
  - අනවශ්‍ය ලෙස පරිභෝජනයට නැඹුරු වීම
- ණය කාඩ්පත් භාවිතයෙන් **ව්‍යාපාරිකයන්ට** පහත සඳහන් වාසි හිමිවන බව.
  - ණයට විකුණුම් සඳහා මුදල් ලැබීම ස්ථිර වීම
  - පිරිවැටුම වැඩිවීම නිසා ලාභය ඉහළ යාම
  - ගනුදෙනු පහසු වීම
  - නොමිලේ ප්‍රචාරණයක් ලැබීම
- ණය කාඩ්පත් භාවිතයෙන් **ව්‍යාපාරිකයන්ට** පහත සඳහන් අවාසිවලට ද මුහුණ දීමට සිදුවන බව.
  - බැංකුවට කොමිස් මුදල් ගෙවීමට සිදුවීම
  - විශේෂ යන්ත්‍රයක් ස්ථාපිත කිරීමට සිදුවීම
- හර කාඩ්පත් භාවිතයෙන් ගනුදෙනු කිරීම තුළින් **ගනුදෙනුකරුට** පහත සඳහන් වාසි හිමිවන බව.
  - ගනුදෙනුව ගිණුම මගින් පියවීම
  - ගනුදෙනුව පිළිබඳ වාර්තාවක් තිබීම

- වට්ටම් ලැබීම
- චෙක්පත් භාර ගැනීමට සමහර වෙළෙඳුන් මැලිකමක් දැක්වූව ද හරපත්වලට පිළිගැනීම වැඩිවීම
- හරපත භාවිත කර ATM මගින් ගිණුමේ මුදල් ආපසු ලබා ගත හැකි වීම
- මුදල් එහා මෙහා ගෙන යාමේ අවධානම අඩුවීම

- හර කාඩ්පත් භාවිතයෙන් ගනුදෙනු කිරීම තුළින් **ගනුදෙනුකරුට** පහත සඳහන් අවාසි ද සිදුවන බව.
  - පිරිවැයක් දැරීමට සිදුවීම
  - තාක්ෂණික දෝෂ නිසා පරිහරණ ගැටලු මතුවීම
  - ආරක්ෂාව අඩුවීම. PIN අංකය වංචා කර වෙනත් කෙනෙකුට භාවිත කළ හැකිවීම.
  - ගිණුමේ මුදල් ශේෂය ඉක්ම වූ විට ගනුදෙනු කළ නොහැකි වීම

**නිපුණතා මට්ටම 7.7 :** ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය විමසා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- ශ්‍රී ලංකා මහ බැංකුව පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය ලැයිස්තුගත කරයි.
- තොරතුරු අධ්‍යයනය කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යභාරය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය ව්‍යාපාර කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- 1949 අංක 58 දරණ මූල්‍ය පනත යටතේ 1950 අගෝස්තු 28 දින ආරම්භ කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරනු ලබන කේන්ද්‍රීය ආයතනය බව.
- පස් දෙනෙකුගෙන් සමන්විත මුදල් මණ්ඩලයක් මගින් මහ බැංකුවේ සංවිධාන කටයුතු සිදු කරන අතර එම මුදල් මණ්ඩලය, මහබැංකු අධිපති, මුදල් විෂය භාර අමාත්‍යාංශ ලේකම් හා පත්කළ සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත බව.
- ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රධාන අරමුණු දෙකක් පෙරදැරිව කටයුතු කරන බව.
    - ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යාම
    - මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වාගෙන යාම
- ව්‍යවහාර මුදල්වල අගය සුරක්ෂිත ව පැවතීම මිල ස්ථායිතාව වන අතර, තිරසාර ආර්ථික වර්ධනයක් හා ඉහළ සේවා නියුක්තියක් ඇති කිරීමට මෙය ඉවහල් වන බව.
- ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව වන අතර, තැන්පත්කරුවන් හා ආයෝජකයන් යන දෙපාර්ශවයටම හිතකර තත්ත්වයක් මෙමගින් උදාවේ.
- මහ බැංකුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පහත කාර්යයන්හි නියැලෙන බව.
    - මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවීම
    - විනිමය අනුපාතික ප්‍රතිපත්තිය මෙහෙයවීම
    - ශ්‍රී ලංකාවේ නිල විදේශ සංචිත කළමනාකරණය
    - ව්‍යවහාර මුදල් නිකුත් කිරීම හා බෙදා හැරීම
    - බැංකු හා බැංකු නොවන ආයතනවල අධීක්ෂක ලෙස කටයුතු කිරීම
    - රජයේ ආර්ථික උපදේශක, බැංකුකරු සහ මූල්‍ය නියෝජිතයා වශයෙන් කටයුතු කිරීම
    - මහ බැංකුවේ පියවීම් ගිණුම් පවත්වාගෙන යන වාණිජ බැංකුවලට හා ප්‍රාථමික වෙළෙඳුන්ට නිෂ්කාශන සහ පියවීමේ පහසුකම් සැපයීම

- ඉහත ප්‍රධාන කාර්යයන්ට අමතර ව පහත දැක්වෙන නියෝජ්‍යායතන කටයුතු ද ඉටු කරන බව.
    - රාජ්‍ය ණය කළමනාකරණය
    - විදේශ විනිමය පාලනය
    - කුඩා පරිමාණ මූල්‍යකරණ වැඩසටහන් සහ ග්‍රාමීය ණය යෝජනා ක්‍රම පිළිබඳ මූලික ආයතනය ලෙස කටයුතු කිරීම
    - සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය
- ව්‍යාපාර සාර්ථකත්වයට මහ බැංකුවේ කටයුතු ඉවහල් වන ආකාරය පැහැදිලි කර දෙන්න.

**නිපුණතාව 8.0** : ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 8.1** : ව්‍යාපාරවල පැවැත්මට හේතුවන රක්ෂණ සේවාවේ වැදගත්කම විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- අවදානම යන්න පැහැදිලි කරයි.
- ව්‍යාපාරවලට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් ලැයිස්තුවක් පිළියෙල කරයි.
- රක්ෂණය හඳුන්වයි.
- රක්ෂණය කළ හැකි අවදානම් හා රක්ෂණය කළ නොහැකි අවදානම් ලෙස අවදානම් වර්ග කරයි.
- රක්ෂණය කළ හැකි අවදානම් පැහැදිලි කර නිදසුන් සපයයි.
- රක්ෂණය කළ නොහැකි අවදානම් පැහැදිලි කර නිදසුන් සපයයි.
- ව්‍යාපාරවල පැවැත්ම සඳහා රක්ෂණයේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂණ ගිවිසුම පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමට සම්බන්ධ පාර්ශව හඳුන්වයි.
- රක්ෂණ ගිවිසුමක ඇතුළත්වන කරුණු විමර්ශනය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රක්ෂිතයා විසින් වාරික ගෙවීමටත් රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදුවිය හැකි අලාභ සඳහා වන්දි ගෙවීමටත් රක්ෂකයා බැඳී සිටීම රක්ෂණයෙන් සිදුවන බව.
- විවිධ අවදානම්වලට මුහුණ දී ඇති රක්ෂිතයන් විසින් රක්ෂණ සමාගමට ගෙවනු ලබන වාරික මුදලින් රක්ෂණ අරමුදල ගොඩනැගී ඇති බව හා වාරික ගෙවන පුද්ගලයන් අතුරෙන් කෙනෙකුට වන හානියක් වෙනුවෙන් රක්ෂණ සමාගම වන්දි ගෙවන්නේ එම අරමුදලෙන් බව.
- රක්ෂණයේ දී මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදුවීමට ඇති ඉඩකඩ 'අවදානම' ලෙස අර්ථ දැක්විය හැකි බව.
- අවදානම් රක්ෂණය කළ හැකි අවදානම් සහ රක්ෂණය කළ නොහැකි අවදානම් ලෙස වර්ග දෙකකට බෙදිය හැකි බව.
- රක්ෂණය කළ හැකි අවදානම්වල පහත ලක්ෂණ තිබිය යුතු බව.
    - අනාගතයේ දී සිදුවිය හැකි අලාභය මූල්‍යමය වශයෙන් මැනිය හැකි වීම.
    - අවදානම නියත නොවිය යුතු ය.
    - සම්බන්ධතාවයෙන් තොරවීම. එනම්, සිදුවූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නොවිය යුතු ය.

- සත්‍යාපනය කළ හැකි වීම. එනම්, අලාභ සිදුවීමේ හේතුව, ස්ථානය, වේලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි විය යුතු ය.
- පහත දැක්වෙන්නේ රක්ෂණය කළ නොහැකි අවදානම් සඳහා උදාහරණ කිහිපයක් බව.
  - විභාග අසමත්වීම, ආදරය අහිමි වීම වැනි පුද්ගල හැකියාව මත තීරණය වන අවදානම්
  - යල් පැනීම්, ක්ෂය වීම් වැනි ස්වාභාවික හේතූන් මත ඇතිවන ව්‍යාපාරික අවදානම්
  - වැරදි කළමනාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාර අලාභ
- රක්ෂණයේ අවශ්‍යතාව පහත දැක්වෙන ආකාරයෙන් පැහැදිලි කළ හැකි බව.

  **නිදසුන් :**
  - රක්ෂණයෙන් ව්‍යාපාර අවදානම් ආවරණය කෙරෙන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙළඹීම
  - අකල් මරණය, ආබාධිත තත්ත්ව හෝ අසනීපයක දී පුද්ගලයාට මූල්‍යමය ආරක්ෂාව ලැබීම
  - රක්ෂණ සමාගම් තම අරමුදල් නැවත ආයෝජනය කිරීම නිසා රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනයට රක්ෂණය උපකාරී වීම
  - මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළෙඳාමේ දියුණුව ඇති වීම
- රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක්, රක්ෂණ ආයතනයක් විසින් පිළිගැනීමෙන් පසුව, එම දෙපාර්ශවය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාව දැක්වෙන ලියවිල්ල රක්ෂණ ගිවිසුම බව.
- රක්ෂණ ගිවිසුමකට පහත සඳහන් පාර්ශව සම්බන්ධ වන බව.
  - පළමු පක්ෂය - රක්ෂිතයා - එනම්, රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබා ගන්නා පුද්ගලයා
  - දෙවන පක්ෂය - රක්ෂකයා - එනම්, රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශවය හෙවත් රක්ෂණ සමාගම
  - තුන්වන පක්ෂය - ගිවිසුමේ ක්‍රියාකාරිත්වය තුළින් ඇතිවන බාහිර පක්ෂ පිළිබඳ සම්බන්ධතාව
- රක්ෂණ ගිවිසුමක් වලංගුවීම සඳහා පහත මූලිකාංග තිබිය යුතු බව.
  - නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස
  - අර්පනය හෙවත් යෝජනාව
  - ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම
  - නෛතික බව - නීතියට එකඟ බව
  - ඒ ඒ පාර්ශවයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව
- කිසියම් ජීවිතයකට හෝ දේපළකට අදාළ ව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසුව ඊට අදාළ ව රක්ෂණ සමාගම විසින් රක්ෂිතයාට දෙනු ලබන සහතිකය රක්ෂණ ඔප්පුව බව.

**නිපුණතා මට්ටම 8.2 :** රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- රක්ෂ්‍ය හිමිකම නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරයි.
- රක්ෂණ ගිවිසුමක දී උපරිම සද්භාවයෙන් යුතු ව කටයුතු කිරීමේ අවශ්‍යතාව තහවුරු කරයි.
- රක්ෂිත දේපලකට සිදු වූ හානියක් සම්බන්ධ ව වන්දි ගෙවීමේ දී හානිපූරණ මූලධර්මයේ බලපෑම පැහැදිලි කරයි.
- ආදේශන මූලධර්මය හඳුන්වා එහි අවශ්‍යතාව පැහැදිලි කරයි.
- වටිනාකමින් වැඩි දේපලක් රක්ෂණ සමාගම් කීපයක රක්ෂණය කර ඇතිවිටක, සිදු වූ හානියක දී එය පූරණය කිරීමට එක් එක් ආයතනය දායක වන ආකාරය පෙන්වා දෙයි.
- වන්දි ගෙවන අවස්ථාවක දී ආසන්නම හේතුව බලපාන ආකාරය විමර්ශනය කරයි.
- රක්ෂණ මූලධර්ම රක්ෂණයට වැදගත් වන ආකාරය අගය කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- විශාල වෘක්ෂයක පින්තූරයක් පන්තියට ඉදිරිපත් කරන්න.
- ඒ පිළිබඳ සිසු අදහස් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - ගසේ පැවැත්ම සහ ශක්තිමත්භාවය ගසේ මුල් මත රඳා පවතින බව
    - මුල්වලට හානියක් වුවහොත් ගසේ පැවැත්මක් නොමැති බව
    - රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා ද රක්ෂණ මූලධර්ම දායක වනබව

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ රක්ෂණ ආයතන විසින් කර ඇති ප්‍රකාශ කිහිපයකි. ඒවායින් ඔබගේ කණ්ඩායමට ලැබෙන ප්‍රකාශ යුගලය කෙරේ අවධානය යොමු කරන්න.

  <u>ප්‍රකාශ යුගලය 1</u>

    - සහන්ගේ එකම නෑයා වැඩිහිටි සොහොයුරා වුවත් ඔහුගේ ජීවිතය සහන්ට රක්ෂණය කළ නොහැකි ය.
    - රක්ෂණ ඔප්පුව ලබා ගන්නා විට රංජනී සිය රෝගී තත්ත්වය වසන් කර ඇති නිසා වන්දි ගෙවිය නොහැකි ය.

**ප්‍රකාශ යුගලය 2**

- දේවකගේ මෝටර් රථය රු. ලක්ෂ 15 කට රක්ෂණය කර තිබුණත් හානිය අනුව දීමට පුළුවන් වන්නේ රු. 200,000 ක් පමණි.
- බන්දුල සිය කර්මාන්ත ශාලාව රු. ලක්ෂ 05 බැගින් ආයතන හතරක රක්ෂණය කර ඇතත් සිදු වූ රු. ලක්ෂයක හානිය සඳහා රක්ෂණ ආයතන හතරෙන්ම ලැබෙන මුළු වන්දි මුදල රු. ලක්ෂයක් පමණි.

**ප්‍රකාශ යුගලය 3**

- වන්දි ගෙවීමට පෙර අනතුරෙන් හානියට පත් වූ ඔබගේ ලොරියේ සුන්බුන් රක්ෂණ ආයතනයට භාරදිය යුතු ය.
- ව්‍යාපාරයට ගිනි රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණු අතර ඔහුගේ ව්‍යාපාරය ත්‍රස්තවාදී ක්‍රියාවක් නිසා විනාශයට පත් විය. කැරලි කෝලහලයකින් අලාභය සිදු වූ නිසා වන්දි ගෙවිය නොහැකි බව රක්ෂණ ආයතනය පවසයි.

- ඔබ කණ්ඩායමට ලැබුණු සිද්ධීන් හඳුනා ගැනීම සඳහා කණ්ඩායම් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිද්ධිවල අන්තර්ගත කරුණු පිළිබඳ ව ඔබ කණ්ඩායමේ අදහස පැහැදිලි කරන්න.
- එම ප්‍රකාශවලට අදාළ රක්ෂිතයා ඔබ නම් මෙම තීරණ පිළිබඳ ව ඔබේ අදහස ඉදිරිපත් කරන්න.
- ප්‍රකාශවල සඳහන් රක්ෂකයා ගෙන ඇති තීරණ පිළිබඳව ඔබ සෑහීමකට පත්වන්නේ ද? හේතු පැහැදිලි කරන්න.
- ඔබ කණ්ඩායම රක්ෂකයා නම් එම සිදුවීම් පිළිබඳ ව ඔබේ තීරණ ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සඳහා රක්ෂණ මූලධර්ම අනුගමනය කළ යුතු බව.
- එම රක්ෂණ මූලධර්ම පහත දැක්වෙන බව.
  - රක්ෂ්‍ය හිමිකම
  - උපරිම විශ්වාසය
  - හානි පූර්ණය
  - දායකත්වය
  - ආදේශනය
  - ආසන්නම හේතුව

- යම් විෂය වස්තුවක් පැවතීමෙන් වාසියකුත්, එය අහිමිවීමෙන් අවාසියකුත් ඇතිවන ඕනෑම දෙයක් සම්බන්ධව ඇති හිමිකම රක්ෂ්‍ය හිමිකම බව.

  **නිදසුන් :** ස්වාමි පුරුෂයාගේ ජීවිතය පිළිබඳ භාර්යාවටත්, භාර්යාවගේ ජීවිතය පිළිබඳ ස්වාමියාටත් රක්ෂ්‍ය හිමිකමක් ඇත. යම් දේපලක නීත්‍යානුකූල අයිතිකරුට එම දේපළ පිළිබඳ රක්ෂ්‍ය හිමිකමක් ඇත.

- උපරිම විශ්වාසය යනු, රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා හා රක්ෂිතයා විසින් හෙළිදරව් කළ යුතු සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කළ යුතු බව.
- හානිපූර්ණ මූලධර්මය යනු, යම් රක්ෂිත දේපලකට හානියක් වූ විට එම දේපළ යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා පමණක් ප්‍රමාණවත් වන්දි මුදලක් ගෙවන බව. (නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.)
- දායකත්ව මූලධර්මය යනු, යම් දේපලක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර තිබිය දී, එම දේපලට යම් හානියක් සිදු වූ විටක නිකුත් කර ඇති සියලුම රක්ෂණ ඔප්පුවල වටිනාකමේ අනුපාතයට අනුව එකී සියලුම රක්ෂණ සමාගම් දායක වී වන්දි ගෙවන බව. (නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.)
- ආදේශන මූලධර්මය යනු, රක්ෂිත දේපලකට සිදු වූ හානියක දී රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසුව, බාහිර පාර්ශවයන්ගෙන් රක්ෂිතයට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතීන් රක්ෂකයා පවරා ගන්නා බව.
- ආසන්නම හේතුව යනු, රක්ෂිත දේපලකට සිදු වූ හානියක දී එම හානිය සිදුවීමට හේතු කීපයක් බලපා ඇති විටක, එම හේතු අතරින් ආසන්නම හේතුව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී ඇත්නම් පමණක් වන්දි ගෙවන බව.
- ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය හා ආසන්නම හේතුව යන මූලධර්ම පමණක් අදාළ වන බව.
- හානි පූරණය, ආදේශනය, දායකත්වය යන මූලධර්ම ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් අදාළ නොවන බව.

**නිපුණතා මට්ටම 8.3 :** ව්‍යාපාරවල විවිධ අවදානම් ආවරණය කෙරෙන රක්ෂණ ඔප්පු වර්ග පරීක්ෂා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- ව්‍යාපාරයකට ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග ලැයිස්තුගත කරයි.
- පහත එක් එක් රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වන අවදානම් පැහැදිලි කරයි.
  - ජීවිත රක්ෂණ ඔප්පුව
  - ගිනි රක්ෂණ ඔප්පුව
  - සොර බිය රක්ෂණය
  - ස්වාභාවික විපත් රක්ෂණය
  - සමුද්‍රීය රක්ෂණය
  - මෝටර් රථ රක්ෂණය
  - සේවා යෝජක වගකීම් රක්ෂණය
  - මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
  - මාර්ගස්ථ මුදල් රක්ෂණය
  - මහජන වගකීම් රක්ෂණය
- ජීවිත රක්ෂණය හා සෙසු රක්ෂණ අතර වෙනස්කම් සන්සන්දනය කරයි.
- ගිනි රක්ෂණය යටතේ ආවරණය කෙරෙන අවදානම් හා ආවරණය නොකෙරෙන අවදානම් වෙන් කර දක්වයි.
- මෝටර් රථ රක්ෂණයේ දී ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.
- සමුද්‍රීය රක්ෂණයේ දී ලබා ගත හැකි විවිධ රක්ෂණ ඔප්පු වර්ග විස්තර කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- පහත සඳහන් දර්ශන දැක්වෙන පින්තූර පන්තියට ඉදිරිපත් කරන්න.
  - ගොඩනැගිල්ලක් ගිනි ගන්නා දර්ශනයක්
  - මෝටර් රථ දෙකක් එකට ගැටී ඇති දර්ශනයක්
  - අඩක් මුහුදේ ගිලී ඇති නැවක දර්ශනයක්
  - නිවසකට සොරු ඇතුල්වන දර්ශනයක්
- පින්තූරවලින් දැක්වෙන සිද්ධි පිළිබඳ ව සිසු අදහස් විමසන්න.
- එවැනි සිද්ධි සඳහා ගත හැකි ක්‍රියාමාර්ග සිසුන්ගෙන් විමසන්න.
- පහත කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - විවිධාකාර ස්වරූපයේ අවදානම් ඇති බව
  - මෙම අවදානම් සඳහා ආවරණය, රක්ෂණ ඔප්පු මගින් ලබා ගත හැකි බව

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ සමාජයේ පිළිගත් චරිත තුනක් පිළිබඳ තොරතුරු ය. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන චරිතය කෙරෙහි අවධානය යොමු කරන්න.

  **<u>මහිලා</u>**

  ලිපිකාරිණියෙකි. වයස අවුරුදු 10 ට අඩු දරුවන් තිදෙනෙක් සිටී. ස්වාමියා මිය ගොසිනි. ස්වාමියාගෙන් උරුම වූ නිවස හා දේපල ද ඇත.

  **<u>ධනපාල</u>**

  ගෘහ භාණ්ඩ නිෂ්පාදනාගාරයක් සහ අලෙවිහල් කිහිපයක් පවත්වාගෙන යයි. කැළණි ගඟ ආසන්නයේම කර්මාන්තශාලාව පිහිටා ඇත. තම නිෂ්පාදන තමන්ට අයත් ලොරි 2 ක් මගින් රටපුරා වෙළෙඳුන්ට බෙදා හරී.

  **<u>ධනවර්ධන</u>**

  තේ සහ රබර් වතු කිහිපයක හිමිකරුවෙකි. තේ කර්මාන්තශාලා 02 ක් ද හිමි ය. සේවකයන්ට වැටුප් ගෙවීම සඳහා වතුවලට හා කර්මාන්තශාලාවලට යාම පුරුද්දකි. ඔහුගේ නිෂ්පාදන ඔහුම අපනයනය කරයි.

- ඔබ කණ්ඩායමට ලැබුණු චරිතයේ කටයුතු හා ජීවන රටාව අධ්‍යයනය කරමින් පහත කරුණු අනාවරණය කරන්න.
  - ඔබගේ කණ්ඩායමට ලැබුණ පුද්ගලයාට මුහුණපෑමට සිදුවිය හැකි අවදානම් වෙන වෙන ම ලියා දක්වන්න.
  - එම අවදානම් ආවරණය කර ගැනීම සඳහා රක්ෂණ වෙළෙඳපොළෙන් ලබා ගත හැකි ඔප්පු වර්ග පෙන්වා දෙන්න.
  - ඔබගේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- මරණය, අකර්මන්‍යතාව හෝ මහළුවියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදුවිය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සැලසීම ජීවිත රක්ෂණයේ අරමුණ බව.
- රක්ෂිතයාගේ මරණය හා වෙනත් ශාරීරික උපද්‍රව හේතුවෙන් අවදානම්වලට මුහුණ පෑ විට රක්ෂිතයාට හෝ ඔහුගෙන් යැපෙන්නන්ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම ජීවිත රක්ෂණයේ දී සිදුවන බව.
- ජීවිත රක්ෂණය යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ලබා ගන්නා අතර රක්ෂිතයා එකී කාලසීමාව අතරතුර මිය ගියහොත් එකඟ වූ මුළු රක්ෂිත වටිනාකම යැපෙන්නන්ට හෝ නම් කළ පුද්ගලයාට හිමිවන බව හා රක්ෂිතයා එකී කාල සීමාව අවසන් වන තෙක් ජීවත්ව සිටියහොත් කාල සීමාව අවසානයේ රක්ෂණ ඔප්පුවේ වටිනාකම හා ප්‍රතිලාභ රක්ෂිතයාට ලබා ගත හැකි බව.

- කිසියම් පුද්ගලයකුගේ ගොඩනැගිලි හෝ එහි ඇති වත්කම්වලට ගින්නෙන් සිදුවිය හැකි හානි ආවරණය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණය ගිනි රක්ෂණය බව.
- ගිනි රක්ෂණ ඔප්පුවක් යටතේ ගිනි හානිවලට අමතරව පහත සඳහන් උවදුරු උදෙසා ද අතිරේක වාරික මුදලක් ගෙවීමෙන් රක්ෂණ ඔප්පුව දීර්ඝ කර ගත හැකි බව.
  - කැරලි කෝලාහල / වැඩ වර්ජන
  - පිපිරීම්
  - විදුලිමය ආපදා හානි
  - භූමි කම්පා
  - ජල ගැලීම්, සුළි සුළං, කුණාටු
  - ගුවන් යානා අනතුරු හානි
  - ගැටීම් හානි
- ව්‍යාපාරික ස්ථානවල හෝ නිවාසවල සිදුවිය හැකි සොරකිය අවදානම ආවරණය කර ගැනීම සඳහා සොරකිය රක්ෂණ ඔප්පු ලබා ගත හැකි බව.
- ස්වභාව ධර්මයෙන් එල්ලවන සුනාමි, කුණාටු වැනි දේවලින් දේපලවලට සිදුවන හානි ආවරණය සඳහා ස්වාභාවික විපත් රක්ෂණයක් ලබා ගත හැකි බව.
- මුහුදු මගින් ප්‍රවාහනයේ දී නැවට හා නැව්බඩුවලට සිදුවිය හැකි හානි සමුද්‍රීය රක්ෂණ මගින් ආවරණය කරගත හැකි බව.
- නැව් කඳ රක්ෂණ ඔප්පු හා නැව් බඩු රක්ෂණ ඔප්පු යනුවෙන් සමුද්‍රීය රක්ෂණය මූලික කොටස් දෙකකට වර්ග කළ හැකි බව.
- නැව් කඳ රක්ෂණ ඔප්පු යටතේ සියලු අවදානම් ඔප්පුව, පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව, තොටුපොළ ඔප්පුව, අළුත්වැඩියා ඔප්පුව යනාදී ඔප්පු වර්ග ලබාගත හැකි බව.
- නැව් බඩු රක්ෂණ ඔප්පු යටතේ ඇගයූ ඔප්පු, විවෘත ඔප්පු හා අනාගත ආවරණ ඔප්පු ලබා ගත හැකි බව.
- මෝටර් රථ රක්ෂණය යනු, රථවාහන අනතුරුවලින් මෝටර් රථවලට, මෝටර් රථවල ගමන් කරන්නන්ට හා බාහිර පාර්ශවයන්ට සිදු විය හැකි හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස රථවාහන හිමියකු හා රක්ෂණ සමාගමක් අතර ඇති කර ගන්නා එකඟතාවයක් බව.
- මෝටර් රථවාහන රක්ෂණය යටතේ පහත සඳහන් රක්ෂණ ඔප්පු වර්ග ලබා ගත හැකි බව.
  - විස්තීරණ රක්ෂණය
  - තෙවන පාර්ශව ගිනි හා සොරකිය රක්ෂණය
  - අවම තෙවන පාර්ශව රක්ෂණය
- විස්තීරණ රක්ෂණ ඔප්පුවක් මගින්, අදාළ වාහනයට, වාහනයේ ගමන් ගන්නා මගීන්ට හා භාණ්ඩවලට, බාහිර පුද්ගලයන්ට හා දේපලවලට සිදුවන හානි ආවරණය වන බව.

- තෙවන පාර්ශව ගිනි හා සොරබිය රක්ෂණය මගින්, අදාළ වාහනයට ගින්නෙන් හා සොරකම් කිරීම්වලින් සිදුවන හානිවලට අමතරව, බාහිර පුද්ගලයන්ට හා දේපලවලට සිදුවන හානි ආවරණය වන බව.
- අවම තෙවන පාර්ශව රක්ෂණය මගින් තෙවන පාර්ශවයන්ට හා දේපලවලට සිදුවන හානි පමණක් ආවරණය වන බව සහ ඕනෑම මෝටර් රථයක් මහා මාර්ගයේ ධාවනය කිරීම සඳහා අවම වශයෙන් අවම තෙවන පාර්ශව රක්ෂණ ඔප්පුවවත් ලබා ගත යුතු බව.
- තමන් යටතේ සේවය කරන අයට සේවයෙහි යෙදී සිටිය දී, සේවයේ යෙදීම හේතුවෙන් සිදුවන තුවාල සහ අසනීප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සේව්‍යයන් විසින් ලබා ගන්නා රක්ෂණය, සේවා යෝජක වගකීම් රක්ෂණය බව.
- ගොඩබිමින් භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ දී, භාණ්ඩ වාහනයට පැටවූ අවස්ථාවේ සිට බාන අවස්ථාව දක්වා සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා "මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය" වැදගත් වන බව.
- එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් රැගෙන යාමේ දී සිදුවිය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණය "මාර්ගස්ථ මුදල් රක්ෂණය" බව.
- ව්‍යාපාරිකයන්ගෙන් මහජනතාවට සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණය මහජන වගකීම් රක්ෂණය බව.

**නිදසුන් :**

- ආහාර පාන බෝතල් කර විකුණන ආයතන එම ආහාර විෂ වීම නිසා පාරිභෝගිකයාට සිදුවන හානි සම්බන්ධ ව රක්ෂණ ඔප්පු ලබා ගැනීම.

**නිපුණතා මට්ටම 8.4 :** රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්මට දායක වන ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළෙඳපොළෙහි පාර්ශවකරුවන් සොයා බලයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- රක්ෂණ වෙළෙඳපොළේ සංයුතිය පැහැදිලි කරයි.
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය අගය කරයි.
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රක්ෂණ ආයතන ලැයිස්තුගත කරයි.
- රක්ෂණ තැරැව්කරුවන් හා රක්ෂණ නියෝජිතයන් රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්මට දායක වන ආකාරය විමසයි.
- ප්‍රාරක්ෂණය යන්න විස්තර කරයි.
- ප්‍රතිරක්ෂණය යන්න පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ශ්‍රී ලංකාවේ රක්ෂණ වෙළෙඳපොළ, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, රක්ෂණ සමාගම්, රක්ෂණ තැරැව්කරුවන් හා රක්ෂණ නියෝජිතයන්ගෙන් සමන්විත වන බව.
- ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සංවර්ධනය කිරීම, අධීක්ෂණය කිරීම සහ විධිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇති බව.
- ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පහත සඳහන් කාර්ය ඉටු කරන බව.
  - රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම
  - රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම
  - රක්ෂණ සමාගම්වල ලියාපදිංචිය අත්හිටුවීම
  - රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම
  - රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම
  - රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
  - රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්ධක් පැනවීම
- රක්ෂණ සමාගම යන්නෙන්, රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා 2003 අංක 43 දරණ රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වන බව.
- ලියාපදිංචි කර ඇත්තාවූ ද තැරැව්කරු ගාස්තුවක් හෝ කොමිස් මුදලක් අපේක්ෂාවෙන් රක්ෂණකරුවෙකු සමග රක්ෂණකරුවෙකු, රක්ෂණ ඔප්පු දරන්නෙකු හෝ රක්ෂණය කිරීම හෝ ප්‍රතිරක්ෂණය කිරීම සඳහා වූ යෝජකයෙකු සඳහා රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම පිණිස අතරමැදියෙකු වශයෙන් කටයුතු කරනු ලබන්නා රක්ෂණ තැරැව්කරු බව.

- රක්ෂණ තැරැව්කරුවෙකු වෙත හෝ තැරැව්කරුවෙකු සමඟ රක්ෂණ නියෝජිතයෙකු වශයෙන් ලියාපදිංචි කර ඇති හා කොමිස් මුදලක් සැලකිල්ලට ගෙන ඒ රක්ෂණකරුගේ තැරැව්කරු සඳහා රක්ෂණ ව්‍යාපාර ලබා ගන්නා පුද්ගලයකු රක්ෂණ නියෝජිතයා බව.
- එක් රක්ෂණ නියෝජිතයෙකුට එක් රක්ෂණ සමාගමකට වඩා සම්බන්ධකම් පැවැත්විය නොහැකි බව.
- රක්ෂණ නියෝජිතයන්, රක්ෂණයේ ඇති ප්‍රතිලාභ හඳුන්වා දී පුද්ගලයන් රක්ෂණයට පොළඹවන බව හා රක්ෂිතයන්ට කලට වේලාවට රක්ෂණ ඔප්පු ලබාදීමට සහය වන බව.
- ප්‍රාරක්ෂණය යනු, උවදුරු රක්ෂණයේ දී විශාල වටිනාකමක් ඇති වත්කමක් සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම බව සහ අනතුරක් සිදු වූ විට තමන් භාරගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම විසින් වන්දි ගෙවන බව.
- ප්‍රතිරක්ෂණය යනු, රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක්, එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම බව.
- ප්‍රතිරක්ෂණයෙන් රක්ෂකයාට හිමිවන ප්‍රතිලාභය නම්, රක්ෂිත දේපලකට හානියක් සිදු වූ විට ප්‍රතිරක්ෂණ සමාගම් විසින් රක්ෂකයාට වන්දි ගෙවන නිසා, රක්ෂකට දැරීමට සිදුවන පාඩුව අවම වීම බව.
- ප්‍රතිරක්ෂණයෙන් රක්ෂිතයන්ට හිමිවන වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - ප්‍රතිරක්ෂණය මගින් රක්ෂණ සමාගම්වල වගකීම විතැන් කළ හැකි නිසා රක්ෂිතයාගෙන් අය කරනු ලබන රක්ෂණ වාරික අඩු මට්ටමක පැවතීම.
    - විශාල වටිනාකමක් ඇති දේපළ රක්ෂණය කළ හැකි නිසා වන්දි ලැබෙන බවට සහතිකයක් වීම.

**නිපුණතාව 9.0** : ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා ප්‍රවාහනය සඵලදායී ව යොදා ගැනීමේ අවශ්‍යතාව පෙන්වා දෙයි.

**නිපුණතා මට්ටම 9.1** : ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වය සඳහා යොදා ගත හැකි විවිධ ප්‍රවාහන ක්‍රමවල වාසි හා අවාසි සන්සන්දනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල** :

- ව්‍යාපාර කටයුතුවල සාර්ථකත්වයට අවශ්‍ය සේවාවක් ලෙස ප්‍රවාහනය හඳුන්වා දෙයි.
- ප්‍රවාහන පද්ධතියක මූලිකාංග විස්තර කර ඒ එක් එක් මූලිකාංගය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- විකල්ප ප්‍රවාහන ක්‍රම දක්වමින් ඒවා එකිනෙකෙහි සාපේක්ෂ වාසි හා අවාසි සසඳයි.
- ප්‍රවාහන සේවාවේ වැදගත්කම දක්වමින් එය කාර්යක්ෂම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය** :

**පිවිසීම :**

- කොළඹ නගරයේ සිට යාපනයට ගමන් කළ හැකි ආකාර සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - කොළඹ සිට යාපනයට යාම බසයෙන්, වෑන් රථයකින්, මෝටර් රථයකින්, දුම්රියෙන්, ගුවන් යානයකින්, නැවකින්, බෝට්ටුවකින් ආදී විවිධ ක්‍රම ඔස්සේ කළ හැකි බව.
    - ඒ අනුව ප්‍රවාහනය සඳහා පහත සඳහන් ක්‍රම යොදා ගන්නා බව.
        - මහා මාර්ග ප්‍රවාහනය
        - දුම්රිය මාර්ග ප්‍රවාහනය
        - ගුවන් මාර්ග ප්‍රවාහනය
        - ජල මාර්ග ප්‍රවාහනය

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස්** :

- පහත සඳහන් වන්නේ ප්‍රවාහන ක්‍රම හතරකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන ප්‍රවාහන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරන්න.
    - මහා මාර්ග ප්‍රවාහනය
    - දුම්රිය මාර්ග ප්‍රවාහනය
    - ගුවන් මාර්ග ප්‍රවාහනය
    - ජල මාර්ග ප්‍රවාහනය

- මාතෘකාව කෙටියෙන් හඳුන්වන්න.
- මාතෘකාවට අදාළ ව භාවිත වන මාර්ග කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් හඳුනා ගන්න.
- එම මාර්ගවල ධාවනය වන වාහන ලැයිස්තුවක් සකස් කරන්න.
- එම වාහන ධාවනය සඳහා යොදා ගත හැකි බලය වෙන් වෙන් වශයෙන් දක්වන්න.
- එම වාහන නවතා තබන නැවතුම්පොළවල් කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- එම ප්‍රවාහන ක්‍රමය පහත සඳහන් එක් එක් පාර්ශවයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.
    - පුද්ගලයින්ට
    - ව්‍යාපාරිකයින්ට
- ඔබට ලැබුණු ප්‍රවාහන ක්‍රමය, ප්‍රවාහන කටයුතු සඳහා වඩාත් සුදුසු වන්නේ කුමන අවස්ථාවල දී දැයි පැහැදිලි කරන්න.
- අදාළ ප්‍රවාහන ක්‍රමයේ වාසි හා අවාසි කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- එම ප්‍රවාහන ක්‍රමය කාර්යක්ෂම කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ව්‍යාපාර ආයතනවල සහ පුද්ගලයන්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා උපකාරක සේවාවක් වශයෙන් ප්‍රවාහනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව.
- ප්‍රවාහනය හුදෙක් මාධ්‍යයක් පමණක් නොව මූලිකාංග කිහිපයක් සමබරව සංවර්ධනය වීමෙන් සැකසුණු පද්ධතියක් බව.
- එම ප්‍රවාහන මූලිකාංග පහත සඳහන් ලෙස විස්තර කළ හැකි බව.
    - මාර්ගය :- ප්‍රවාහනය සඳහා භාවිත කරන විවිධ මාර්ග වේ.
      **නිද.** මහා මාර්ග, දුම්රිය මාර්ග, ජල මාර්ග, ගුවන් මාර්ග, නළ මාර්ග
    - මාධ්‍යය:- විවිධ මාර්ගවල ධාවනය වන වාහන මාධ්‍ය වේ.
      **නිද.** මෝටර් රථ වාහන, කරත්ත, බයිසිකල්, මගී දුම්රිය, බඩු දුම්රිය, බෝට්ටු, නැව්, හෙලිකොප්ටර්, ගුවන් යානා
    - බලය:- එක් එක් මාධ්‍යය ධාවනයේ දී යොදා ගන්නා බලය හෝ ශක්තිය වේ.
      **නිද.** මිනිස් ශ්‍රමය, සතුන්ගේ ශක්තිය, සුළඟ, හිරු එළිය වැනි ස්වාභාවික බලය, ගල් අඟුරු, ඛනිජ තෙල්, විදුලිය, ගෑස්
    - පර්යන්තය:- ප්‍රවාහන මාධ්‍යය ප්‍රවාහන කාර්යයේ දී නවතා තබන නැවතුම්පොළවල් වේ.
      **නිද.** බස් නැවතුම් පොළ, දුම්රිය ස්ථානය, ගුවන් තොටුපොළ, වරාය

- මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයෙහි වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - අවශ්‍යතාවලට ගැළපෙන සේ මාධ්‍යයක් තෝරා ගත හැකිවීම
    - රට පුරා ව්‍යාප්තව පැවතීම
    - අවශ්‍ය ඕනෑම විටක මහාමාර්ග භාවිත කළ හැකි වීම
    - බොහෝ විට ගමනාන්තය දක්වාම එකම ප්‍රවාහන මාධ්‍යයක් යොදා ගත හැකි වීම
    - කෙටි දුර ගමන් සඳහා වේගවත් ක්‍රමයක් වීම
- මහාමාර්ග ප්‍රවාහන ක්‍රමයෙහි අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - විශාල තොග එකවර ප්‍රවාහනයට අපහසු වීම
    - මහාමාර්ග නඩත්තුව අපහසු වීම
    - ප්‍රමාදය හා අනතුරු ඉහළ වීම
    - කාලගුණික තත්ත්ව මත බාධා ඇතිවීම
- දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ පවතින වාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - විශාල භාණ්ඩ තොගයක් හා මගීන් ප්‍රමාණයක් එකවර ප්‍රවාහනය කළ හැකි වීම.
    - මහාමාර්ග ප්‍රවාහනයට වඩා ආරක්ෂාකාරී වීම
    - භාණ්ඩවල ස්වභාවය අනුව මැදිරි යොදා ගත හැකි වීම
    - සෙසු ප්‍රවාහන මාධ්‍ය හා සසඳන කල ගාස්තු අඩුවීම
    - ආපනශාලා, නිදන මැදිරි, නිරීක්ෂණ මැදිරි ආදී විවිධ පහසුකම් ලබාගත හැකි වීම
- දුම්රිය ප්‍රවාහන ක්‍රමයේ පවතින අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.
    - දුම්රිය මාර්ග දිවයින පුරා ව්‍යාප්තව නොතිබීම
    - අවශ්‍ය ඕනෑම වේලාවක දී සේවය ලබා ගත නොහැකි වීම
    - ගමනාන්තය දක්වා යොදාගත නොහැකි නිසා වෙනත් ප්‍රවාහන ක්‍රම යොදා ගැනීමට සිදුවීම
    - විදුලි සංඥා ඇණ හිටීම, දුම්රිය මාර්ග අබලන්වීම ආදිය නිසා ප්‍රමාද ඇති වීම.
- ජලමාර්ග ප්‍රවාහන ක්‍රමයෙහි වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.

  **වාසි**

    - අන්තර්ජාතික වෙළෙඳාමට සහාය වීම
    - භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර රැගෙන යා හැකි වීම
    - භාණ්ඩ වර්ගවල ස්වභාවය අනුව යාත්‍රා තෝරාගත හැකි වීම

  **අවාසි**

    - නැව් සේවාව සුලභ නොවීම
    - වැඩි කාලයක් ගතවීම

- ගුවන් ප්‍රවාහන ක්‍රමයෙහි වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.

  **<u>වාසි</u>**

  - වේගවත් බව අතින් ඉහළ වීම
  - ඉක්මනින් නෂ්‍යවන භාණ්ඩ සඳහා යෝග්‍ය වීම
  - මාර්ග නඩත්තු පිරිවැයක් නොමැති වීම

  **<u>අවාසි</u>**

  - විශාල හා බරින් අධික භාණ්ඩ ප්‍රවාහනය සඳහා යෝග්‍ය නොවීම
  - ප්‍රවාහන පිරිවැය අධික වීම
  - අනතුරු වීමට ඇති ප්‍රවණතාව වැඩි වීම
  - අවශ්‍ය වේලාවට සපයා ගැනීමට නොහැකි වීම

- ප්‍රවාහනය ව්‍යාපාරිකයන්ට මෙන් ම පාරිභෝගිකයන්ට ද වැදගත් වන ආකාරය සාකච්ඡා කරන්න.

**නිපුණතා මට්ටම 9.2 :** ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග විමසමින් සඵලදායී ප්‍රවාහන මාධ්‍ය තෝරා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- උචිත ප්‍රවාහන ක්‍රමයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු විමර්ශනය කරයි.
- ප්‍රවාහන ක්‍රමයක්/ මාධ්‍යයක් තෝරා ගැනීමේ දී සලකා බැලිය යුතු කරුණු අධ්‍යයනයෙන් උචිත ප්‍රවාහන ක්‍රමයක්/ මාධ්‍යයක් තෝරයි.
- කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක තිබිය යුතු ගුණාංග විස්තර කරයි.
- කාර්යක්ෂම ප්‍රවාහන ක්‍රමයක් උදෙසා නව යෝජනා ඉදිරිපත් කරයි.
- භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනයේ දී භාවිත වන ලියකියවිලි පැහැදිලි කරයි.
- ප්‍රවාහනයේ නව ප්‍රවණතා ගෙනහැර දක්වයි.
- ප්‍රවාහනයේ අනාගතය පුරෝකථනය කරයි.
- භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා ඇති විකල්ප ප්‍රවාහන ක්‍රම හා මාධ්‍ය පෙළගස්වයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- තම ප්‍රදේශයට ඛනිජ තෙල් ලැබෙන ආකාරය සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
  - ප්‍රදේශයට ඛනිජ තෙල් ලැබෙන්නේ ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහාම යොදා ගන්නා විශේෂිත බවුසර මගින් බව
  - එය මහාමාර්ගවල හා දුම්රිය මාර්ගවල ධාවනය වන මාධ්‍යයක් බව
  - එම මාධ්‍යය ඉතා ආරක්ෂාකාරී වන අතර ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකටම ළඟාවිය හැකි ප්‍රවාහන මාර්ග ඔස්සේ ධාවනය වන බව
  - ඛනිජ තෙල් ප්‍රවාහනය සඳහා එම මාධ්‍ය තෝරා ගැනීමේ දී ධාරිතාව, ආරක්ෂාකාරී බව යනා දී සාධක සලකා බලා ඇති බව

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ ප්‍රවාහන සේවාව උපකාර කර ගැනීමට සිදුවන අවස්ථා හතරකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.
  - අනුරාධපුර රෝහලේ සිට කොළඹ ජාතික රෝහලට රෝගියෙකු රැගෙන යාම
  - බණ්ඩාරවෙල මල් වත්තක සිට කොළඹ නගරයේ පිහිටි මල් ශාලාවකට ස්වභාවික මල් රැගෙන ඒම

- කොළඹ සිට කන්කසන්තුරේට සහල් තොගයක් ප්‍රවාහනය කිරීම
- හම්බන්තොට සිට බදුල්ල නගරයේ වෙළෙඳසැලකට මී කිරි ප්‍රවාහනය කිරීම

- අදාළ කාර්යය සඳහා යොදා ගත හැකි සියලුම ප්‍රවාහන ක්‍රම (මාර්ග) කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් මතු කර ගන්න.
- ඒ එක් එක් මාර්ගයේ ධාවනය වන මාධ්‍යවලින් ඔබට අදාළ කාර්යය සඳහා යොදා ගත හැකි සියලුම මාධ්‍ය ලැයිස්තු ගත කරන්න.
- ඉහත එක් එක් මාර්ග හා ඊට අදාළ මාධ්‍ය අතරින් ඔබේ කාර්යය සඳහා වඩාත් සුදුසු මාර්ගය හා මාධ්‍යය කණ්ඩායම් සාකච්ඡාවක් මගින් තීරණය කරන්න.
- එම මාර්ගය හා මාධ්‍යය තෝරා ගැනීම සඳහා ඔබ කණ්ඩායම විසින් සලකා බැලූ කරුණු පෙළ ගස්වන්න.
- ඔබ තෝරාගත් මාර්ගයේ භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනය කිරීමේ දී භාවිත වන ලියවිලි හඳුනා ගන්න.
- එම ප්‍රවාහන මාර්ගයේ හා මාධ්‍යයේ නව ප්‍රවණතා පෙන්වා දෙන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- උචිත ප්‍රවාහන ක්‍රමයක් තේරීමේ දී සලකා බලන කරුණු කිහිපයක් පහත දැක්වෙන ආකාරයට ලැයිස්තු ගත කළ හැකි බව.
  - භාණ්ඩයේ ස්වභාවය
  - දුර ප්‍රමාණය
  - වේගවත් බව
  - සුරක්ෂිත බව
  - පිරිවැය
  - ධාරිතාව
  - සුලභතාව
  - ප්‍රමිතීන් හා අන්තර්ජාතික සම්මත

- ප්‍රවාහන ක්‍රම හා සම්බන්ධව භාවිත වන ලියකියවිලි පහත දැක්වෙන බව.

| **ප්‍රවාහන ක්‍රමය** | | | **භාවිතවන ලියකියවිලි** |
|---|---|---|---|
| මහාමාර්ග ප්‍රවාහනය - | භාණ්ඩ ප්‍රවාහනය | : | භාර දීමේ ඇණවුම/ භාර දීමේ තුණ්ඩුව |
| | මගීන් ප්‍රවාහනය | : | ප්‍රවේශ පත්‍රය / වාර ප්‍රවේශ පත්‍රය / නිදහස් ගමන් බලපත්‍රය |
| මුහුදු මාර්ග ප්‍රවාහනය - | භාණ්ඩ ප්‍රවාහනය | : | නෞභාර පත්‍රය |
| | මගීන් ප්‍රවාහනය | : | නැව් ප්‍රවේශ පත්‍රය |
| ගුවන් මාර්ග ප්‍රවාහනය - | මගීන් ප්‍රවාහනය | : | ගුවන් ටිකට් පත |
| | භාණ්ඩ ප්‍රවාහනය | : | ගුවන් මාර්ග බිල්පත |
| දුම්රිය ප්‍රවාහනය - | භාණ්ඩ ප්‍රවාහනය | : | දුම්රිය වාර්ණාව |
| | මගීන් ප්‍රවාහනය | : | ප්‍රවේශ පත්‍රය / වාර ප්‍රවේශ පත්‍රය/ නිදහස් ගමන් බලපත්‍රය |

- ප්‍රවාහන ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා ද වර්ධනය වෙමින් පවතින අතර ඒවාට පහත සඳහන් නිදසුන් දැක්විය හැකි බව.
  - උමං මාර්ග ප්‍රවාහනය
  - ගුවන් පාලම් ඉදි කිරීම
  - අධිවේගී මාර්ග ඉදි කිරීම
  - කම්බියානා යොදා ගැනීම
  - විදුලි දුම්රිය යොදා ගැනීම

**නිපුණතාව 10.0** : ව්‍යාපාර සාර්ථකත්වය සඳහා සන්නිවේදනය සඵලදායීව යොදා ගැනීමේ අවශ්‍යතාව තහවුරු කරයි.

**නිපුණතා මට්ටම 10.1** : සන්නිවේදන ක්‍රියාවලියක සාර්ථකත්වයට තුඩුදෙන සාධක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 05

**ඉගෙනුම් ඵල :**

- සන්නිවේදනය පැහැදිලි කරයි.
- ව්‍යාපාර කටයුතුවල දී සන්නිවේදනයේ ඇති වැදගත්කම පෙන්වා දෙයි.
- සාමාජීය කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම පැහැදිලි කරයි.
- සන්නිවේදන ක්‍රියාවලිය රූප සටහනකින් ඉදිරිපත් කරයි.
- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පැහැදිලි කරයි.
- සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග ලැයිස්තුවක් සකසයි.
- පණිවිඩයක් සකස් කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු කෙරෙහි සැලකිලිමත් වෙමින් අවස්ථාවට උචිත පණිවිඩයක් සකස් කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- පන්තියේ මුලින් සිටින සිසුවා කැඳවා කිසියම් පණිවුඩයක් ඔහුට පවසන්න. එය ළඟ සිටින සිසුවාට දන්වන ලෙසට උපදෙස් දෙන්න. අවසාන සිසුවා ලවා පණිවුඩය ලෑල්ලේ ලියවන්න.
- මුලින් සිටි සිසුවාට දුන් පණිවුඩයම අවසාන සිසුවාට ද ලැබුණා ද යන්න විමසන්න. පණිවුඩය වෙනස්වීමට හේතු සිසුන්ගෙන් විමසන්න.
- පණිවුඩය වෙනස් වූයේ නම් එයට බලපෑ හැකි හේතු අනාවරණය කර ගැනීමට සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - පණිවුඩය දුන් තැනැත්තා පණිවුඩය පැහැදිලිව නොදීම
    - පණිවුඩය ලබාගත් තැනැත්තා පැහැදිලිව අසා නොසිටීම
    - පණිවුඩය අපැහැදිලි වීම
    - පණිවුඩය තුළ තිබූ වචන අවබෝධ කර ගත නොහැකි වීම
- සඵලදායී සන්නිවේදනයක් සඳහා නිවැරදිව පණිවුඩ හුවමාරු කරගත යුතු බව.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර, පහත සඳහන් ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත දැක්වෙන්නේ සන්නිවේදනයක් සිදුකළ යුතු අවස්ථා කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන අවස්ථාව කෙරෙහි අවධානය යොමු කරන්න.
    - පාසල් වේලාවෙන් පසුව සියලුම අංශ ප්‍රධානීන්ගේ රැස්වීමක් විදුහල්පතිතුමා විසින් පවත්වන බව අදාළ අංශ ප්‍රධානීන්ට දැනුම් දීම.

- හදිසියේ අසනීප වූ ආයතනයේ සේවකයකු සේවයට වාර්තා කළ නොහැකි බව ආයතනයට දැනුම් දීම.
- ආයතනය විසින් තීරණය කළ විශේෂිත නිවාඩු දිනයක් පිළිබඳ ව රටපුරා පිහිටි තම සියලුම ශාඛාවලට දැනුම් දීම.

- ඔබ කණ්ඩායමට ලැබුණු පණිවුඩය යවන්නා හා ලබන්නා කණ්ඩායම් සාකච්ඡාවක් තුළින් හඳුනා ගන්න.
- යවන්නා විසින් යැවිය යුතු පණිවුඩය කණ්ඩායම් සාකච්ඡාවක් මඟින් සකස් කරන්න.
- එම පණිවුඩය යැවිය හැකි ආකාර යෝජනා කරන්න.
- ඔබ සකස් කළ පණිවුඩය යවන්නාගේ සිට ලබන්නා දක්වා යැවීමේ දී සිදු වූ ක්‍රියාදාමය රූප සටහනකින් පෙන්වන්න.
- ඉහත ඔබ කණ්ඩායම විසින් සකස් කළ පණිවුඩය, සකස් කිරීමේ දී අවධානය යොමු කළ කරුණු පෙළගස්වන්න.
- සන්නිවේදනය පහත සඳහන් කාර්ය සඳහා වැදගත්වන ආකාරය පෙන්වා දෙන්න.
    - ව්‍යාපාරික කටයුතු සඳහා
    - සාමාජීය කටයුතු සඳහා
- ඔබේ අනාවරණ නිර්මාණශීලිව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට හෝ පාර්ශව කීපයකට තොරතුරු යැවීම, ලැබීම, තොරතුරු තේරුම් ගැනීම හා බෙදා ගැනීම සන්නිවේදනය යනුවෙන් විග්‍රහ කළ හැකි බව.
- ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනය පහත සඳහන් ආකාරයෙන් වැදගත් වන බව.

  **නිදසුන්**
    - වෙළෙඳ ගනුදෙනුවල දී අදාළ පාර්ශව අතර අදහස් හුවමාරු කර ගැනීම සඳහා
    - සේව්‍ය-සේවක සම්බන්ධතා පවත්වා ගැනීම සඳහා
    - අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා
    - මානව හා භෞතික සම්පත් මනාව කළමනාකරණය කිරීම සඳහා
- සාමාජීය වශයෙන් සෑම කටයුත්තක් සඳහා ම සන්නිවේදනය වැදගත් වන බව.
- සන්නිවේදන ක්‍රියාවලිය පහත සඳහන් රූප සටහනින් දැක්විය හැකි බව.



- සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග පහත දැක්වෙන බව.
    - යවන්නා
    - පණිවිඩය
    - මාධ්‍යය
    - ලබන්නා
    - ප්‍රතිචාරය
    - ප්‍රතිපෝෂණය

- සඵලදායී සන්නිවේදනයක තිබිය යුතු ගුණාංග පහත දැක්වෙන ලෙස ලැයිස්තුගත කළ හැකි බව.
    - නිවැරදි බව
    - සංක්ෂිප්ත බව
    - පූර්ණ බව
    - පැහැදිලි බව
    - ආචාරශීලි බව
    - නිශ්චිත බව
    - සැළකිලිමත් බව (අවධානීය බව)
    - පිරිවැය අවම බව
    - වේගවත් බව

- පණිවිඩයක් සකස් කිරීමේ දී පහත දැක්වෙන කරුණු කෙරෙහි සැළකිලිමත් විය යුතු බව.
    - පණිවුඩයේ ස්වභාවය
    - පූර්ණත්වය
    - නිවැරදි බව
    - ආචාරශීලි බව
    - ග්‍රාහකයාට තේරුම් ගැනීමේ හැකියාව
    - සංක්ෂිප්ත බව
    - නිශ්චිත බව

**නිපුණතා මට්ටම 10.2 :** විවිධ සන්නිවේදන ක්‍රම විමසමින් සඵලදායි සන්නිවේදන සේවා තෝරා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- සන්නිවේදන ක්‍රම හඳුන්වයි.
- ඒ එක් එක් සන්නිවේදන ක්‍රම දක්වා ඒ එක් එක් ක්‍රමය සඳහා නිදසුන් ඉදිරිපත් කරයි.
- නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම වෙන වෙනම පැහැදිලි කරයි.
- ව්‍යාපාර ආයතනයක යොදාගන්නා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ක්‍රම ලැයිස්තු ගත කරයි.
- සන්නිවේදන කාර්යයට ඇති බාධා පැහැදිලි කර ඒවා පිටුදැකීමට ක්‍රමෝපාය යෝජනා කරයි.
- එක් එක් සන්නිවේදන ක්‍රමයේ වාසි හා අවාසි සසඳයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- විදුහල්පතිතුමා පාසලේ ප්‍රධාන රැස්වීම ඇමතීමට, කාලච්ඡේද වෙනස් වීම දැන්වීමට, සිසුන්ගේ ප්‍රගතිය දෙමාපියන් වෙත දැන්වීමට, පාසල යොදාගන්නා සන්නිවේදන ක්‍රම සිසුන්ගෙන් විමසන්න.
- පහත සඳහන් කරුණු මතු කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
    - විදුහල්පතිතුමා ප්‍රධාන රැස්වීම ඇමතීමට වාචික සන්නිවේදනය යොදා ගන්නා බව.
    - කාලච්ඡේද වෙනස්වීම දැන්වීමට සංඥා සන්නිවේදනය යොදා ගන්නා බව.
    - සිසු ප්‍රගතිය දෙමාපියන්ට දැන්වීමට ලිඛිත සන්නිවේදනය යොදා ගන්නා බව.
    - මේවා සන්නිවේදන ක්‍රම බව.
    - මෙලෙසම ව්‍යාපාර ආයතන ද ලිඛිත, වාචික හා සංඥා සන්නිවේදනය යොදා ගන්නා බව.

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත සඳහන් වන්නේ සන්නිවේදන ක්‍රම දැක්වෙන පින්තූර කිහිපයකි. ඒවායින් ඔබේ කණ්ඩායමට ලැබෙන සන්නිවේදන ක්‍රමය කෙරෙහි අවධානය යොමු කරන්න.


**දුරකථන සංවාදයක්**


**දැන්වීම් පුවරුවක්**


**මාර්ග විදුලි සංඥා**

- ඔබ කණ්ඩායමට ලැබුණු සන්නිවේදන ක්‍රමය පැහැදිලි කිරීමට උත්සාහ ගන්න.
- එම ක්‍රමය මඟින් සන්නිවේදනය සිදුවන අවස්ථාවලට හැකිතාක් නිදසුන් ඉදිරිපත් කරන්න.
- ඒවා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන ක්‍රම ලෙස වෙන්කර දක්වන්න.
- ඔබේ කණ්ඩායමට ලැබුණු සන්නිවේදන ක්‍රමයට අදාළ විද්‍යුත් සන්නිවේදන ක්‍රම එක එකක් වෙන වෙනම පැහැදිලි කරන්න.
- ඔබ කණ්ඩායමට ලැබුණු සන්නිවේදන ක්‍රමය මඟින් සන්නිවේදනය සිදු කිරීමේ වාසි හා අවාසි වෙන වෙනම පෙළ ගස්වන්න.
- එම සන්නිවේදන ක්‍රමය ප්‍රායෝගික භාවිතයේ දී ඇති විය හැකි බාධා පෙන්වා දෙන්න.
- එම බාධා අවම කර ගැනීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.
- ඔබේ අනාවරණ නිර්මාණශීලී ව සමස්ත පන්තියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- සන්නිවේදනය සඳහා පහත සඳහන් ක්‍රම යොදා ගන්නා බව.
  - වාචික ක්‍රම
  - ලිඛිත ක්‍රම
  - සංඥා හා සංකේත ක්‍රම
- විවිධ සන්නිවේදන ක්‍රම මඟින් සන්නිවේදනය සිදු කෙරෙන ආකාරවලට නිදසුන් පහත දැක්වෙන බව.

| | | |
|---|---|---|
| **වාචික** | අභ්‍යන්තර | **නිදසුන් :** සම්මුඛ සාකච්ඡා, සම්මන්ත්‍රණ, රැස්වීම්, ඉන්ටර්කොම් |
| | බාහිර | **නිදසුන් :** දුරකථනය, ජංගම දුරකථනය, ශබ්ද විකාශන යන්ත්‍රය |
| **ලිඛිත** | අභ්‍යන්තර | **නිදසුන් :** මෙමෝ පත, නිවේදනය, දැන්වීම් පුවරුව |
| | බාහිර | **නිදසුන් :** ලිපිය, පුවත්පත්, සඟරා, බැනරය, පෝස්ටරය, ෆැක්ස් පණිවුඩය |
| **සංඥා හා සළකුණු** | අභ්‍යන්තර | **නිදසුන් :** සීනුව, විදුලි සීනුව, මඟ සලකුණු |
| | බාහිර | **නිදසුන් :** ඇසුරුම් සංකේත, අනතුරු හඟවන නලා, දුම්රිය මාර්ග හා මහා මාර්ග සංඥා |

- ව්‍යාපාර ආයතනයක් යොදා ගන්නා බාහිර හා අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම පහත දැක්වෙන අයුරින් ලැයිස්තු ගත කළ හැකි බව.
- අභ්‍යන්තර
  - දැන්වීම් පුවරු
  - රැස්වීම්
  - ඉන්ටර්කොම්
  - චක්‍ර ලේඛන
  - ලිපිය
  - මෙමෝ පත්‍ර
  - වාර්තා
- බාහිර
  - දුරකථන
  - බාහිර ලිපි
  - බාහිර දැන්වීම්
  - පෝස්ටර්
  - බැනර්
  - ගැසට් පත්‍ර
  - පුවත් පත්
  - රූපවාහිනී
  - ඊ-මේල්
  - ෆැක්ස්
- නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වෙන අයුරින් පැහැදිලි කළ හැකි බව.

**<u>අන්තර්ජාල (Internet)</u>**

පුළුල් පරාසයක් ආවරණය කරන පරිගණක ජාලයක් හෙවත් අන්තර්ජාතික වශයෙන් ඇති පරිගණක ජාලයකි. මෙහි දී විවිධ ස්ථානවලින් ඇතුළත් කරන තොරතුරු පෞද්ගලික පරිගණක ආශ්‍රයෙන් ලබා ගත හැකි ය.

**<u>විද්‍යුත් තැපැල</u>**

පරිගණකයකින් පරිගණකයකට අන්තර්ජාලය මගින් පණිවුඩ හුවමාරු කිරීම විද්‍යුත් තැපැල ලෙස හඳුන්වයි. පෞද්ගලික පරිගණකයකට සම්බන්ධ කර ඇති මොඩම් එකක් හෝ පර්යන්තයක් භාවිත කරමින් පණිවුඩය ලබන්නාගේ විද්‍යුත් තැපැල් අංකය ටයිප් කිරීමෙන් සටහන් හා දිගු ලියවිලි පවා විද්‍යුත් තැපැල මගින් යැවිය හැකි ය.

**ඉන්ට්‍රානෙට්**

වෙබ් තාක්ෂණය සහ අන්තර්ජාල ප්‍රමිතීන් පදනම් කරගෙන ආයතනයක් තුළ පුළුල් සම්බන්ධතා අන්තර්ජාලය මගින් නිර්මාණය කිරීමකි. අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතනය තුළ ඇති දත්තවලට ළඟාවීමට සලසා ඇති ආයතනමය ජාලයකි.

**හඬ තැපැල**

යවන්නා විසින් දුරකථන මාර්ගයෙන් වාචිකව දෙනු ලබන පණිවුඩය ජාල මාර්ගයෙන් පරාවර්තනය වී පසුව ලබා ගැනීම පිණිස තැටියක ගබඩා කිරීමේ හෙවත් පටිගත කිරීමේ ක්‍රියා පද්ධතියකි.

**ෆැක්ස් යන්ත්‍ර**

සාමාන්‍ය දුරකථන පද්ධතියක් මගින් ලිපි සහ චිත්‍ර අඩංගු ලියවිලි ක්ෂණිකව යැවීමට හැකියාව ඇති විද්‍යුත් උපකරණයකි. ෆැක්ස් ක්‍රමයේ දී පණිවුඩය යවනු ලබන ෆැක්ස් යන්ත්‍රය අදාළ ලියවිලිවල ඡායා පිටපත් ඩිජිටල් තාක්ෂණය මගින් එය ලබන ෆැක්ස් යන්ත්‍රය වෙත පරාවර්තනය කරයි.

**ඉන්ටර්කොම්**

දුරකථන ජාලයක් ආශ්‍රයෙන් ආයතනය තුළ තොරතුරු හුවමාරු කර ගැනීමට ආයතනය තුළ පෞද්ගලික දුරකථන ජාලයක් සකස් කර ගැනීමකි.

- සඵලදායී සන්නිවේදනයට පහත සඳහන් ආකාරයේ බාධාවන් ඇතිවන බව.
  - නව තාක්ෂණ ක්‍රම භාවිතය පිළිබඳ ඇති දැනුම දුර්වල වීම
  - සන්නිවේදන උපකරණ භාවිතයේ දී සිදුවන බාහිර බාධා
  - පැරණි සන්නිවේදන ක්‍රම භාවිතයට ගැනීම
  - සන්නිවේදන ගලායාමේ මාර්ගයේ දී ඇතිවන බාධා
  - සන්නිවේදන සැලසුම්වල ඇති දුර්වලතා
  - භාෂා ප්‍රශ්න, දැනුම, ආකල්ප වැනි දේ
- සන්නිවේදන කාර්යයට ඇති බාධා පිටු දැකීමට කටයුතු කළ යුතු බව.
- එක් එක් සන්නිවේදන ක්‍රමයේ වාසි හා අවාසි ඇති බව.

  **ලිඛිත සන්නිවේදනය - වාසි**
  - වඩාත් විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම
  - තොරතුරු සන්නිවේදනය කළ බවටත් ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම
  - දත්ත, සටහන්, වගු යනාදිය පහසුවෙන් සන්නිවේදනය කළ හැකි වීම

**ලිඛිත සන්නිවේදනය - අවාසි**

- තොරතුරු අවබෝධ කර ගැනීමේ දී ගැටලු ඇති වීම
- කියවීමේ හැකියාව නොමැති නම් තොරතුරු සන්නිවේදනය කිරීම අපහසු වීම
- තොරතුරු සන්නිවේදනය කිරීමේ දී විකෘති වීම

**වාචික සන්නිවේදනය - වාසි**

- ගැටලුවක් වඩාත් විස්තරාත්මකව ඉදිරිපත් කොට, සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම
- තොරතුරු වඩාත් ඉක්මනින් හා රහසිගතව ඉදිරිපත් කළ හැකි වීම

**වාචික සන්නිවේදනය - අවාසි**

- භාෂාමය ගැටලු ඇති වීම
- වාචිකමය දුර්වලතා ඇති පාර්ශව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නොමැති වීම

**සංඥා හා සංකේත සන්නිවේදනය - වාසි**

- තොරතුරු කෙටියෙන්, පැහැදිලිව ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරුවල නිරවද්‍යතාවය ඉහළ මට්ටමක පැවතීම
- තොරතුරු පහසුවෙන් අවබෝධ කරගත හැකි වීම.

**සංඥා හා සංකේත සන්නිවේදනය - අවාසි**

- දෘෂ්ඨි ගැටලු හා ඌනතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇති වීම
- සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසු වීම

**නිපුණතාව 11.0** : නිෂ්පාදිත බෙදා හැරීම සඳහා වෙළෙඳාම දායක වන අයුරු විමසයි.

**නිපුණතා මට්ටම 11.1** : වෙළෙඳාමේ ප්‍රභේද පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සිල්ලර වෙළෙඳාම සිදුවන අයුරු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 06

**ඉගෙනුම් ඵල :**

- වෙළෙඳාම හඳුන්වයි.
- වෙළෙඳාම ප්‍රභේද කොට දක්වයි.
- සිල්ලර වෙළෙඳාම පිළිබඳ විමර්ශනයක යෙදෙයි.
- සිල්ලර වෙළෙන්දාගෙන් ඉටුවන සේවය අගයයි.
- බෙදාහැරීමේ ක්‍රියාවලිය සිදුවන විවිධ ස්වරූප විස්තර කරයි.
- වෙළෙඳ අතරමැදියන් හඳුන්වා දෙමින් ඔවුන්ගේ කාර්යභාරය විමර්ශනයට ලක් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ගැනුම්කරුවකු හා විකුණුම්කරුවකු අතර, නිෂ්පාදිත භාණ්ඩ හා සේවා හුවමාරුවීමේ ක්‍රියාවලිය වෙළෙඳාම ලෙස හැඳින්විය හැකි බව.
- මිලදී ගැනීමත් විකිණීමත් යන ප්‍රධාන කාර්ය පදනම් කරගෙන වෙළෙඳාම සිදුවන බව.
- මෙහි දී නිෂ්පාදිතයේ හිමිකම එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට මාරු වීමක් සිදුවන බව.
- වෙළෙඳාමේ ප්‍රභේද පහත දැක්වෙන ආකාරයට ගැලීම් සටහනකින් ඉදිරිපත් කළ හැකි බව




- රටක දේශ සීමාව තුළ සිදුවන වෙළෙඳ ගනුදෙනු දේශීය වෙළෙඳාම බව.
- දේශීය වෙළෙඳාම පහත සඳහන් පරිදි ප්‍රභේද දෙකකින් යුක්ත බව
  - සිල්ලර වෙළෙඳාම
  - තොග වෙළෙඳාම
- අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා විකිණීම සිල්ලර වෙළෙඳාම බව

- සිල්ලර වෙළෙඳුන්ගෙන් පහත සඳහන් පාර්ශවයන්ට විශාල සේවයක් සැලසෙන බව
    - නිෂ්පාදකයාට
    - තොග වෙළෙන්දාට
    - පාරිභෝගිකයාට
- නිෂ්පාදකයාට සැලසෙන සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
    - නිෂ්පාදකයාට අවශ්‍ය තොරතුරු සැපයීම
    - ප්‍රදර්ශන පුවරු හා පෝස්ටර් ප්‍රදර්ශනය, සාම්පල් බෙදා දීම, ප්‍රදර්ශන කටවුට් යනාදිය මගින් භාණ්ඩ ප්‍රවර්ධනයට සහාය වීම
- තොග වෙළෙන්දාට සැලසෙන සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
    - විවිධ වර්ගයේ භාණ්ඩ තොග වෙළෙන්දාගෙන් ගෙන රැස්කර තබා ගැනීම
    - තොග වෙළෙන්දාට ප්‍රයෝජනවත් තොරතුරු ලබා දීම
- පාරිභෝගිකයාට සැලසෙන සේවා කිහිපයක් පහත දැක්වෙන බව.
    - පාරිභෝගිකයාට අවශ්‍ය භාණ්ඩ අවශ්‍ය ප්‍රමාණයෙන් අවශ්‍ය වේලාවට සැපයීම
    - පාරිභෝගිකයාට භාණ්ඩ හඳුන්වා දීම
    - පාරිභෝගිකයාට ණයට භාණ්ඩ සැපයීම
    - භාණ්ඩ පරිහරණය කරන ආකාරය පැහැදිලි කර දීම
- නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා දක්වා භාණ්ඩ බෙදා හැරීමේ දී අතර මැදියන් රාශියක් සම්බන්ධ වන බව.
- පාරිභෝගික භාණ්ඩ බෙදා හැරීමේ මාර්ග පහත දැක්වෙන සටහනින් දැක්විය හැකි බව.



**නිපුණතා මට්ටම 11.2 :** දේශීය වෙළෙඳාමේ උන්නතිය පිළිබඳ ව සැලකිලිමත් වෙමින් අවශ්‍යතා සපුරා ගැනීමට උචිත සිල්ලර වෙළෙඳසැල් තෝරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- සිල්ලර වෙළෙඳසැල් වර්ගීකරණය කළ හැකි පදනම් අනාවරණය කරයි.
- සිල්ලර වෙළෙඳසැල් වර්ගීකරණය කොට දක්වයි.
- එකිනෙක සිල්ලර වෙළෙඳසැල් වර්ගයෙහි සුවිශේෂ ලක්ෂණ ගෙනහැර දක්වයි.
- සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතා අනාවරණය කරයි.
- සිල්ලර වෙළෙඳාම සම්බන්ධ අනාගතය පුරෝකථනය කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය :**

**පිවිසීම :**

- ආහාර වර්ග කිහිපයක, ඇඳුම් වර්ග කිහිපයක, විදුලි උපකරණ කිහිපයක පින්තූර පන්තියට ප්‍රදර්ශනය කරන්න.
- එම භාණ්ඩ පාරිභෝගිකයා ලබා ගන්නේ කාගෙන්ද? කොහෙන්ද? ආදී වශයෙන් විමසන්න.
- පහත දැක්වෙන කරුණු මතු කරමින් සාකච්ඡාවක යෙදෙන්න.
  - විවිධ සිල්ලර වෙළෙන්දන් හා වෙළෙඳසැල් මගින් පාරිභෝගික අවශ්‍යතා සපුරා ගන්නා බව
  - සමහර භාණ්ඩ හා සේවා පාරිභෝගිකයා ළඟට වෙළෙන්දා ගෙන එන බව
  - ඇතැම් දේ සොයා පාරිභෝගිකයා වෙළෙන්දා ළඟට යන බව

**ඉගෙනුම සඳහා යෝජිත උපදෙස් :**

- පහත දැක්වෙන්නේ සිල්ලර වෙළෙඳාම නියෝජනය කරන ව්‍යාපාරිකයන් හෝ ආයතන කීපයකි.
  - එළවළු කරත්තය
  - පරිගණක අලෙවි රථය
  - ජනහිත ග්‍රොසරිය
  - මිලානෝ සුපර් සිටි
- ඔබගේ කණ්ඩායමට ලැබෙන වෙළෙන්දා හෝ ව්‍යාපාරය ගැන සැලකිලිමත් වෙමින් පහත කරුණු අනාවරණය කරන්න.
  - ඔබට ලැබුණු ව්‍යාපාරය හා සමානවන වෙනත් වෙළෙන්දන් හෝ ව්‍යාපාර ආයතන ඇත්නම් ලියා දක්වන්න.

- එම වෙළෙඳුන් හෝ ව්‍යාපාර ආයතන සියල්ලටම පොදු වූ ලක්ෂණ ගොනු කර දක්වන්න.
- ඔබට ලැබුණ ව්‍යාපාරවල නව ප්‍රවණතා මොනවා දැයි පෙන්වා දෙන්න.
- ඔබගේ අනාවරණ නිර්මාණශීලීව සමස්ත පංතියට ඉදිරිපත් කිරීමට සූදානම් වන්න.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :

- ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව සිල්ලර වෙළෙඳුන් මූලික ව පහත දැක්වෙන ලෙස වර්ග කළ හැකි බව.
  - සංචාරක සිල්ලර වෙළෙඳුන්
  - ස්ථාවර සිල්ලර වෙළෙඳුන්
- ඒ ඒ වර්ගයට අයත් සිල්ලර වෙළෙඳුන් පහත දැක්වෙන ගැලීම් සටහන මගින් දැක්විය හැකි බව.

සිල්ලර වෙළෙඳාම

- සංචාරක (ජංගම)
  - සුළු පරිමාණ
    - තොරම්බල්කරු
    - පොළින්පොළට යන්නා
    - කරත්තකරු හා බයිසිකල්කරු
  - මහා පරිමාණ
    - වෑන් රථ හා ලොරි මගින් ගෙන්ගෙට යන වෙළෙඳ නියෝජිතයන්
- ස්ථාවර
  - සුළු පරිමාණ
    - කඩ මැස්ස
    - කඩපිල
    - කඩය
    - කුඩා සාප්පුව
  - මහා පරිමාණ
    - ආංශික වෙළෙඳසැල්
    - නානාංශ වෙළෙඳසැල්
    - බැඳි වෙළෙඳසැල්
    - සුපිරි වෙළෙඳසැල්
    - විශේෂිත වෙළෙඳසැල්
    - බදු රහිත වෙළෙඳ සැල්
    - වෙළෙඳ මධ්‍යස්ථාන
    - වෙළෙඳ සංකීර්ණ

- ස්ථානයෙන්, ස්ථානයට ගමන් කරමින් භාණ්ඩ විකිණීම සංචාරක (ජංගම) වෙළෙඳාම වන බව හා එක් ස්ථානයක රැඳෙමින් භාණ්ඩ විකිණීම ස්ථාවර වෙළෙඳාම වන බව.
- සංචාරක සහ ස්ථාවර වෙළෙඳාම සුළු පරිමාණ සහ මහා පරිමාණ වශයෙන් වර්ග කළ හැකි බව.
- විවිධ වර්ගයේ කුඩා විසිතුරු බඩු බයිසිකල්වල / කරත්ත ආදියෙහි රඳවමින් සුලු පරිමාණව භාණ්ඩ අලෙවි කිරීමේ යෙදෙන්නා තොරොම්බල්කරු බව.
- එක් ස්ථානයක භාණ්ඩ රැඳවීමට කුඩා ස්ථානයක් සකසමින්, එහි එළවළු, පලතුරු යනාදිය සුළුවෙන් රඳවා සිදුකරනු ලබන වෙළෙඳාම කඩ මැස්ස බව.
- එකම ගොඩනැගිල්ලක් තුළ එක් එක් භාණ්ඩ වර්ග සඳහා වෙන වෙනම අංශ පවත්වා ගෙන යමින් එකම හිමිකාරිත්වයක් යටතේ ක්‍රියාත්මක වන වෙළෙඳසැල් ආංශික වෙළෙඳසැල් බව.
- එක් නිෂ්පාදකයකුගේ භාණ්ඩ බෙදා හැරීමට රටපුරා ශාඛා වෙළෙඳසැල් පවත්වාගෙන යමින් විකිණීම සිදු කරනු ලබන ව්‍යාපාර නානාංශ වෙළෙඳසැල් බව.
- එක් නිෂ්පාදකයකුගේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට ගිවිසුම්ගතව බැඳි ක්‍රියාත්මක වන වෙළෙඳසැල් බැඳි වෙළෙඳසැල් බව.

  (ඉහත රූප සටහනේ ඇතුළත් අනෙකුත් වෙළෙඳසැල් කෙටියෙන් විස්තර කරන්න.)
- වර්තමාන සිල්ලර වෙළෙඳාමේ නව ප්‍රවණතා කිහිපයක් පහත දැක්වෙන බව.
  - නවීන කළමනාකරණ ශිල්පීය ක්‍රම යොදා ගැනීම
  - සාපේක්ෂව මහා පරිමාණ සිල්ලර වෙළෙඳසැල් පවත්වාගෙන යාම
  - විශාල වශයෙන් තොග රඳවා නොගෙන, අවශ්‍ය ප්‍රමාණයට විගසින්ම තොග ලබා ගැනීම (JIT)
  - පරිගණකගත කළ මිල දර්ශන
  - ණය කාඩ්පත් මගින් ගෙවීම් කිරීම
  - ගනුදෙනුකරුවන් සමග ජාල සම්බන්ධතා පවත්වා ගැනීම

**නිපුණතා මට්ටම 11.3 :** තොග වෙළෙඳාම සිදුවන අයුරු විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- තොග වෙළෙඳාම පැහැදිලි කරයි.
- තොග වෙළෙඳාමේ ලක්ෂණ විස්තර කරයි.
- තොග වෙළෙඳුන්ගෙන් නිෂ්පාදකයාට හා සිල්ලර වෙළෙන්දාට ඉටුවන සේවා වෙන වෙනම පැහැදිලි කරයි.
- නියෝජිතයන් හඳුන්වා ඔවුන්ගේ කාර්යභාරය විස්තර කරයි.
- වෙළෙඳාම සඳහා අතරමැදියන් යොදා ගැනීමේ වාසි හා අවාසි සඳහන් කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- නැවත විකිණීම සඳහා හෝ වෙනත් ව්‍යාපාරික අරමුණු සඳහා නිෂ්පාදිත මිලට ගැනීම තොග වෙළෙඳාම ලෙස හැඳින්විය හැකි බව.
- තොග වෙළෙඳාමේ පහත ලක්ෂණ දැකිය හැකි බව.
  - නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීම
  - භාණ්ඩ තොග වශයෙන් අලෙවි කිරීම
  - වෙළෙඳ වට්ටම් ලබා දීම
  - භාණ්ඩ තොග වශයෙන් ගබඩා කොට තිබීම
  - භාණ්ඩ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
  - වෙළෙඳපොළ පිළිබඳ පර්යේෂණ කිරීම
  - තොග ප්‍රවාහනය කර දීම
- තොග වෙළෙන්දන්ගෙන් පහත සඳහන් පාර්ශවයන්ට විවිධ සේවා සැලසෙන බව.
  - නිෂ්පාදකයාට
  - සිල්ලර වෙළෙන්දාට
- නිෂ්පාදකයාට සැලසෙන සේවා

  **නිදසුන් :**
  - තොග වශයෙන් භාණ්ඩ ලබා ගැනීම
  - වෙළෙඳපොළ පිළිබඳ තොරතුරු ලබා දීම
- සිල්ලර වෙළෙන්දාට සැලසෙන සේවා

  **නිදසුන් :**
  - භාණ්ඩ තොග වශයෙන් සැපයීම
  - මූල්‍ය පහසුකම් ලබා දීම
  - සිල්ලර වෙළෙඳසැලට ගෙනවිත් භාර දීම

- කිසියම් ප්‍රධානියෙකුගේ බලය පිට, යම් කාර්යයක නිරත වන්නා නියෝජිතයෙකු බව.
- නියෝජිතයන් ඔවුන් සපයන සේවා අනුව පහත පරිදි වර්ග කළ හැකි බව

**නියෝජිතයෝ**

කොමිස් නියෝජිතයෝ | බ්‍රෝකර්වරු | සාධ්‍යයකයා | කැපකරු නියෝජිතයා | වෙන්දේසිකරු

- ප්‍රධානියාට වාසිදායක වන ලෙස තම අභිමතය පරිදි ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමක් හෝ විකිණීමක් සිදු කරමින් ඒ මත කොමිස් මුදලක් ලබා ගන්නා නියෝජිතයා, කොමිස් නියෝජිතයා බව.
- ගනුදෙනුවකට අදාළ ගැනුම්කරු හා විකුණුම්කරු සම්මුඛ කරමින්, ඊට අදාළ ඉඩකඩ සලසා දෙපාර්ශවයෙන්ම තැරැව් ගාස්තු ලබා ගන්නා පුද්ගලයා බ්‍රෝකර් / තැරැව්කරු බව.
- ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ මිලට ගැනීමේ දී හෝ විකිණීමේ දී එම ගනුදෙනු තම පෞද්ගලික නමින් සිදුකරනු ලබන නියෝජිතයා සාධ්‍යයකයා බව.
- ප්‍රධානියා වෙනුවෙන් ණයට භාණ්ඩ විකිණීමක් සිදුව තිබේ නම් එම ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් එකතු කරදීමට කැපවෙමින් කටයුතු කරන නියෝජිතයා කැපකරු නියෝජිතයා බව. ඔහුට සාමාන්‍ය කොමිස් මුදල්වලට අමතර ව, කැපකරු කොමිස් මුදල් ද හිමිවන බව.
- අදාළ භාණ්ඩ වෙනුවෙන් විවෘතව, වාචිකව ඉහළ මිල ගණන් ඉදිරිපත් කළ ගැණුම්කරුවන්ට ප්‍රධානියාගේ භාණ්ඩ අලෙවි කරමින්, එම කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන පාර්ශවය වෙන්දේසිකරු බව. මේ සඳහා ඔවුන්ට වෙන්දේසි ගාස්තු හිමිවන බව.
- වෙළෙඳාමේ දී, සිල්ලර වෙළෙන්දා, තොග වෙළෙන්දා, නියෝජිතයා ආදීන් අතරමැදියන් ලෙස යොදා ගන්නා බව.
- පොදුවේ අතරමැදියන් යොදා ගැනීමේ වාසි සහ අවාසි කිහිපයක් පහත දැක්වෙන බව.

<u>**වාසි**</u>

- භාණ්ඩ බෙදා හැරීම පහසුවීම
- තම භාණ්ඩ හඳුන්වා දීම පහසුවීම
- නිෂ්පාදකයාගේ කාර්ය පහසුවීම
- වෙළෙඳපොළ තොරතුරු අදාළ පාර්ශවයන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම

<u>**අවාසි**</u>

- වෙළෙඳපොළේ අනවශ්‍ය භාණ්ඩ හිඟයක් ඇතිවිය හැකි වීම
- භාණ්ඩවල මිල ගණන් ඉහළ යා හැකි වීම

**නිපුණතා මට්ටම 11.4 :** විදේශ වෙළෙඳාම හා ඒ ආශ්‍රිත ප්‍රතිලාභ හා බාධක විමසයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- විදේශ වෙළෙඳාම පැහැදිලි කරයි.
- විදේශීය වෙළෙඳාමට පදනම් වූ සාධක විස්තර කරයි.
- විදේශීය වෙළෙඳාමේ ප්‍රභේද වෙන වෙනම පැහැදිලි කරයි.
- විදේශීය වෙළෙඳාමේ ප්‍රතිලාභ අගයයි.
- නිදහස් වෙළෙඳාම අර්ථ දක්වයි.
- නිදහස් වෙළෙඳාමට ඇති බාධක තීරුබදු හා තීරුබදු නොවන වශයෙන් වර්ග කර ඒවා පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- යම් රටක්, වෙනත් රටක් හෝ රටවල් සමග සිදුකරන වෙළෙඳාම විදේශ වෙළෙඳාම බව.
- විදේශ වෙළෙඳාම සඳහා පහත සාධක පදනම් වී ඇති බව.
    - වක්‍ර නිෂ්පාදනය
    - නිෂ්පාදනයේ අතිරික්තයක් හෝ ඌණතාවක් ඇතිවීම
    - නිෂ්පාදන පිරිවැය
    - ගෝලීයකරණය
    - වර්ණයන් වෙනස්වීම
    - භාණ්ඩ ප්‍රවර්ධනය
    - වෙළෙඳ බාධක අවම වීම
- කිසියම් රටක් විදේශ රටකින් හෝ රටවලින් භාණ්ඩ ගෙන්වීම ආනයනය බව. මේ නිසා අදාළ රටට විදේශ විනිමය වැයවන බව.
- කිසියම් රටක් විදේශ රටකට හෝ රටවලට භාණ්ඩ යැවීම අපනයනය බව. මෙයින් අදාළ රටට විදේශ විනිමය ලැබෙන බව.
- විදේශ රටවලින් ආනයනය කරන ලද ද්‍රව්‍ය, වරාය තුළ දී නැවත සකසා හෝ සැකසීමකින් තොරව හෝ අපනයනය කරයි නම්, එය අන්තරාල වෙළෙඳාම බව හා, ආනයනය කරන ලද ද්‍රව්‍ය රට තුළට ගෙනවිත් වෙනසකට භාජනය කර හෝ ඒ ආකාරයෙන්ම නැවත අපනයනය කිරීම ප්‍රති අපනයනය කිරීම බව.

- රටක් විදේශ වෙළෙඳාමේ නිරතවීමෙන් විවිධ ප්‍රතිලාභ ළඟාකරගත හැකි බව.
    - අතිරික්ත නිෂ්පාදිත අපනයනය කළ හැකිවීම
    - නිපදවිය නොහැකි නිෂ්පාදිත ආනයනය කළ හැකි වීම
    - විදේශ විනිමය උපයාගත හැකි වීම
    - ජාත්‍යන්තර වෙළෙඳ සබඳතා වර්ධනය වීම
    - නව තාක්ෂණික හා කළමනාකරණ නිපුණතා වර්ධනය වීම
    - නව ජාත්‍යන්තර වෙළෙඳපොළවල් විවෘත වීම
    - අන්තර් ජාතික සහයෝගීතාව වර්ධනය වීම
    - වැඩි වැඩියෙන් භාණ්ඩ පරිභෝජනය කළ හැකි වීම
- කිසිදු බාධාවකින් තොරව විවිධ පාර්ශවයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් පැවතීම නිදහස් වෙළෙඳාම බව.
- නිදහස් වෙළෙඳාමට ඇතිවන බාධක තීරු බදු හා තීරු බදු නොවන ලෙස වර්ග කළ හැකි බව.
- රටවල් අතර වෙළෙඳාමේ දී තීරු බදු පැනවීම නිදහස් වෙළෙඳාමට බාධාවක් බව.
- නිදහස් වෙළෙඳාමට බාධා ගෙන දෙන තීරු බදු නොවන සාධක ද පවතින බව.

**නිදසුන්:** ආනයන සීමා කිරීම් / පංගුව
අපනයන සීමා කිරීම් / පංගුව
අපනයන / ආනයන තහනම් කිරීම
වෙළෙඳ ගිවිසුම්
දැඩි විනිමය ප්‍රතිපත්ති

**නිපුණතා මට්ටම 11.5 :** ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය විමසමින් විදේශ වෙළෙඳාමට ප්‍රවේශ වීමේ සූදානම ප්‍රදර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- ආනයන හා අපනයන ක්‍රියා පටිපාටිය විස්තර කරයි.
- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියවිලි හා ක්‍රම පිළිවෙත් පැහැදිලි කරයි.
- විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සිදුවන ආකාර වෙන වෙනම පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- ආනයන හා අපනයන වෙළෙඳ ගනුදෙනු සාමාන්‍යයෙන් ඍජු ක්‍රමය හා නියෝජිත ක්‍රමය යන දෙයාකාරයෙන්ම සිදුවන බව.
- විදේශ නිෂ්පාදකයකු හෝ ඔහුගේ නියෝජිතයෙකු වෙත කෙලින්ම ඇණවුම් ඉදිරිපත් කර භාණ්ඩ ලබා ගැනීම ඍජු ක්‍රමය යටතේ සිදුවන බව.
- (ඉන්ඩෙන්ට්) නියෝජිතයෙකු මගින් භාණ්ඩ ගෙන්වා ගැනීම නියෝජිත ක්‍රමය යටතේ සිදුවන බව.
- ඍජු ක්‍රමය හෝ නියෝජිත ක්‍රමය යන දෙකින් කවර ක්‍රමයක් අනුගමනය කළ ද ආනයන හා අපනයන ක්‍රියාපටිපාටියේ හා ලියකියවිලිවල වෙනසක් සිදු නොවන බව.
- ආනයන ක්‍රියාපටිපාටියට අදාළ පියවර පහත සඳහන් ආකාරයට දැක්විය හැකි බව.
  - විදේශීය සැපයුම්කරුවන් පිළිබඳ විස්තර ලබා ගැනීම
  - මිල විමසුමක් යැවීම
  - මිල කියුමක් ලද පසුව භාණ්ඩ ආනයනය කිරීම පිළිබඳ සුදුසු තීරණයකට එළඹීම
  - ආනයන බලපත්‍ර ලබා ගත යුතු භාණ්ඩ සම්බන්ධයෙන් නම් ආනයන බලපත්‍රයක් ලබා ගැනීම
  - ඉන්ඩෙන්ටුව විදේශ අපනයනකරුවෙත යැවීම
  - අපනයනකරුට ගෙවීම පිළිබඳ කටයුතු කිරීම
  - ආනයන භාණ්ඩ වරායට පැමිණි පසු ඒවා නිදහස් කර ගැනීම.
- අපනයන වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය පහත සඳහන් පරිදි දැක්විය හැකි බව
  - අපනයනකරුවෙකු ලෙස ලියාපදිංචි වීම
  - විදේශ ගැනුම්කරුවන් සොයා ගැනීම
  - අවශ්‍ය වන්නේ නම් අපනයන බලපත්‍ර ලබා ගැනීම
  - ආනයනකරුගෙන් ලැබුණු මිල විමසුමට ප්‍රතිචාරයක් වශයෙන් මිල කියුමක් යැවීම
  - ඉන්ඩෙන්ටුව ලැබීම

- භාණ්ඩ තොගය නැව්ගත කිරීම සඳහා අවශ්‍ය ඉඩකඩ වෙන්කර ගැනීම හා අවශ්‍ය ලියවිලි සකස් කර ගැනීම
- නැව්ගත කිරීමට සුදුසුවන ආකාරයට භාණ්ඩ ඇසුරුම් කිරීම
- අපනයන භාණ්ඩ තොගය රක්ෂණය කිරීම
- භාණ්ඩ නැව්ගත කර නෞභාර පත ලබා ගැනීම
- මුදල් ලබා ගැනීමට අදාළ කටයුතු කිරීම

- ආනයන හා අපනයන වෙළෙඳාමේ දී භාවිත වන ලියකියවිලි පහත සඳහන් ආකාරයට දැක්විය හැකි බව.
    - ආනයන / අපනයන බලපත්‍ර

      මෙවැනි බලපත්‍ර ආනයන හා අපනයන පාලක දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන අතර බලපත්‍ර අවශ්‍ය කරන භාණ්ඩ ආනයන හා අපනයන පාලක විසින් ප්‍රසිද්ධියට පත් කරයි.
    - ඉන්ඩෙන්ටුව

      ආනයනකරුවකු විසින් විදේශීය සැපයුම්කරුවෙකු වෙත යවන මෙම ඇණවුමෙහි ආනයනකරුට අවශ්‍ය භාණ්ඩ පිළිබඳ විස්තර, මිල, නැව්ගත කිරීමට අදාළ තොරතුරු ඇතුළත් කෙරේ.
    - නෞභාරපත

      නැව් සමාගමක් වෙනුවෙන් නැව්පති හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් අපනයනකරු වෙත නිකුත් කෙරේ. නෞභාර පත්‍රයේ සඳහන් භාණ්ඩ තොගය නැවට බාරගත් බවටත් අදාළ රටේ වරායට ගෙන ගොස් බාර දෙන බවටත් නැව් සමාගම මෙයින් පොරොන්දු වේ.
    - ඉන්වොයිසිය

      අපනයනය කරනු ලබන භාණ්ඩවල විස්තර, මිල ගණන්, ගෙවීමේ කොන්දේසි, ගමන් මාර්ගය, ප්‍රතික්ෂේප කිරීමේ කොන්දේසි ආදී විස්තර ඇතුළත් ලේඛනයකි.
    - ප්‍රභවස්ථාන සහතිකය

      නැව්ගත කරන භාණ්ඩ අපනයන රටේ නිපදවා ඇති බව සහතික කරමින් පිළිගත් වෙළෙඳ මණ්ඩලයකින් හෝ රාජ්‍ය ආයතනයකින් නිකුත් කරනු ලබන ලියවිල්ලකි.
    - ණයවර ලිපිය

      අපනයනකරුවෙකු විසින් ආනයනකරු වෙත එවනු ලබන භාණ්ඩවලට මුදල් ගෙවීම සඳහා නිකුත් කරන ලියවිල්ලකි. බොහෝවිට ආනයනකරුගේ ඉල්ලීම මත ඔහුගේ බැංකු විසින් ණයවර ලිපි නිකුත් කරයි.

- ආනයන සටහන්කරය

  ආනයනකරු වෙනුවෙන් වරායට ලැබී ඇති භාණ්ඩ පිළිබඳ අයිතිය ප්‍රකාශ කිරීම සඳහා ආනයනකරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් රේගුව වෙත ඉදිරිපත් කළ යුතු ලියවිල්ලකි.

- අපනයන සටහන්කරය

  තමා අපනයනය කිරීමට අපේක්ෂා කරන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුළත් කර අපනයනකරුවෙකු විසින් අපනයන රටේ රේගුව වෙත ඉදිරිපත් කරන ලියවිල්ලකි.

- රක්ෂණ සහතිකය

  අපනයනට අදාළ භාණ්ඩ තොග අපනයනය කිරීමේ දී, එම භාණ්ඩ තොගය රක්ෂණය කර  අපනයනකරු හෝ ආනයනකරු ලබා ගන්නා රක්ෂණ සහතිකයයි. විකුණුම් ගිවිසුම අනුව රක්ෂණ සහතිකය ලබා ගැනීම අපනයනකරු හෝ ආනයනකරු විසින් කරනු ලබයි.

- වේදිකා කුවිතාන්සිය / වාප්පුකාර කුවිතාන්සිය

  රේගුවට භාණ්ඩ බාර දුන් පසු ඒ බඩු බාරගත් බව සඳහන් කරමින් රේගුවෙන් අපනයනකරුට නිකුත් කරන ලියවිල්ලකි.

- හානි රක්ෂණ ලිපිය

  දූෂ්‍ය නෞභාර පතක් නිකුත් කිරීමේ තත්ත්වයක් එළඹ තිබිය දී කැඩී බිඳීම් හෝ පලුදුවීම් ඇති  එම භාණ්ඩ තොගයේ අනාගත සියලු අවදානම් අපනයනකරු බාර ගන්නා බව සඳහන් කරමින් පාරිශුද්ධ නෞභාරපතක් ලබා ගැනීම සඳහා අපනයනකරුවන් විසින් නැවේ කපිතාන් වෙත නිකුත් කරන ලියවිල්ලයි. නැවට පටවන ලද භාණ්ඩ හොඳ තත්ත්වයේ පවතින විට නිකුත් කරන නෞභාර පත පාරිශුද්ධ නෞභාර පත වේ. නැවට පටවන යම් යම් භාණ්ඩ හෝ මුළු තොගයම හෝ කැඩීම් බිඳීම් හෝ පලුදු සහිත වේ යැයි සඳහන් කර නිකුත් කරන ලියවිල්ල දූෂ්‍ය නෞභාර පත වේ.

- සනීපාරක්ෂක සහතිකය

  ආනයන රටේ අවශ්‍යතාව මත මෙරටින් ඇතැම් රටවලට අපනයනය කරන ඇතැම් කෘෂි නිෂ්පාදිතවල පාරිභෝජන යෝග්‍යතාව තහවුරු කරමින් මෙරට ඇතැම් රජයේ ආයතනවලින් නිකුත් කරන ලියවිල්ලයි.

- ගුදම් බලපත්‍ර

  බන්ධිත ගුදම්වල භාණ්ඩ තැන්පත් කළ පසුව ගුදම් අධිකාරීන් විසින් නිකුත් කරන ලියවිල්ලකි.

- විදේශීය වෙළෙඳාමේ දී මුදල් ගෙවීම සඳහා යොදා ගන්නා ක්‍රම පහත සඳහන් ආකාරයට පැහැදිලි කළ හැකි බව
  - බැංකු අණකරය
  - ණයවර ලිපිය
  - විද්‍යුත් ගෙවීම් ක්‍රම
  - විදේශ තැපැල් හා ටෙලෙක්ස් පැවරුම්

**<u>බැංකු අණකරය</u>**

- මෙය තම රටේම දුර බැහැර ප්‍රදේශයක හෝ විදේශීය රටක හෝ සිටින අයකුට මුදල් යැවීම සඳහා යොදා ගත හැකි ය.

යම් පුද්ගලයකු විසින් සිය බැංකුවට අදාළ මුදල හා නියමිත ගාස්තු ගෙවා දෙන ලද උපදෙස් පරිදි නම් කරනු ලැබූ මුදල් ලැබිය යුතු තැනැත්තාට එම මුදල ගෙවන ලෙස සඳහන් කරමින් මුදල් යවන්නාගේ බැංකුව විසින් මුදල් ලැබිය යුතු තැනැත්තාගේ බැංකුවට හෝ නියෝජිත බැංකුවට නිකුත් කරන ලියවිල්ලකි.

**<u>විද්‍යුත් ගෙවීමේ ක්‍රම</u>**

වර්තමානයේ අන්තර්ජාල සබඳතා උපයෝගී කරගෙන මුදල් ක්ෂණිකව ගෙවිය හැකි ක්‍රම  මෙයට අයත් වේ.

**නිදසුන:** ණය කාඩ්පත

සෘජු බැර පැවරුම් - (Direct Credit transfer)

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, දුරකථන, අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය හරහා හෝ ලිඛිත ස්ථාවර නියෝග මගින් සිය බැංකුවලට උපදෙස් දීමෙන් තම ගිණුම් අතර බැර පැවරුම් කිරීම

**<u>විදේශ තැපැල් හා ටෙලෙක්ස් පැවරුම්</u>**

යම් බැංකුවක් විසින් එම බැංකුව වෙනුවෙන් විදේශ ණය හිමියෙකුට යම් මුදල් ප්‍රමාණයක් ගෙවන ලෙස එම බැංකුවේ විදේශ ශාඛාවට හෝ නියෝජිත බැංකුවකට දුරකථන මගින් හෝ කේබල් ක්‍රමයට කරන අණකි. මේ සඳහා යොදා ගන්නේ විදුලි පණිවිඩ ක්‍රමයයි. ඉහත සඳහන් පරිදි ටෙලෙක්ස් යන්ත්‍රයක් මගින් පණිවුඩ යවයි නම් එය ටෙලෙක්ස් පැවරුම යනුවෙන් හඳුන්වයි. ෆැක්ස් යන්ත්‍රයක් මගින් එසේ යවයි නම් එය ෆැක්ස් පැවරුම වේ.

**නිපුණතා මට්ටම 11.6 :** වෙළෙඳ කලාපවල හා ජාත්‍යන්තර සංවිධානවල ක්‍රියාකාරිත්වය විදේශ වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය විමර්ශනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 06

**ඉගෙනුම් ඵල :**

- වෙළෙඳ කලාප හඳුන්වා ඊට නිදසුන් දක්වයි.
- ජාත්‍යන්තර සංවිධාන විදේශ වෙළෙඳාමේ උන්නතියට දායකවන ආකාරය විමර්ශනය කරයි.
- කාලීන ව ඇතිවන වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන පිළිබඳ ව අධ්‍යයනය කරයි.
- වෙළෙඳ ගිවිසුම් විදේශ වෙළෙඳාමට ඇති කරන බලපෑම විග්‍රහ කරයි.
- විදේශ වෙළෙඳාමේ ප්‍රවණතා විමර්ශනය කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- රටවල් කිහිපයක් විසින් බදු, තීරු ගාස්තු සහ වෙළෙඳාම පිළිබඳ ව ගිවිසුමකට එළඹී නිදහස් වෙළෙඳ ප්‍රදේශයක්, වෙළෙඳ කලාපයක් ලෙස හැඳින්විය හැකි බව.
- වර්තමානය වනවිට වෙළෙඳ කලාප රාශියක් ගෝලීය වශයෙන් දක්නට ඇති බව.
- වෙළෙඳ කලාපවලට නිදසුන් කීපයක් පහත දැක්වෙන බව.
  - යුරෝපීය සංගමය
  - ආසියාන්
  - සාර්ක් සංවිධානය
  - උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම
- විදේශ වෙළෙඳාමේ උන්නතියට එරෙහිව විවිධ සාධක බලපාන බව.
- එම සාධක අතර පහත සඳහන් සාධක ප්‍රධාන වන බව.
  - ස්වාභාවික බාධා

    **නිදා:** භාෂාමය වෙනස්කම්
    සංස්කෘතිකමය වෙනස්කම්
  - ස්වාභාවික නොවන බාධා

    **නිදා:** තීරු ගාස්තු
    ආනයන පංගු කිරීම
    ආනයන තහනම් කිරීම
    විනිමය පාලනය
    රේගු නීති රීති
- විදේශ වෙළෙඳාමට එරෙහි වන මෙම බාධා අවම කර එහි උන්නතිය සඳහා ජාතීන් විසින් විවිධ සංවිධාන පිහිටුවාගෙන ඇති බව.

- එවැනි සංවිධාන කීපයකට නිදසුන් පහත දැක්වෙන බව.
    - ලෝක වෙළෙඳ සංවිධානය (WTO)
    - ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර බැංකුව (IBRD - ලෝක බැංකුව)
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
    - රටවල් අටේ කණ්ඩායම (G8)
- රටවල් දෙකක් හෝ කීපයක් අතර යම්කිසි කාලයක් ඇතුළත වෙළෙඳ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා ඇති කර ගන්නා එකඟත්වය වෙළෙඳ ගිවිසුම් ලෙස සරල ව හැඳින්විය හැකි බව.
- රටවල් දෙකක් අතර, ගිවිසුමක් අත්සන් කර යම් වෙළෙඳ ද්‍රව්‍ය ප්‍රමාණයක් යම් කාලයක් සඳහා හුවමාරු කර ගැනීම ද්වි-පාක්ෂික වෙළෙඳ ගිවිසුම් ලෙසත්, රටවල් දෙකකට වැඩි ප්‍රමාණයක් එකතු වී ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම සඳහා ඇති කර ගන්නා ගිවිසුම් බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් ලෙසත් හඳුන්වන බව.
- වෙළෙඳ ගිවිසුම් ඇති කර ගැනීම තුළින් ස්ථිර වෙළෙඳපොළක් හිමිවීම, මිල උච්ඡාවචනයන්ගෙන් හානි නොවීම හා අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය වීම වැනි වාසි අත්වන බව.
- වර්තමානයේ රටවල් කිහිපයක් එකතු වී, එම රටවල ආර්ථික තත්ත්වය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගැනීම සඳහා ගිවිසුම් ඇති කර ගන්නා බව.
- වර්තමානයේ විදේශීය වෙළෙඳාම හා සම්බන්ධ නව ප්‍රවණතා කීපයක් ඇති වී තිබෙන අතර ඒවාට නිදසුන් කීපයක් දැක්විය හැකි බව.
    - විද්‍යුත් වාණිජ්‍යය හරහා විදේශ වෙළෙඳාම ව්‍යාප්ත වීම
    - විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිත කිරීම
    - වෙළෙඳ කලාප හා වෙළෙඳ හවුල් ඇතිවීම

**නිපුණතා මට්ටම 11.7 :** විද්‍යුත් වාණිජ්‍ය වෙළෙඳාමේ උන්නතියට දායක වන ආකාරය පෙන්වා දෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 05

**ඉගෙනුම් ඵල :**

- විද්‍යුත් වෙළෙඳාම අර්ථ දක්වයි.
- විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියා පටිපාටිය විස්තර කරයි.
- විද්‍යුත් වෙළෙඳාමේ වාසි හා අවාසි සන්සන්දනය කරයි.
- විද්‍යුත් වෙළෙඳාම සිදුවන ආකාර වෙන වෙනම පැහැදිලි කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :**

- විද්‍යුත් ජාල ඔස්සේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් අතර වෙළෙඳපොළ අවකාශ බිහිකරලමින් භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදුවීම විද්‍යුත් වාණිජ්‍යය/ විද්‍යුත් වෙළෙඳාම බව.
- විද්‍යුත් වෙළෙඳාමේ ක්‍රියාපටිපාටිය පහත පරිදි සිදුවිය හැකි බව.
  - අන්තර්ජාලය ඔස්සේ ගැණුම්කරුවන් හා විකුණුම්කරුවන් සම්මුඛ වීම
  - වෙළෙඳ ගණුදෙනුව සංවිධානය කර ගැනීම
  - භාණ්ඩ විකිණීමේ හා මිලට ගැනීමේ කටයුතු සිදුවීම
  - ගණුදෙනුවට අදාළ ගෙවීම් කටයුතු පියවීම
- විද්‍යුත් වෙළෙඳාමෙන් ව්‍යාපාරිකයාට, ගණුදෙනුකරුවන්ට හා සමාජීය වශයෙන් වාසි ලැබෙන බව.
- ව්‍යාපාරිකයාට ලැබෙන වාසි
  - ගණුදෙනුව වේගවත්ව සිදුවීම
  - වෙළෙඳපොළ පුළුල් වීම
  - ගණුදෙනුවට අදාළ ක්‍රියාකාරී පිරිවැය අවම වීම
- පාරිභෝගිකයාට ලැබෙන වාසි
  - භාණ්ඩ තෝරා ගැනීමට පුළුල් ඉඩකඩක් පැවතීම
  - ඇණවුම ඉක්මනින්ම සපුරා ගත හැකි වීම
  - නිෂ්පාදිතයේ මිල මට්ටම් සාපේක්ෂව අඩුවීම
- සමාජීය වශයෙන් ලැබෙන වාසි
  - කුටුම්භයන්ගේ ජීවන තත්ත්වය ඉහළ යාම
  - නව භාණ්ඩ පරිහරණය කිරීමට අවස්ථා උදාවීම
  - විවිධ පාර්ශව සමග සම්බන්ධ වෙමින් වෙළෙඳ කටයුතු සම්බන්ධීකරණය කර ගත හැකි වීම

- විද්‍යුත් වෙළෙඳාමේ අවාසි පවතින බව.
    - අදාළ උපකරණ භාවිත කිරීමේ අපහසුතා පැවතීම
    - ව්‍යාප්තියේ ඇති සීමා
    - භාවිතයේ දී ආරක්ෂාව පිළිබඳ ගැටලු පැන නැගීම
- විද්‍යුත් වෙළෙඳාම විවිධ ආකාරයෙන් සිදුවන බව
    - ව්‍යාපාරයෙන් ව්‍යාපාරයට (B2B)

      අන්තජාලය ඔස්සේ ව්‍යාපාර හා ව්‍යාපාර අතර ගනුදෙනු සිදුවීම
    - ව්‍යාපාරයෙන්, ගණුදෙනුකරුට (B2C)

      අන්තර්ජාලය ඔස්සේ ව්‍යාපාරය විසින් ගනුදෙනුකරුට භාණ්ඩ විකිණීම සිදු කෙරේ.
    - ගණුදෙනුකරුවන්ගෙන් ගණුදෙනුකරුවන්ට (C2C)

      අන්තර්ජාලය ඔස්සේ පාරිභෝගිකයෙකු විසින් සෘජුවම වෙනත් පාරිභෝගිකයෙකුට භාණ්ඩ විකිණීම
    - රජයෙන් පුරවැසියන්ට (G2C)
- කාලීන වශයෙන් විද්‍යුත් වාණිජ්‍යය සම්බන්ධව සිදුවන වෙනස්කම් සාකච්ඡා කරන්න.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

## පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

ඉගෙනුම - ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදා ගතයුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදුවන) ඇගයීම් මූලධර්ම අනුව ඇගයීම සිදුවිය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දීය. මෙය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑම අවස්ථාවක දී සිදුවිය හැකි බව තේරුම් ගැනීම ගුරුවරයකුට අවශ්‍ය ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතුවෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් හෝ නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත්, ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීපව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කර ගැනීමට යොදාගත හැකි වැඩපිළිවෙළකි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියකට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටුකරන කාර්ය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල් පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහිදී ශිෂ්‍යයා නිරතුරුව ඇගයීමට ලක්විය යුතු අතර, ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදුවන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරුණු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුන්ට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කර ගෙන තිබේ දැයි තහවුරු කර ගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝපදේශකත්වය ලබා දිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හඳුන්වන්නේ ප්‍රති පෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ දුබලතා හා නොහැකියා අනාවරණය කරගත් විට ඔවුන්ගේ ඉගෙනුම් ගැටලු මගහරවා ගැනීමට ප්‍රතිපෝෂණයත් සිසු හැකියා සහ ප්‍රබලතා හඳුනා ගත් විට එම දක්ෂතා වැඩි දියුණු කිරීමට ඉදිරි පෝෂණයත් ලබා දීම ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්නුම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් කළ හැකි වූයේ දැයි හඳුනා ගැනීම සිසුන්ට අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩපිළිවෙළ ඔස්සේ සිසුන් ළගා කර ගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා දෙමව්පියන් ඇතුළු වෙනත් අදාළ පාර්ශවවලට සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමුවිය යුතු ය. මේ සඳහා යොදාගත හැකි හොඳම ක්‍රමය වන්නේ සන්තතිකව සිසුන් ඇගයීමට පාත්‍ර කිරීමට ඉඩ ප්‍රස්ථා සලසන පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමයයි.

යථෝක්ත අරමුණ සහිතව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්නුම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් වඩාත් කාර්යක්ෂම කිරීම පිණිස වඩා හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම යොදා ගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට සහ ගුරුවරුන්ට යොදා ගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ. එම ප්‍රභේද මෙසේය :

| | | | |
|---|---|---|---|
| 01. | පැවරුම් | 02. | ව්‍යාපෘති |
| 03. | සමීක්ෂණ | 04. | ගවේෂණ |
| 05. | නිරීක්ෂණ | 06. | ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම |
| 07. | ක්ෂේත්‍ර චාරිකා | 08. | කෙටි ලිඛිත පරීක්ෂණ |
| 09. | ව්‍යුහගත රචනා | 10. | විවෘත ග්‍රන්ථ පරීක්ෂණ |
| 11. | නිර්මාණාත්මක ක්‍රියාකාරකම් | 12. | ශ්‍රවණ පරීක්ෂණ |
| 13. | ප්‍රායෝගික ක්‍රියාකාරකම් | 14. | කථනය |
| 15. | ස්ව නිර්මාණ | 16. | කණ්ඩායම් ක්‍රියාකාරකම් |
| 17. | සංකල්ප සිතියම | 18. | ද්විත්ව සටහන් ජර්නල |
| 19. | බිත්ති පුවත්පත් | 20. | ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් |
| 21. | ප්‍රශ්න හා පිළිතුරු පොත් | 22. | විවාද |
| 23. | සාකච්ඡා මණ්ඩල | 24. | සම්මන්ත්‍රණ |
| 25. | ක්ෂණික කථා | 26. | භූමිකා රංගන |

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්නුම් සහ ඇගයීම් ක්‍රම සෑම එකක්ම සෑම විෂයයක් සම්බන්ධයෙන් සෑම විෂයය ඒකකයකට ම යොදා ගතයුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරා ගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතුය; වග බලා ගත යුතුය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල ගුරුවරුන්ට තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා යොදාගත හැකි ඉගෙනුම් - ඉගැන්නුම් හා ඇගයීම් ප්‍රභේද පිළිබඳ සඳහනක් තිබේ. ඒවා ගුරුවරුන් විසින් සුදුසු පරිදි තම පන්තියේ සිසුන්ගේ ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස යොදාගත යුතු වෙයි. ඒවා භාවිත නොකොට මග හැරීම සිසුන්ට තම ශාස්ත්‍රීය හැකියා මෙන්ම ආවේදනික ගති ලක්ෂණත් මනෝචාලක දක්ෂතාත් පිළිබඳ වර්ධනයක් ළගා කර ගැනීමත් ප්‍රදර්ශනය කිරීමත් පිළිබඳ අඩුපාඩු ඇති කරවයි.

## ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1) ඇගයීම් අවස්ථාව** : පළමුවන වාරය, සැලසුම 01

**(2) අවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6, 1.7

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- ව්‍යාපාර අර්ථ දැක්වීම
- ව්‍යාපාර විකාශනය
- ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායක හා ව්‍යාපාර වර්ග කිරිම
- ආර්ථිකයට ව්‍යාපාරවල දායකත්වය
- ව්‍යාපාර ක්‍රියාවලිය
- නිෂ්පාදිත වර්ගීකරණය
- ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්ව

**(4) සැලසුමේ ස්වභාවය** :
- ක්ෂණික කතා

**(5) සැලසුමේ අරමුණු** :
- කථන හැකියාව වැඩිදියුණු කර ගනියි.
- සබකෝළය අවම කර ගනියි.
- ව්‍යාපාර හා බැඳි සංකල්ප විග්‍රහ කරයි.
- ව්‍යාපාර වරගීකරණය කළ හැකි ආකාර ඉදිරිපත් කරයි.
- ව්‍යාපාර විකාශනය පෙළගස්වයි.
- ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්ව විග්‍රහ කරයි.

**(6) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස් :** :
- නිපුණතා මට්ටම 1.7 අවසානයේ දී වාචික ඇගයීමක් (කථනය) සිදු කරන බව, 1.1 නිපුණතා මට්ටම ආරම්භයේ දී ම සිසුනට දැනුම් දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- පහත සඳහන් මාතෘකා අතුරින් පන්තියේ සිටින සිසුන් සංඛ්‍යාවට සමාන මාතෘකා සංඛ්‍යාවක් එක් එක් නිපුණතා මට්ටම අවසන් කරන දිනයේ දී සියලු ම සිසුන්ට ලබා දෙන්න.

***නිදසුන්:***
- ව්‍යාපාර, අවශ්‍යතා හා වුවමනා, භාණ්ඩ හා සේවා

- වෙළෙඳපොළ, ව්‍යාපාර වර්ග කිරීමේ නිර්ණායක
- හිමිකාරත්වය අනුව ව්‍යාපාර වර්ග කිරීම, අරමුණ අනුව ව්‍යාපාර වර්ග කිරීම.
- යෙදවුම් හා නිමැවුම්, භාණ්ඩ වර්ගීකරණය
- සේවා වර්ගීකරණය
- සෘජු නිෂ්පාදන හා වක්‍ර නිෂ්පාදනය
- භාණ්ඩ හුවමාරු ක්‍රමය, මුදල්, ව්‍යාපාර සහාය සේවා
- විද්‍යුත් ව්‍යාපාර
- ව්‍යාපාර කටයුතුවල නූතන ප්‍රවණතා
- ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශ්ව
- වෙළෙඳාම
- වාණිජ්‍ය
- ඉල්ලුම
- නිෂ්පාදිත

(මාතෘකා ප්‍රමාණවත් නොවේ නම් නිපුණතාවට අදාළ ව වෙනත් මාතෘකා ඉදිරිපත් කරන්න.)

- පන්තියේ සිසුන් ගණනට ප්‍රමාණවත් මාතෘකා සංඛ්‍යාවක් පමණක් ලබා දෙන්න.
- සෑම මාතෘකාවක් පිළිබඳව ම මිනිත්තු දෙකක් කතා කිරීමට සූදානම් වන ලෙස සිසුනට දන්වන්න.
- කථන ඇගයීම සිදු කරන දිනය නිශ්චිත ව දන්වන්න.
- ඇගයීම් කරන දින එක් එක් සිසුවාට නිශ්චිත ව හිමි වන මාතෘකාව, ඔහු/ ඇය කතා කිරීමට විනාඩි (05) පහකට පෙර අහඹු ලෙස තෝරා ගැනීමට සලස්වන්න.
- සිසුවා කතා කරන අතරතුර නිර්ණායකවලට අනුව ලකුණු ලබා දෙන්න.

**සිසු උපදෙස්** :

- ගුරු උපදෙස් පිළිපදින්න.
- ගුරුතුමා ලබාදෙන සියලු ම මාතෘකා සඳහා සූදානම් වන්න. නමුත් කතා කිරීමට සිදු වන්නේ එක් මාතෘකාවක් පිළිබඳ ව පමණක් බව සලකන්න.
- ඇගයීම සිදුවන දිනයේ දී අහඹුව ලබාගත් මාතෘකාව පිළිබඳ ව මිනිත්තු දෙකක කතාවක් පන්තියට ඉදිරිපත් කරන්න.

**(7) ඇගයීම් නිර්ණායක** :

- මාතෘකවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම.
- නියමිත කාලය ප්‍රයෝජනයට ගැනීම.
- විෂය කරුණුවල ප්‍රමාණවත් බව.
- අවශ්‍ය අවස්ථාවල දි හඬ පාලනය හා අංග චලන ඉදිරිපත් කිරීම.
- කථනය ආරම්භයේ දි හා අවසානයේ දී පිළිපැදිය යුතු ආචාර ධර්ම හා පිළිවෙත් පිළිපැදීම.

**(8) ලකුණු පරාසය** :

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි. 01

## ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1) ඇගයීම් අවස්ථාව** : පළමුවන වාරය, සැලසුම 02

**(2) අවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 4.1, 4.2, 4.3, 4.4, 4.5, 4.6,

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- රජය ව්‍යාපාරවලට බලපෑම් කරන ආකාර
- ව්‍යාපාර සඳහා රජයේ දායකත්වය
- රජයක අරමුණු
- රජයේ පිස්කල් ප්‍රතිපත්ති
- රජයේ මූල්‍ය ප්‍රතිපත්ති
- පාරිභෝගික ආරක්ෂණය
- පාරිභෝගික ආරක්ෂණය සඳහා ක්‍රියාත්මක වන ආයතන

**(4) සැලසුමේ ස්වභාවය** :
- විවාදය

**(5) සැලසුමේ අරමුණු** :
- නිර්මාණශීලී ව හා තර්කානුකූල ව කරුණු ඉදිරිපත් කරයි.
- කථන හැකියාව වර්ධනය කර ගනියි.
- රජයක අරමුණු පෙළගස්වයි.
- රජයේ අරමුණු ඉටකර ගැනීමට ව්‍යාපාර දායක වන ආකාරය පෙන්වා දෙයි.
- රජය ව්‍යාපාරවලට බලපෑම් කරන ආකරය පැහැදිලි කරයි.
- රජය හා ව්‍යාපාර අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවේ වැදගත්කම පෙන්වා දෙයි.

**(6) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස් :** :
- නිපුණතා මට්ටම 4.6 අවසානයේ දී විවාදයකට සහභාගි විය යුතු බව, 4.1 නිපුණතා මට්ටම ආරම්භයේදී ම සිසුනට දන්වන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- 4.1 නිපුණතා මට්ටම ආරම්භයේදී ම පහත සඳහන් මාතෘකාව කණ්ඩායම් දෙකට ලබා දී විවාදයක් සඳහා සූදානම් වන ලෙස දන්වන්න.

  "ව්‍යාපාර සම්බන්ධයෙන් රජය මැදහත් විය යුතු ය. රජය මැදිහත් විය යුතු නැත."

- එක් එක් නිපුණතා මට්ටම අවසානයේ දී ඊට අදාළ විෂය කරුණු විවාදය සඳහා අදාළ කර ගත යුතු බවට උපදෙස් දෙන්න.
- නියම කරන ලද කාලච්ඡේද දෙකක දි විවාදය පැවැත්විය යුතු බවත්, ඇගයීම් නිර්ණායක පිළිබඳවත් සිසුන් දැනුවත් කරන්න.
- විවාදය පවත්වන අතරතුර දී අදාළ නිර්ණායක පදනම් කරගෙන සිසුන්ට ලකුණු පවරන්න.

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව ක්‍රියාකාරකමේ යෙදෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු මතෘකාවට අදාළ ව තොරතුරු රැස් කර ගන්න.
- කණ්ඩායම් නායකයා පත් කර ගැනීම,එක් එක් සාමාජිකයාට ලැබෙන කාලය, අවස්ථා ගණන ආදිය ගුරුතුමා සමඟ සාකච්ඡා කර තීරණය කර ගන්න.
- කණ්ඩායමේ  ජයග්‍රහණය සඳහා සාමූහික ව කටයුතු කරන්න.
- ලකුණු පිරිනමන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.

**(7)ඇගයීම් නිර්ණායක:**
- මාතෘකාවට අදාළ ව කරුණු ඉදිරිපත් කිරීම හා සංවිධානාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම.
- අදහස් නිර්මාණශීලී ව හා තර්කානුකූල ව ඉදිරිපත් කිරිම.
- උචිත ලෙස අංග චලනය හා කාලය කළමනාකරණය කිරීම.
- ප්‍රතිවිරුද්ධ පිලේ තර්ක බිඳීම.
- කණ්ඩායම තුළ සාමූහික ව කටයුතු කිරීම හා උද්යෝගිමත් ව කටයුතු කිරීම.

**8) ලකුණු පරාසය** :
- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි. 01

## ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1) ඇගයීම් අවස්ථාව** : දෙවන වාරය, සැලසුම 03

**(2) අවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 5.1, 5.2, 5.3, 5.4, 5.5, 5.6, 5.7, 5.8

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය
- පෞදගලික අංශයේ ව්‍යාපාර සංවිධානවල සුවිශේෂ ලක්ෂණ
- පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීම
- පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානවල වාසි හා අවාසි

**(4) සැලසුමේ ස්වභාවය** :
- ප්‍රහේලිකා නිර්මාණය

**(5) සැලසුමේ අරමුණු** :
- හිමිකාරත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග කරයි.
- විවිධ නිර්ණායක මත පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධානවල ලක්ෂණ පෙළගස්වයි.
- පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය විස්තර කරයි.
- නිශ්චිත පිළිතුරු ලබා ගත හැකි ප්‍රශ්න ගොඩනගයි.

**(6) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස් :** :
- නිපුණතා මට්ටම 5.8 අවසානයේ දී ප්‍රහේළිකාවක් නිර්මාණය කළ යුතු බව, නිපුණතා මට්ටම 5.1 ආරම්භයේදීම සිසුන්ට දන්වන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- කේවළ ස්වාමි ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සංස්ථාපිත සමාගම්, සමුපකාර ව්‍යාපාර යන මාතෘකා හතර සිසු කණ්ඩායම් අතර අහඹුව බෙදාදෙන්න.
- සෑම කණ්ඩායමක් ම තමාට ලැබුණ මාතෘකාවට අදාළව පහත සඳහන් කොන්දේසි යටතේ ප්‍රහේළිකාවක් නිර්මාණය කළ යුතු බව දන්වන්න.
  - පහළට පද 10ක් හා හරහට පද 10ක් තිබිය යුතු ය.

- අභිමත පරිදි කොටු දැල සකස් කර ගත හැකි ය.
- ප්‍රහේළිකා පද තම කණ්ඩායමට ලැබුණු මාතෘකාවට ඍජුව ම සම්බන්ධ විය යුතු ය.

- ප්‍රහේළිකාව ඉදිරිපත් කළ යුතු දිනට සතියකට පෙර සෑම කණ්ඩායමක ම ප්‍රහේළිකා පද හා ප්‍රහේළිකාව පරීක්ෂා කර බලන්න. අවශ්‍ය සංශෝධන සඳහා උපදෙස් දෙන්න.
- කලින් නියම කරගත් දිනයක දී (කාලච්ඡේද දෙකක දී) ප්‍රහේළිකාව සකස් කළ එක් එක් කණ්ඩායම ලවා එය ඉදිරිපත් කරවන්න.
- අනෙක් කණ්ඩායම් ලවා ප්‍රහේළිකාව සම්පූර්ණ කරවන්න. (තරගයක ස්වරූපයෙන් පවත්වන්න.)
- ඇගයීම් නිර්ණායක මත ප්‍රහේළිකාව ඉදිරිපත් කරන එක් එක් කණ්ඩායමට ලකුණු පවරන්න.

**සිසු උපදෙස්** :

- ගුරුවරයාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව ක්‍රියාකාරකමේ යෙදෙන්න.
- කණ්ඩායමේ සෑම සාමාජිකයෙක් ම අවම වශයෙන් එක් ප්‍රහේළිකා පදය බැගින් වත් නිර්මාණය කළ යුතු ය.
- ගුරුතුමා දන්වන දිනයක දී ඒවා ගුරුතුමාට පෙන්වා අවශ්‍ය වෙනස්කම් සිදු කරන්න.
- නිර්මාණාත්මක ව ප්‍රහේළිකාව නිර්මාණය කරන්න.

**(7) ඇගයීම් නිර්ණායක** :

- ප්‍රහේළිකාවේ පිළිතුරු පද මාතෘකාවට අදාළ වීම.
- අරමුණු ඉටුවන ආකාරයට ප්‍රහේළිකාව නිර්මාණය කර තිබීම.
- ගුරු උපදෙස් පිළිපැදීම හා නියමිත කාලය තුළ කාර්යය ඉටු කිරීම.
- නියමිත පද සංඛ්‍යාව ඇතුළත්වීම.
- නිර්මාණශීලී බව

**(8) ලකුණු පරාසය** :

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි. 01

**ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්**

**(1) ඇගයීම් අවස්ථාව** : දෙවන වාරය, සැලසුම 04

**(2) ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 6.1, 6.2, 6.3, 6.4, 6.5, 6.6

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- ව්‍යවසායකත්වය අර්ථ දැක්වීම, වැදගත්කම හා ප්‍රතිලාභ
- ආර්ථික සංවර්ධනය හා ව්‍යවසායකත්වය අතර සම්බන්ධතාව
- ව්‍යවසායකයා හා ව්‍යවසායකයාගේ පසුබිම
- ව්‍යවාසයකත්ව නිපුණතා හා නිපුණතා වර්ධනය කර ගැනීමේ මාර්ග
- කුඩා ව්‍යාපාරවල ලක්ෂණ හා ඒවා ශ්‍රී ලංකාවට වැදගත්වීමට හේතු
- කුඩා ව්‍යාපාර සඳහා ආධාර දෙන ව්‍යාපෘති

**(4) සැලසුමේ ස්වභාවය** :
- ගවේෂණය

**(5) සැලසුමේ අරමුණු** :
- සපයන ලද ශීර්ෂ යටතේ තොරතුරු රැස් කරිමට උචිත ප්‍රශ්නාවලියක් සකස් කරයි.
- ගවේෂණය තුළින් තොරතුරු රැස් කරයි.
- රැස් කරන ලද තොරතුරු ආශ්‍රයෙන් වර්තා නිර්මාණය කරයි.
- ව්‍යවසායකත්වය අර්ථ දක්වයි.
- ව්‍යවසායකත්වයේ වැදගත්කම හා එහි ප්‍රතිලාභ විමසයි.
- ව්‍යවසායකත්ව නිපුණතා පිළිබඳ ව තොරතුරු රැස් කරයි.
- ව්‍යවසායකත්ව නිපුණතා වර්ධනය කර ගත හැකි ආකාර පෙන්වා දෙයි.

**(6) සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස්:**
- නිපුණතා මට්ටම 6.6 අවසානයේ දී ව්‍යවසායකයෙකු පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව, 6.1 නිපුණතා මට්ටම ආරම්භයේදී ම සිසුනට දැනුම් දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.

- තම ප්‍රදේශයේ සිටින ව්‍යවසායකයෙකු මුණගැසී ඔහුගෙන් පහත සඳහන් තොරතුරු රැස්කර ගැනීමට හැකිවන ආකාරයේ ප්‍රශ්නාවලියක් සකස් කිරීමට උපදෙස් දෙන්න.
  - ව්‍යාපාර කටයුතුවල ස්වභාවය
  - ඔහුගේ පවුල් පසුබිම
  - ව්‍යවසාය තෝරා ගැනීමට හේතු
  - ආරම්භ කළ ආකාරය
  - ආරම්භක ප්‍රාග්ධනය
  - සහයෝගය ලැබුණු පාර්ශ්ව
  - ආරම්භයේ ව්‍යාපාරයේ ස්වභාවය
  - මුහුණදීමට සිදුවූ අභියෝග
  - වර්තමාන තත්ත්වය
  - වර්තමාන ප්‍රාග්ධනය
  - ණය ලබා ගෙන තිබේ ද? (එසේ නම් ලබා ගත් ආකාරය)
  - ව්‍යාපාරයේ ස්වභාවය
  - සහයෝගය දෙන පාර්ශ්ව
  - සමාජ පිළිගැනීම
  - අනාගත අපේක්ෂණ
- ශිෂ්‍යයා විසින් සකස් කරන ලද ප්‍රශ්නාවලිය කලින් නියම කරගත් දිනක දී පරීක්ෂා කර බලා අවශ්‍ය සංශෝධන සඳහා උපදෙස් දෙන්න.
- පාසල් කාලයෙන් බැහැරව තෝරාගත් ව්‍යවසායකයා සමඟ සාකච්ඡා කර තොරතුරු රැස් කර ගන්නා ලෙස දන්වන්න.
- රැස් කරගත් තොරතුරු උපයෝගී කරගෙන කලින් තීරණය කරන ලද කාලපරිච්ඡේද දෙකක් (02) තුළ වාර්තාව පිළියෙල කරවන්න.
- ඒ සඳහා සුදුසු මාතෘකාවක් යෙදිය යුතු බවත් දන්වන්න.
- අදාළ නිර්ණායක මත ලකුණු ලබා දෙන්න. .

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත කටයුතු කරන්න.
- සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම සඳහා ප්‍රදේශයේ සිටින ව්‍යවසායකයෙකු තෝරා ගන්න.
- ඔහුගෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට හැකිවන ආකාරයේ ප්‍රශ්නාවලියක් ගුරුතුමාගේ මගපෙන්වීම හා උපදෙස් මත පිළියෙල කරන්න.

- කලින් තීරණය කරගත් දිනක දි ව්‍යවසායකයා මුණගැසී අදාළ තොරතුරු රැස්කර ගන්න.
- රැස් කර ගන්නා ලද තොරතුරු ඇසුරින් වාර්තාවක් ලිවීමට සූදානම් වන්න.
- ගුරුතුමා විසින් නියම කරන ලද දිනයේ දී ව්‍යවසායකයා පිළිබඳ වාර්තාව ලියා භාර දෙන්න.
- ප්‍රශ්නාවලිය සකස් කිරීමත්, තොරතුරු රැස් කිරීමත්, වාර්තාව පිළියෙල කිරිමත් තනි තනිව ම කළ යුතු බව සලකන්න.

**(7) ඇගයීම් නිර්ණායක** :

- අරමුණුවලට ගැළපෙන ආකාරයට ප්‍රශ්නාවලිය සකස් කිරීම.
- දත්ත රැස් කිරීම හා ඒවායේ අදාළත්වය
- ස්වාධීන ව කටයුතු කිරීම
- නියමිත කාලය තුළ නිම කිරීම
- නිර්මාණශීලී වාර්තාවක් සකස් කිරීම.

**(8) ලකුණු පරාසය** :

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි. 01

## ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1) ඇගයීම් අවස්ථාව** : තෙවන වාරය, සැලසුම 05

**(2) අවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 7.1, 7.2, 7.3, 7.4,7.5, 7.6, 7.7

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :

- මුදල් හැඳින්වීම, විකාශනය හා මුදල් වර්ග
- ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය.
- වාණිජ බැංකු තැන්පතු වර්ග
- වාණිජ බැංකුවල අනෙකුත් සේවා
- චෙක්පත්, විද්‍යුත් මුදල්
- ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුණු හා කාර්ය භාරය

**(4) සැලසුමේ ස්වභාවය** :

- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන

**(5) සැලසුමේ අරමුණු** :

- නිශ්චිත පිළිතුරු සහිත ප්‍රශ්න නිර්මාණය කරයි.
- මුදල් හා මූල්‍ය ආයතනවලට අදාළ ව කාලීන ප්‍රශ්න සකස් කරයි.
- නව දැනුම එකතු කරයි.
- කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කරයි.

**(6) සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස්** :

- නිපුණතා මට්ටම 7.7 අවසානයේ දී ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පවත්වන බව, නිපුණතා මට්ටම 7.1 ආරම්භයේ දී ම සිසුන්ට දැනුම් දෙන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- එක් එක් නිපුණතා මට්ටම අවසානයේ දී අදාළ විෂය කරුණු ඇතුළත් වනසේ ප්‍රශ්න නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- වරින් වර සිසුන් ලියන ලද ප්‍රශ්න හා පිළිතුරු පරීක්ෂා කර බලා අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන සඳහා නිශ්චිත පිළිතුරු සහිත ප්‍රශ්න 20 බැගින් කණ්ඩායම් දෙකම පිළියෙල කර තිබිය යුතු බව දන්වන්න.

- සමාන ප්‍රශ්න කණ්ඩායම දෙක මගින් ම ඉදිරිපත් කිරීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්න. මේ සඳහා සෑම කණ්ඩායමක් ම ප්‍රශ්න 20ට වඩා සකස් කළ යුතු බව දන්වන්න.
- කණ්ඩායමේ සෑම සාමාජිකයෙක්ම අවම වශයෙන් එක් ප්‍රශ්නයක්වත් පිළියෙල කළ යුතු බව දන්වන්න.
- බැංකු වාර්තාව ආදී අදාළ මූලාශ්‍ර පරිශීලනය කර අදාළ විෂය කරුණු මැනෙන ආකාරයේ ප්‍රශ්න සැකසීමට සිසුන් යොමු කරන්න.
- කලින් තීරණය කරන ලද නිශ්චිත දිනයක දි (කාලච්ඡේද දෙකක දි) ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන කණ්ඩායම් දෙක සහභාගිත්වයෙන් පවත්වන්න.
- නිවැරදි පිළිතුරු සඳහා උචිත පරිදි ලකුණු පිරිනැමීමටත් ඒවා සටහන් කිරීමටත් සිසුන් මෙහෙයවන්න.
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන පැවැත්නෙ අතරතුර නිර්ණායකවලට අනුකූලව සිසුන්ට ලකුණු ලබා දෙන්න.

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මගපෙන්වීම මත කටයුතු කරන්න.
- සකස් කරන ලද ප්‍රශ්න හා පිළිතුරු වරින් වර ගුරුතුමාට පෙන්වා නිවැරදි කර ගන්න.
- එක් එක් නිපුණතා මට්ටම අවසානයේ දී අදාළ විෂය කරුණු අතුළත් ප්‍රශ්න හැකිතාක් සකස් කරන්න.
- ඒවාට අදාළ නිශ්චිත පිළිතුරු පිළිබඳ ව කණ්ඩායමේ සෑම සාමාජිකයෙකුම දැනුවත් කරන්න.
- තම කණ්ඩායමේ ජයග්‍රහණය තහවුරු කර ගැනීමටත්, වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගැනීමටත් උනන්දු වන්න.

**(7) ඇගයීම් නිර්ණායක** :
- විෂය කරුණුවලට අදාළ නිවැරදි ප්‍රශ්න සකස් කර තිබීම.
- ප්‍රශ්න සඳහා නිශ්චිත පිළිතුරු ලියා තිබීම.
- නියමිත දිනයට අදාළ කාර්ය නිම කර තිබීම.
- ගුරු උපදෙස් පිළිපැදීම හා සහභාගිත්වය
- කණ්ඩායමක් ලෙස සහයෝගයෙන් කටයුතු කිරීම

**(8) ලකුණු පරාසය** :
- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි. 01

## ඉගෙනුම්- ඉගැන්වීම් ඇගයීම් සැලසුම්

**(1) ඇගයීම් අවස්ථාව** : තෙවන වාරය, සැලසුම 06

**(2) අවරණය කෙරෙන නිපුණතා මට්ටම්** : 11.6

**(3) සැලසුමට අදාළ විෂය සන්ධාරය** :
- වෙළෙඳ කලාප හා ජාත්‍යන්තර සංවිධාන
- කාලීන ව ඇති වන වෙළෙඳ ගිවිසුම් හා සංවිධාන
- වෙළෙඳ ගිවිසුම් වෙළෙඳාමට කරන බලපෑම
- විදේශ වෙළෙඳාමේ නව ප්‍රවණතා

**(4) සැලසුමේ ස්වභාවය** :
- කේවල පැවරුම

**(5) සැලසුමේ අරමුණු** :
- වෙළෙඳ කලාප නම් කර ඒ එක් එක් කලාපවලට අයත් රටවල් ලැයිස්තුගත කරන්න.
- වෙළෙඳ සංවිධානවල අරමුණු හා කාර්යභාරය විස්තර කරයි.
- වෙළෙඳ ගිවිසුම් විදේශීය වෙළෙඳාමට කරන බලපෑම සොයා බලයි.
- විදේශ වෙළෙඳාමේ නව ප්‍රවණතා විස්තර කරයි.

**(6) සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ගුරු උපදෙස් :** :
- නිපුණතා මට්ටම 11.6 අවසානයේ දී කේවල පැවරුමක් සකස් කළ යුතු බව, නිපුණතා මට්ටම 11.1 ආරම්භයේදීම සිසුන්ට දන්වන්න.
- ඇගයීම් නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- පහත සඳහන් තොරතුරු ඇතුළත් කර පොත් පිංචක් පිළියෙල කළ යුතු බව සිසුන්ට දන්වන්න.
  - වෙළෙඳ කලාප හා ජාත්‍යන්තර සංවිධාන
  - ඒවාට අයත් වන රටවල්
  - එහි කාර්ය භාරය
  - කාලීනව ඇතිවන සංවිධාන හා ගිවිසුම්
  - වෙළෙඳ ගිවිසුම් විදේශීය වෙළෙඳාමට කරන බලපෑම්
  - විදේශීය වෙළෙඳාමේ නව ප්‍රවණතා
- නිර්මාණාත්මක ව ඉදිරිපත් කිරීම පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව දන්වන්න.
- මෙසේ සකස් කළ පොත් පිංච අවසන් කර භාරදිය යුතු අවසාන දිනය, ආරම්භයේදී ම දැනුම් දෙන්න.

**සිසු උපදෙස්** :
- ගුරුවරයාගේ උපදෙස් හා මගපෙන්වීම අනුව ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.
- ඔබේ නිර්මාණශීලීත්වය මතුවන ආකාරයට පැවරුම සකස් කරන්න.
- අවශ්‍ය තොරතුරු සියල්ල ඇතුළත් කිරීමට උනන්දු වන්න.
- ගුරුවරයා නියම කරන කාලය තුළ නිමැවුම භාර දෙන්න.

**(7) ඇගයීම් නිර්ණායක :**
- ප්‍රමාණවත් විෂය කරුණු අන්තර්ගත වීම
- දත්ත/තොරතුරු රැස් කිරීම සඳහා ගත් ක්‍රියාමාර්ගවල උචිත බව.
- සකස් කරන ලද පැවරුමෙහි නිර්මාණශීලීත්වය හා නිමාව
- ගුරු උපදෙස් පිළිපැදීම
- නියමිත දිනට භාරදීම

**(8) ලකුණු පරාසය :**
- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- **සංවර්ධනය විය යුතුයි. 01**

**මූලාශ්‍ර :**


(1) බණ්ඩාරනායක, ජගත් - උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය සංශෝධිත නව සංස්කරණය - 2009

(2) විජේසූරිය ඒ.බී. 2005, උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය

(3) ශ්‍රී ලංකා මහ බැංකුව - වාර්ෂික වාර්තාව - 2008

(4) සටහන - ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ හා ආර්ථික විද්‍යා මාසිකය - ශ්‍රී ලංකා මහ බැංකුව

(5) Griffin, R.W. -2000. Management, 5th Edition. AITBS Publishers-INDIA.

(6) Hall, D., Jones,R.,Raffo,C.,Chambers,I. and Gray,D.-2001,Business Studies, Causeway Press Limited.

(7) Nuttall, C.J,-2004, Business Studies Cambridge University Press.

(8) Rayport, J.F. and Jaworski, B.J. - 2002, e-Commerce,Tata McGraw - Hill Edition.